
www.fcms.kln.ac.lk

මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# මූල්‍ය විමසුම 2022

සිප්වරණ
ප්‍රශ්නෝත්තර
තරඟාවලිය

FINANCE REVIEW



## සරසවියට අත්වැල

විභාගය ඉලක්ක කොටගත් සිද්ධාන්ත
හා ප්‍රායෝගික භාවිත සුසංයෝගය

- ව්‍යවසායකත්වය යනු කුමක්ද?
- ප්‍රාග්ධන ආයෝජන තීරණ ගන්නේ කෙසේද?
- නිමැවුමක නොපෙනෙන පිරිවැය තීරකයා

# මූල්‍ය විමසුම

කැලණිය විශ්වවිද්‍යාලයීය වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ, මූල්‍ය අධ්‍යයන අංශය නියෝජනය කරමින් මූල්‍ය ශිෂ්‍ය සංගමය විසින්, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය නිමිත්තෙන් සිදු කරනු ලබන "ශිල්ප" සම්මන්ත්‍රණ වැඩමුළුව උදෙසා ඉදිරිපත් කරනු ලබන, සාඩම්බර ඉදිරිපත් කිරීමකි.

අප විශ්වවිද්‍යාලයීය කථිකාචාර්යවරුන්ගේ සහ විද්‍යාර්ථයින්ගේ, ආරාධිත ලේඛකයන්ගේ, ලිපි මඟින් මෙම සඟරාව සමන්විත වන අතර උසස් පෙළ කඩයිම සාර්ථක ලෙස ජය ගැනීමට මෙය මහගු පිටිවහලක් වනු ඇතැයි අප සිතන්නෙමු. උසස් පෙළ වාණිජ විෂය ධාරාව නිමිති කර ගනිමින් වාණිජ විෂය නිර්දේශය මත පදනම් වෙමින් සකස් කර ඇති "මූල්‍ය විමසුම" සඟරාව නොකඩවා වසරක් පාසා ඉදිරිපත් කිරීමට අප සැලසුම් කර ඇත්තෙමු. මෙම සඟරාවේ ඉදිරි කලාපයන් සඳහා, ලිපි ඉදිරිපත් කරමින් දිගින් දිගටම අප සමඟින් එක්ව සිටීමට, කථිකාචාර්යවරුන්හට සහ සෙසු සියලු දෙනාට සුහදව ඇරයුම් කර සිටින අතර මෙවර කලාපය සඳහා ලිපි සැපයීම වෙනුවෙන් ස්තූති කර සිටින්නෙමු.

මෙම සඟරාවේ පළ කරනු ලබන ලිපි සම්බන්ධව සංස්කාරකවරුන් සහ මූල්‍ය අධ්‍යයන අංශය කිසිදු වගකීමක් නොදරන අතර සියලු වගකීම් ඒ ඒ ලේඛකයන් සතු වේ.


## ප්‍රධාන සංස්කාරක

එස්.ටී.එම්.එස්. තෙන්නකෝන්

## සංස්කාරක මණ්ඩලය

එච්.ජේ.ආර්. බුද්ධික
එස්.ඩී.පී. පියනන්ද
ඩබ්ලිව්.ඩී.ජේ.ඩී. වීරසිංහ
එච්.එම්.ඒ.එල්. ගුණසේකර
ඩබ්ලිව්.පී.අයි.ඩී. ප්‍රේමරත්න
එච්.එල්.ඩී.ජේ. චතුරිකා
ඩී.එම්.යු.එච්. දිසානායක
එස්.එල්. සුදසිංහ
ආර්.පී.එස්. ද සොයිසා

## අධීක්ෂණය

මහාචාර්ය ආර්. අබේසේකර

විමසීම් : 011-2903553
සංස්කරණය : 2022 සැප්තැම්බර්

# පටුන


01) අංශාධිපතිතුමාගේ පණිවිඩය 01

02) මූල්‍ය ශිෂ්‍ය සංගමයේ පණිවිඩය 02

03) සංස්කාරකතුමියගේ පණිවිඩය 03

04) ව්‍යාපාර අධ්‍යයනය; සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න 04

05) පාසල් යන වයසේ දරුවන් අර්ධ කාලීන රැකියාවලට යොමු කිරීම "දැලි පිහියෙන් කිරි කනවා වගේ" වැඩක් 12

06) උසස් පෙළට සාර්ථකව මුහුණ දීමට නම් 15

07) මූල්‍ය සාක්ෂරතාවය තුළින් යහපත් හෙටක් බිහි කරගමු 18

08) විදේශ වෙළඳාමට පදනම් වන නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි න්‍යායන්හි මූලික කරුණු ආවර්ජනය කරමු 22

09) ඔබ සිද්ධි අධ්‍යයනය ගැටලු සඳහා නිවැරදිව මුහුණ දිය යුත්තේ කෙසේද? 28

10) බහුවරණ ප්‍රශ්න පත්‍රයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද? 31

11) හීන පාට කරමු 34

12) මුදල් ප්‍රවාහ නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරමු 37

13) දැනුවත් වෙමු; ආරක්ෂා වෙමු 41

14) නිමැවුමක නොපෙනෙන පිරිවැය තීරකයා 46

15) ආර්ථික විද්‍යාව සහ ගිණුම්කරණය 49

16) ඩොලරය ඇයි මෙච්චරම ගණන්? 51

17) වෙළඳපොළ අසමත්වීම් හා රජයේ කාර්යභාරය 54

18) මුදල්, මුදල් වර්ග සහ ණයපත් පිළිබඳව ඔබ දන්නවාද? 56

19) ව්‍යවසායකත්වය, ව්‍යවසායකයා හා එහි වැදගත්කම 59

20) නිවැරදි ප්‍රාග්ධන ආයෝජන තීරණයකට යොමුවෙමු 62

21) ව්‍යාපාර තොරතුරු පද්ධති 67

24) අනුග්‍රාහක භවතුන්ගේ පණිවිඩ 71

25) සංවිධායක කමිටුව 74

# අංශාධිපතිතුමාගේ පණිවිඩය



අප රට දැනට මුහුණ පා සිටින ආර්ථික හා සමාජීය ව්‍යවසනයන් හමුවේ උසස් පෙළ වාණිජ විෂයන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු ලබාගැනීමට ඇති අභියෝග ජයගැනීමට අවශ්‍ය දැනුම මෙන්ම ආත්මීය ශක්තිය ලබාදීම මෙම "මූල්‍ය විමසුම" සඟරාවේ අරමුණ වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධ්‍යයන අංශයේ කථිකාචාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථයින්ගේ සහයෝගීත්වයෙන් මෙම වාර්ෂික සඟරාව එළිදක්වන්නේ ඉහත කී උදාර පරමාර්ථය පෙරදැරි කොටගෙනය.

මෙම මූල්‍ය ලිපි ඇතුලත් සඟරාව විශේෂයෙන්ම ව්‍යාපාර ලෝකයටත්, එමෙන්ම මූල්‍ය පරිපාලන ක්ෂේත්‍රයටත් පිවිසීමට සැරසෙන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම, විශ්ලේෂණ කුසලතා, නිවැරදි තීරණ ගැනීමේ කුසලතා සහ තාර්කික චින්තනය මෙන්ම කාලීන අභියෝගවලට මුහුණ දීමේ හැකියාව වර්ධනයටද මහඟු පිටිවහලක් වන බව මගේ විශ්වාසයි.

අ.පො.ස. උසස් පෙළ වාණිජ විෂය හදාරන ශිෂ්‍ය ප්‍රජාව ඉලක්ක කොට සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව එළිදක්වනු ලබන "මූල්‍ය විමසුම" සඟරාව විෂය දැනුම මෙන්ම වෙළඳ ලොව පිළිබඳ අපමණ වූ දැනුමක් ලබාගැනීමට මහඟු අත්වැලක් වනු ඇත.

මහාචාර්ය ආර්. අබේසේකර
අංශ ප්‍රධාන
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# මූල්‍ය ශිෂ්‍ය සංගමයේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය අධ්‍යයන අංශය නියෝජනය කරමින් මූල්‍ය ශිෂ්‍ය සංගමය විසින් සාඩම්බරයෙන් ඉදිරිපත් කරනු ලබන “ශිල්ප 2022” අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව ඉදිරිපත් කරන “මූල්‍ය විමසුම” සඟරාවේ නමවන වෙළුම මෙලෙස එළිදක්වන්නෙමු.

සරසවි වරම් හිමි කරගනිමින් ජීවිතයේ තවත් එක් සුවිශේෂ වූ කඩයිමක් ජයගැනීමට අපේක්ෂාවෙන් සිටින සිසුසිසුවියන්, දැනුමෙන් සුපෝෂණය කිරීම සහ ඔවුන්ට අත්වැලක් සැපයීමේ උතුම් අරමුණ පෙරදැරි කරගෙන එළිදක්වන ලද මෙම සඟරාව පිටිවහලක්ම වේවායි ඉතසිතින් පතන්නෙමූ.

අප විශ්වවිද්‍යාලයීය කථිකාචාර්යවරුන්ගේ සහ විද්‍යාර්ථයින්ගේ දැනුම ඒකරාශි කරගනිමින් සකස් කර ඇති ලිපි වලින් සමන්විත වූ මෙම සඟරාව යථාර්තයක් කරගැනීම සඳහා නන් අයුරින් සහය දුන් ඔබ සැමට ස්තූතිවන්ත වන අතර මෙම ප්‍රයත්නයේ නිසි ඵල ලබාගනු ඇතැයි අප අපේක්ෂා කරන්නෙමු.

සරසවි සිහිනය සිහිනයක් නොව සැබෑවක් කරගැනීමට ඔබ සැමට ඉතසිතින් සුභ ප්‍රාර්ථනා කරන්නෙමු.

මූල්‍ය ශිෂ්‍ය සංගමය
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# සංස්කාරකතුමියගේ පණිවිඩය



මෑත අතීතයේ සහ වර්තමානයේ උසස් පෙළ වාණිජ විෂය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම විෂයානුබද්ධ අධ්‍යාපනය සහ දැනුම ඵලදායී ලෙස අර්ථගැන්වීමට ඇති අතිමහත්වූ අභියෝග ජයගැනීමට උපකාරීවන "මූල්‍ය විමසුම" වාර්ෂික සඟරාව මෙවරත් ඉමහත් ගෞරවයෙන් එළිදක්වන්නෙමු.

වර්තමාන දේශීය මෙන්ම ගෝලීය අර්බුදකාරී ආර්ථික පසුබිම හමුවේ, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය විෂයන් සුවිශේෂී වන බැවින් "මූල්‍ය විමසුම" සඟරාව අත්‍යන්තයෙන්ම කාලීන අවශ්‍යතාවක් බව මූල්‍ය අධ්‍යයන අංශයේ විද්වතුන්ගේ වැටහීමයි. උසස් පෙළ විෂය නිර්දේශය ආවරණය කරමින් ප්‍රකාශයට පත්වන මෙම "මූල්‍ය විමසුම" සඟරාව මූල්‍ය අධ්‍යයන අංශයේ කථිකාචාර්ය මණ්ඩලය මෙන්ම විද්‍යාර්ථයින්ගේද සාර්ථක වෑයමකි. මෙම අර්ථවත් ප්‍රයත්නය සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් සැමට අපගේ ගෞරවනීය ස්තුතිය පළ කරමු.


සුභානි තෙන්නකෝන් මිය
කථිකාචාර්ය (සහකාර)
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# ව්‍යාපාර අධ්‍යයනය
# සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න

කොරෝනා - 19 වසංගත තත්ත්වය හා දැනට රටේ පවතින ආර්ථික අභියෝග හමුවේ, 2022 අ.පො.ස. උසස් පෙළ විභාගයට මුහුණ දීමට සිටින ඔබ සැම අභියෝග රැසකට මුහුණදුන් දරුදැරියන් පිරිසකි. එහිදී ඔබට විවිධ ක්‍රම ඔස්සේ තම අධ්‍යාපන කටයුතු සඳහා යොමු වීමට සිදුවූ අතර සහ පවතින තත්වය හමුවේ විවිධ අභියෝග වලට මුහුණ පාමින්, තම කැප වීම තුලින්ම තම සාර්තකත්වය කරා යන ගමනක නිරත වීමට සිදුව ඇත.

ව්‍යාපාර අධ්‍යයනය විෂය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයක් වන අතර උසස් පෙළ කඩඉම් විභාගයේ ව්‍යාපාර අධ්‍යයන විෂයයට පෙනී සිටින දරුවන්ට අත්වැලක් සැපයීම මෙම ලිපියේ අරමුණ වේ.

පහත රූපසටහන තුලින් ව්‍යාපාර අධ්‍යයනය විෂය සඳහා 2019, 2020, 2021 වසර වලදී සිසුන් ලබාගත් ප්‍රතිඵල විහිදී ගිය ආකාරය නිරූපනය කෙරේ (විභාග දෙපාර්තමේන්තුවේ තොරතුරු ඇසුරෙන් නිර්මනය කරන ලදි).




ජීවිතයේ හැරවුම් ලක්ෂයක් වන උසස් පෙළ කඩඉම් විභාගය යනු වසර දෙකකට වැඩිකාලයක් උගත් සිද්ධාන්ත දැනුම හා එහි ප්‍රායෝගික භාවිතය ඉතා කෙටි කාලයක් තුල එනම් පැය 3ක ප්‍රශ්න පත්‍රයකින් ඔබේ දැනුම,කුසලතා හා ආකල්ප තක්සේරු කරන මිනුම් දණ්ඩකි. පසුගිය වසර වල ප්‍රතිඵල විශ්ලේෂණය තුල පෙනී යන කරුණ වන්නේ 14% ක සිසුන් ව්‍යාපාර අධ්‍යයනය විෂය සඳහා සාමර්ථ ලබාගත් අතර 27% ක් ව්‍යාපාර අධ්‍යයනය විෂය අසමත්ව ඇති බවයි. මෙයට විවිධ වූ කරුණු බලපානු ලබයි. වසර දෙකකට වැඩි කාලයක් අප විභාගයට සූදානම්වීම සඳහා කරනු ලබන කැපකිරීම සහ විභාගයේදි මනාව අපේ දැනුම,කුසලතා හා ආකල්ප හැසිරවීම මත අපේ ප්‍රතිඵල රදා පවතින බව මෙයින් පැහැදිලි වේ. ඒ අනුව පෙනීයන්නේ වසර දෙකක් පුරා අප කළ කැපවීමේ ප්‍රතිඵලය විවිධ ශ්‍රේණි ඔස්සේ අපට ලබාගත හැකි බවත්,නිරන්තරයෙන්ම අපේ කැපවීමේ ප්‍රතිඵල ඒ තුලින් විදහාපාන බවත්ය.

ඒ අනුව, ව්‍යාපාර අධ්‍යයන ප්‍රශ්න පත්‍රය තුළින් ඔබගේ හැකියාව හා අවබෝධය විවිධ කෝණයන් ඔස්සේ මැන බලන බව ඔබ අවබෝධ කරගත යුතු අතර ප්‍රශ්න සැකසී ඇති ආකාරය පිළිබඳ ඔබ හොඳින් අවබෝධ කරගැනීම සාර්ථකව පිළිතුරු සැපයීමට මගපෙන්වීමක් වෙයි. උසස් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළිතුරු ලිවීමේ හැකියාවන්හි ප්‍රමාණාත්මක බව තක්සේරුකරණය ඔබ විසින්ම කිරීම අත්‍යාවශ්‍ය වේ.

ව්‍යාපාර අධ්‍යයන ප්‍රශ්න පත්‍රය තුල සිද්ධි අධ්‍යයන පදනම් කරගත් ප්‍රශ්න අන්තර්ගත වන අතර කිසියම් තොරතුරක් අර්ථකථනය කිරීමේ, තේරුම් ගැනීමේ, පැහැදිලි කිරීමේ හා පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී ඔබේ නිර්මාණශීලී හැකියාව පිළිබඳ තක්සේරු වන ආකාරයේ ප්‍රශ්න සිද්ධි අධ්‍යයනය තුල ඔබට දැකිය හැක. විශේෂයෙන් සිද්ධියක් තුළින් ප්‍රායෝගික දැනුම ඔබ උගත් මූලධර්ම සිද්ධාන්ත වෙනත් සමාන අවස්ථාවකට යොදා ගැනීමේ හැකියාව සැසඳීම, විශ්ලේෂණාත්මක බව තක්සේරු කරනු ලබයි.

පහත ප්‍රශ්නවලට ඔබ ලබාදෙන පිළිතුර කුමක්ද යන්න මත ඔබගේ සිද්ධි අධ්‍යයනයන් සඳහා පිළිතුරු සැපයීමේ හැකියාව ඔබටම තක්සේරු කරගත හැක.

• මගේ ව්‍යාපාර අධ්‍යයන න්‍යායාත්මක දැනුම භාවිත කරමින් සිද්ධි අධ්‍යයන උපයෝගී කරගනිමින් ප්‍රශ්ණ විශ්ලේෂණාත්මකව විග්‍රහ කර පිළිතුරු ලිවීමේ හැකියාව කෙසේද? ඒ පිළිබඳ මා හට ස්වයං තක්සේරුවක් තිබේද?

• මම කොතරම් සිද්ධි අධ්‍යයනය ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ලබා එම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇත්ද?

පසුගිය විභාග වල සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න තවදුරටත් විග්‍රහය තුළින් අපට මෙය තවදුරටත් තහවුරු කරගත හැක.

**සිද්ධි අධ්‍යයනය 1**

සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ශූන්‍ය විමෝචන (zero emission) මෝටර් රථ එකලස් කර ශ්‍රී ලංකාව තුළ අලෙවි කරයි. සමාගම තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන නමුත් එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. මීට අමතරවල සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා අලවියෙන් පසු සේවාවන් ද සපයනු ලැබේ. තවද සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආදායම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට දායක වේ.

පියවර **1**- සිද්ධිය හොඳින් කියවා වැදගත් වචන යටින් ඉරක් අඳින්න

<u>සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ශූන්‍ය විමෝචන</u> (zero emission) <u>මෝටර් රථ එකලස් කර</u> ශ්‍රී ලංකාව තුළ <u>අලෙවි කරයි</u>. සමාගම තුළ <u>විශාල සේවක සංඛ්‍යාවක්</u> සේවය කරන නමුත් <u>එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි</u>. මීට අමතරවල සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා <u>අලවියෙන් පසු සේවාවන්</u> ද සපයනු ලැබේ. තවද සමාගම මෙම වසරේ දී <u>වාහන අමතර කොටස් නිෂ්පාදනය</u> ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව <u>රජයට විශාල ආදායම් බදු මුදලක්</u> ගෙවන අතර <u>ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට</u> දායක වේ.

පාරිභෝගිකයින් සඳහා අලෙවියෙන් පසු සේවාවන් ද සපයනු ලැබේ. තවද සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආදායම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට දායක වේ.

පියවර 2 - දැන් අප සිද්ධියට අදාළ ප්‍රශ්න දෙසට අවධානය යොමු කරමු.
ප්‍රශ්නය හොඳින් කියවා වැදගත් වචන යටින් ඉරක් අඳින්න

| | | |
|---|---|---|
| **ප්‍රශ්නය:** සමාගම විසින් පාරිභෝගිකයින් වෙත සපයන නිෂ්පාදිත දෙක නම් කර ඒවාට උදාහරණ දක්වන්න.<br>නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා ලෙස වර්ග කළ හැකිය. නිෂ්පාදිත දෙක නම් කිරීම සහ උදාහරණ සැපයීම ඉතා වැදගත්වේ.උදාහරණ සිද්ධිය ඇසුරෙන් හඳුනාගත යුතුය. | නිෂ්පාදිත | උදාහරණ |
| සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ගුහ්‍ය විමෝචන (zero emission) මෝටර් රථ එකලස් කර ශ්‍රී ලංකාව තුළ අලෙවි කරයි. සමාගම තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන නමුත් එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. මීට අමතරවල සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා අලෙවියෙන් පසු සේවාවන් ද සපයනු ලැබේ. තවද සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආදායම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට දායක වේ. | භාණ්ඩ | මෝටර් රථ<br>මෝටර් රථ /වාහන අමතර කොටස් |
| | සේවා. | අලෙවි කිරීම/<br>විකිණීම<br>අලෙවියෙන් පසු සේවා |

| | |
|---|---|
| **ප්‍රශ්නය:** ආර්ථිකයේ පැවැත්ම සඳහා සමාගම දායක වී ඇති ආකාර හතරක් දක්වන්න | ආර්ථිකයක පැවැත්ම සඳහා මෙම ව්‍යාපාරය දායක ඇති ආකාර ලෙස |
| සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ගුහ්‍ය විමෝචන (zero emission) මෝටර් රථ එකලස් කර ශ්‍රී ලංකාව තුළ අලෙවි කරයි. සමාගම තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන නමුත් එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. මීට අමතරවල සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා අලවියෙන් පසු_සේවාවන් ද සපයනු ලැබේ. තවද සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආදායම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට දායක වේ. | ජාතික නිෂ්පාදිතයට දායක වීම, රැකියා අවස්ථා ඇති කිරීම, රජයේ බදු ආදායම වැඩි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම, නවෝත්පාදන හඳුනාගත හැක. |

| | |
|---|---|
| **ප්‍රශ්නය:** සමාගමේ ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බල වේග හතරක් නම් කරන්න | |
| සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ගුහ්‍ය විමෝචන (zero emission) මෝටර් රථ එකලස් කර ශ්‍රී ලංකාව තුළ අලෙවි කරයි. සමාගම තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන නමුත් එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. මීට අමතරවල සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා අලවියෙන් පසු සේවාවන් ද සපයනු ලැබේ. තවද සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආයම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට දායක වේ. | - අයිතිකරුවන්,<br>- සේවකයන්,<br>- ගණුදෙනු කරුවන්,<br>- රජය,<br>- ස්වාභාවික පරිසරය,<br>- සැපයුම්කරුවන් |

**එමෙන්ම සිද්ධිය හා සෘජුවම සම්බන්ධ උදාහරණ සිද්ධිය තුළ හඳුනාගත නොහැකි ප්‍රශ්න සිද්ධිය ඇසුරු කරගෙන අසා තිබිය හැක.සෑම විටම සිද්ධියට සම්බන්ධ ව්‍යාපාර ක්ෂේත්‍රය සහ අනෙකුත් කරුණු කෙරෙහි ඔබගේ අවධානය මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී  තබා ගැනීම වැදගත් වේ.**

උදාහරණ ලෙස පහත ප්‍රශ්ණ පිළිබඳ ඔබේ අවදානය යොමු කරන්න.

**ප්‍රශ්නය :-** ව්‍යාපාර ලාභ අරමුණු කරගත යුත්තේ ඇයි දැයි හේතු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න

ව්‍යාපාරයක වර්ධනය සහ ප්‍රසාරණය සඳහා ලාභය අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාර ලාභ අරමුණු කරගත යුත්තේ ව්‍යාපාර සංවර්ධනයට/ ප්‍රති ආයෝජනයට/ ව්‍යාපාර වල අඛණ්ඩ පැවැත්මට/ ආයෝජනයන්ට ප්‍රතිලාස ලබා දීමට/ සේවකයන්ට ප්‍රතිලාභ ලබා දීමට

**ප්‍රශ්නය :- අලෙවියෙන් පසු සේවාවට අමතරව මෙම ව්‍යාපාරය මගින් පාරිභෝගිකයන්ට සැපයිය හැකි වෙනත් සේවා දෙකක් කෙටියෙන් විස්තර කරන්න (ව්‍යාපාරයට අදාල සැපයිය හැකි වෙනත් සේවා)**

**අලෙවියෙන් පසු සේවාවට අමතරව** රක්‍ෂණ පහසුකම්/මූල්‍ය ණය පහසුකම්/ප්‍රවාහන පහසුකම්

**ප්‍රශ්නය :- එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. " යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරල එමගින් ව්‍යාපාරයට ලබාගත හැකි වාසි දෙකක් දක්වන්න**

අදාල සංකල්පය :- ශ්‍රම විභජනය

මෙ මගින්  විශේෂ ප්‍රාගුන්‍ය ඇති වීම/ නිෂ්පාදිත ප්‍රමාණය වැඩි වීම/ නිෂ්පාදිත ඒකකවල පිරිවැය අඩු වීම/ නවෝත්පාදනයට යොමු වීම වාසි  ලෙස දැක්විය හැක.

**ප්‍රශ්නය :- සමාජ වගකීම් ඉටුකිරීමෙන් මෙම සමාගමට ලබාගත හැකි ප්‍රතිලාභ තුනක් පැහැදිලි කරන්න**

ප්‍රතිලාභ:- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම, ව්‍යාපාරයේ ප්‍රතිරූපය/ කීර්ති නාමය වර්ධනය වීම, ව්‍යාපාරය පිළිබඳ විශ්වාසය තහවුරු වීම ,ගණුදෙණු කරුවන් තාප්තිමත් කළ හැකි වීම, ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ලහා කර ගැනීමට පහසු වීම, වෙළෙඳපල පුළුල් වීම,තරඟකාරිත්වයට මුහුණ දීමට හැකි වීම, ආයෝජන ලබා ගැනීමට හැකි වීම

ප්‍රශ්නය:- **පාරිසරික තිරසර සංවර්ධනය සඳහා මෝටර් රථ නිෂ්පාදකයින්ට දායක විය හැකි ආකාර හතරක් පැහැදිලි කරන්න**

**මෝටර් රථ නිෂ්පාදකයි** තම ව්‍යාපාරයේ හා එහි පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා ලඟා කර ගැනීම සඳහා උපාය මාර්ග හා ක්‍රියාකාරකම් තේරීමේ දී අනාගත අවශ්‍යතා සඳහා අවශ්‍ය වන මානව හා ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් හා වැඩි දියුණු කරමින් කටයුතු කළ යුතු ය.

**දායක විය හැකි ආකාර** :- පරිසර හිතකාමී ප්‍රතිපත්ති ඇති කර ගැනීම, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන නිපදවීම, බරින් අඩු වාහන නිෂ්පාදනය / ඉන්ධන කාර්යක්ෂමතාවය, අපද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය කළමනාකරණය/ අමු ද්‍රව්‍ය නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය, පුනර්ජනනීය බල ශක්තියෙන් ධාවනය වන වාහන නිපදවීම (උදාහරණ හිරු එළිය /ස්වාභාවික බල ශක්ති ක්‍රම)

## සිද්ධි අධ්‍යයනය 2

ශාලිකා මහත්මිය ඇයගේ ඇඟලුම නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳව දැක්වූ අදහස් කිහිපයක් පහත වේ.

" අඩු මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලද මගේ ව්‍යාපාරය අභියෝගාත්මක වුවත් එය පවත්වා ගැනීමේ දී සීමිත නීතිරීති ප්‍රමාණයකට පමණක් යටත් වේ. ව්‍යාපාරය පිළිබඳ සියලුම තීරණ ගැනීම මෙම වගකීම් ද මා විසින් දැරිය යුතු ය. හවුල් ව්‍යාපාරයක් ලෙස මෙම ව්‍යාපාරය පරිවර්තනය කිරීමට මම අදහස් කළත් මගේ ගණකාධිකාරවරයා පැවසුවේ සීමා සහිත පුද්ගලික සමාගමක් ලෙසට ලියාපදිංචි කිරීම යෝග්‍ය බව ය.

**දැන් අප මෙම සිද්ධියට අදාළ ප්‍රශ්න දෙසට අවධානය යොමු කරමු .**

**ප්‍රශ්නය:-** <u>**හිමිකාරිත්වය අනුව**</u> මෙම ව්‍යාපාරය <u>**කුමන ව්‍යාපාර වර්ගයකට**</u> අයත් වන්නේ දැයි සඳහන් කරන්න

**ප්‍රශ්නය:- වර්ගී කරණය සඳහා පාදක වූ <u>හේතු තුනක් සිද්ධිය ඇසුරෙන් දක්වන්න</u>.**

<u>ශාලිකා මහත්මියගෙ ඇගලුම නිෂ්පාදන ව්‍යාපාරය</u>

**-<u>අඩු මුදලක් ආයෝජනය</u> කර ආරම්භ කරන ලද මගේ ව්‍යාපාරය** අභියෝගාත්මක වුවත් එය පවත්වා ගැනිමේ දී **සීමිත නීතිරීති** **ප්‍රමාණයකට** පමණක් යටත් වේ. ව්‍යාපාරය පිළිබඳ <u>සියලුම **තීරණ ගැනීම මෙම වගකීම් ද මා** විසින් දැරිය යුතු ය</u>. හවුල් ව්‍යාපාරයක් ලෙස මෙම ව්‍යාපාරය පරිවර්තනය කිරීමට මම අදහස් කළත් මගේ ගණකාධිකාරවරයා පැවසුවේ සීමා සහිත පුද්ගලික සමාගමක් ලෙසට ලියාපදිංචි කිරීම යෝග්‍ය බව ය.




පෞද්ගලික <u>**ව්‍යාපාර වර්ගයකට**</u> අයත්ය.

**වර්ගී කරණය සඳහා පාදක වූ** හේතු

- අයිතිකරු විසින් තනිව ප්‍රාග්ධනය සපයා ගැනීම- ශාලිකා විසින්ම මුදල් ආයෝජනය කර තිබීම
- කළමනාකරණ තීරණ ගනු ලබනුයේ අයිතිකරු විසින් වීම - ශාලිකා විසින් තීරණ ගැනීම
- අයිතිකරුගේ අසීමිත වගකීම- වගකීම් තනිව දැරීම
- ලාභ හෝ අලාභ තනි ව භුක්ති විඳීම -ප්‍රතිලාභ තනිවම භුක්ති විදීම

**. ප්‍රශ්නය:- <u>ශාලිකා</u> තම ව්‍යාපාරය** <u>'වියනා ටෙක්ස්ටයිල්ස්'</u> **නමින් ලියාපදිංචි කිරීමට අදහස් කරන්නේ නම් අනුගමනය කල යුතු <u>ක්‍රියාපටිපටිය</u> <u>විස්තර කරන්න</u>**

<u>**ශාලිකා**</u> ----------- <u>'වියනා ටෙක්ස්ටයිල්ස්'</u>

කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින ' පවත්වා ගෙන යන්නේ නම් 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත පදනම් කොට ගෙන ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතු ය.

- අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කේවල ස්වාමි ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම
- ග්‍රාම නිලධාරියාගෙන් ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ වාර්තාව ලබා ගැනීම
- ග්‍රාම නිලධාරී සහතික කළ වාර්තාව සහ ඉල්ලුම් පත්‍රය අදාළ ගාස්තු සමග ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම
- ප්‍රාදේශීය ලේකම් විසින් ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම

| ප්‍රශ්නය:- | මූලාශ්‍ර | | වාසි |
|---|---|---|---|
| ශාලිකාගේ ව්‍යාපාරයට අරමුදල් සපයාගත හැකි <u>අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍රය</u> බැගින් නම් කර ඒවායේ ඇති එක් <u>වාසිය</u> බැගින් සඳහන් කරන්න. | අභ්‍යන්තර මූලාශ්‍ර | - රඳවාගත් ලාභ<br>- ක්ෂය වෙන්කිරීම්<br>- අතිරික්ත වත්කම් ඉවත් කිරීම | - පිරිවැය අඩු වීම<br>- ලබා ගැනීම පහසු වීම.<br>- ආපසු ගෙවීමක් නොමැති වීම<br>- වගකීම් වැඩි නොවීම<br>- විශේෂ කොන්දේසි වලට යටත් වීමට සිදු නොවීම |
| | බාහිර මූලාශ්‍ර | - බැංකු ණය<br>- කල් බදු<br>- බැංකු අයිරා<br>- කුලී පිට ගැණුම් | - විශාල අරමුදල් ප්‍රමාණයක් සපයා ගත හැකි වීම<br>- අවශ්‍ය ඕනෑම විටෙකදී ලබා ගත හැකි වීම<br>- ආදායම් බදු ගණනය කිරීමේදී සහන ලබා ගත හැකි වීම |

| ප්‍රශ්නය:- | |
|---|---|
| <u>ශාලිකාගේ ව්‍යාපාරයේ</u> ඇති <u>සීමාවන් හතරක්</u> දක්වන්න. | - අයිතිකරුගේ අසීමිත වගකීම<br>- ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා<br>- නෛතික පුද්ගල භාවයක් නොමැති වීම<br>- අයිතිකරු තනිවම ගන්නා තීරණ අසාර්ථක වීමට හැකි වීම<br>- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම<br>- ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම<br>- අලාභ තනිව භුක්ති විදීමට සිදු වීම |


| | |
|---|---|
| ප්‍රශ්නය:- ශාලිකා තම <u>නිෂ්පාදන විකිණීම සඳහා අලෙවිසැලක් ආරම්භ කිරීමට</u> අදහස් කරන්නේ නම් එය කුමන <u>ව්‍යාපාර සංයෝජන වර්ගයකට</u> අයත් වන්නේ දැයි නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න | සිරස් සංයෝජන -ව්‍යාපාර දාමයේ ඊළඟ ව්‍යාපාර අවස්ථාව වන විකිණීම සඳහා යොමු වීම<br>ඇහලුම් නිෂ්පාදන<br>↓<br>ඇහලුම් අලෙවි කිරීම |

| | |
|---|---|
| ප්‍රශ්නය:- ශාලිකාගේ ව්‍යාපාරය <u>හවුල් ව්‍යාපාරයක්</u> ලෙස පරිවර්තනය කිරීමෙන් ඇයට හිමිවන <u>ප්‍රතිලාභ</u> හතරක් දක්වන්න. | - වඩාත් සාර්ථක තීරණ ගත හැකි වීම<br>- වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම.<br>- කිහිප දෙනෙකුගේ දක්ෂතා හා හැකියා එක් රැස් කර ගත හැකි වීම<br>- වගකීම කිහිප දෙනෙකු අතර බෙදී යාම<br>- සාමූහික වගකීම නිසා ඇතිවන උනන්දුව හා කාර්යක්ෂමතාව<br>- අවධානම බෙදී යාම |

## සිද්ධි අධ්‍යයනය 3

වෘත්තීය පුහුණු පාඨමාලාවක් අවසන් කිරීමෙන් පසු ආශා විසින් අමාශා නමින් රූපලාවණ්‍යාගාරයක් ආරම්භ කර එහි කළමනාකරු ලෙස අමර පත් කරන ලදී . රුපියල් 500 000 ක ණය මුදලක් සහ ඇයගේ ඉතුරුම් මුදල් රුපියල් 200 000 ක් ද මෙම ව්‍යාපාරය සඳහා ආශා විසින් ආයෝජනය කරනු ලැබිය. ආශා විසින් රුපියල් 600 000 ක් ගෙවා ගොඩනැගිල්ලක්ද මිලදී ගත් අතර ඉතිරිය තම ව්‍යාපාරය මගින් ඉහළ ගුණත්වයෙන් යුතු සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය නවීන උපකරණ ආනයනය කිරීම සඳහා වැය කරන ලදී . ඇය ඇතුළු පුහුණු කාර්ය මණ්ඩලය තම ගනුදෙනුකරුවන් ගේ පහසුව සලකා ඕනෑම මොහොතකදී ගනුදෙනුකරුවන්ගේ නිවසට පැමිණ හෝ රූපලාවන්‍යාගාරයේදී හෝ තම සේවා සැපයීමට කටයුතු කරනු ලැබේ.

දැන් අප මෙම සිද්ධියට අදාළ ප්‍රශ්න දෙසට අවධානය යොමු කරමු .

<table>
<tr>
<td>ප්‍රශ්නය:- මෙම ව්‍යාපාරය හිමිකාරීත්වය අරමුණ පරිමාණය නිෂ්පාදන අංශය යන නිර්ණායක අනුව <u>වර්ග කරන්න.</u></td>
<td>


<br>හිමිකාරීත්වය - පෞද්ගලික
<br>අරමුණ -ලාභය
<br>පරිමාණය - සුළු හා මධ්‍ය පරිමාණ/සුළු පරිමාණ
<br>නිෂ්පාදන අංශය- සේවා
</td>
</tr>
<tr>
<td>ප්‍රශ්නය:- ආශාගේ ව්‍යාපාරය ඉටු කරනු ලබන්නේ <u>පුද්ගල අවශ්‍යතාවයක් ද නැතහොත් වුවමනාවක්</u> ද යන්න කෙටියෙන් <u>විස්තර කරන්න</u></td>
<td>
<table>
<tr><th>අවශ්‍යතා</th><th>වුවමනා</th></tr>
<tr>
<td>• සීමිත වේ.<br>• සෑම පුද්ගලයාට ම පොදු ය.<br>• ජීවත්වීම සඳහා අත්‍යාවශ්‍යයෙන් ම සපුරාගත යුතු වේ.<br>• ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ නො හැකි ය.<br>• සමාජ බලවේග මගින් වෙනස් කළ නො හැකි ය.</td>
<td>• අසීමිත වේ.<br>• පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වේ.<br>• ජීවත්වීමට අත්‍යාවශ්‍යයෙන් ම සපුරාගත යුතු නොවේ.<br>• ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි ය.<br>• සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි ය.</td>
</tr>
</table>
ආශාගේ ව්‍යාපාරය ඉටු කරනු ලබන්නේ <u>පුද්ගල්</u> වුවමනාවකි ජීවත්වීම සඳහා අත්‍යාවශ්‍ය/ අනිවාර්ය නොවේ.
</td>
</tr>
<tr>
<td>ප්‍රශ්නය:- ආශා විසින් <u>මිල හැර</u> පාරිභෝගික ඉල්ලුම් වැඩිකර කරගැනීම සඳහා යොදාගෙන ඇති වෙනත් උපක්‍රම දෙකක් <u>නම් කර ඒවා විස්තර කරන්න.</u></td>
<td>මිල හැර වෙනත් උපක්‍රම දෙකක් සිද්ධි අධ්‍යයනය ආශ්‍රිතයෙන් ඉදිරිපත් කිරීම බලාපොරොත්තු වෙන අතර<br>- ඉහළ ගුණත්වය -නවීන උපකරණ භාවිතය<br>- පහසුව - ගනුදෙනුකරුවන්ගේ නිවසට පැමිණීම, ඕනෑම අවස්ථාවකදී සේවා සැපයීම පිළිතුරු ලෙස දැක්විය හැක</td>
</tr>
<tr>
<td><u>ප්‍රශ්නය:- මෙම ව්‍යාපාරයේ</u> ශක්තීන් දෙකක් සහ දුර්වලතා <u>දෙකක් දක්වන්න</u> .</td>
<td>ශක්තීන්- ආශා වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම නිසා ඉහළ දැනුමක් තිබීම/ආශාගේ ව්‍යාපාරයේ පුහුණු කාර්ය මණ්ඩලයක් සිටීම නවීන උපකරණ භාවිතය<br>දුර්වලතා- ණය ප්‍රාග්ධනය වැඩිවීම/කාරක ප්‍රාග්ධන දුෂ්කරතා පැවතීම/මූල්‍ය ශක්තිය අඩුවීම</td>
</tr>
<tr>
<td>ප්‍රශ්නය:- ආශාගේ ව්‍යාපාරය <u>අයත් කර්මාන්තය</u> ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර දෙකක් <u>විස්තර කරන්න</u> .</td>
<td>ජාතික නිෂ්පාදිතයට දායක වීම, රැකියා අවස්ථා ඇති කිරීම, රජයේ බදු ආදායම වැඩි කිරීම</td>
</tr>
<tr>
<td>ප්‍රශ්නය:- <u>මෙවැනි වූ ව්‍යාපාර</u> වල දැකිය හැකි සීමා හතරක් සඳහන් කරන්න .</td>
<td>ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා මතුවීම/ නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම/ අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම/ අයිතිකරුගේ අසීමිත වගකීම/ අලාභ තනි ව භුක්ති විඳීම</td>
</tr>
</table>

| | |
|---|---|
| **ප්‍රශ්නය:-** ආශාගේ ව්‍යාපාරයේ ව්‍යවසායකත්වයට අමතරව යොදවා ඇති සම්පත් හතරක් උදාහරණ සහිතව ලියන්න. | භූමිය,ශ්‍රමය,ප්‍රාග්ධනය,දැනුම,තොරතුරු,කාලය (සම්පත් නම් කිරීම මෙන්ම සිද්ධිය ඇසුරෙන් උදාහරණ සැපයීම කළ යුතුය)- උදා:- භූමිය-ආශාගේ ගොඩනැගිල්ල පිහිටි ඉඩම |
| **ප්‍රශ්නය:-** ආශාගේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා තවදුරටත් වර්ධනය කර ගත් හැකි ආකාර හතරක් පැහැදිලි කරන්න. | ස්වයං ඇගයීම,පුහුණුව,අධ්‍යාපනය,අත්දැකීම්වලින් වලින් ඵල ලැබීම (කෙටියෙන් පැහැදිලි කිරීම අත්‍යවශ්‍ය වේ.) උදා:- පුහුණුව- පුහුණු වැඩසටහන්වලට සහභාගීවීම |

සිද්ධිය තුළින් උකහා දක්වා ඇති සිද්ධාන්ත සහ සිද්ධිය තුළින් ප්‍රශ්න ගොඩනැගී ඇති ආකාරය තේරුම් ගැනීම කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීම වැදගත් වෙයි. සිද්ධාන්ත දැනුම ප්‍රායෝගිකව පරීක්ෂාව මෙහි අරමුණ බව ඔබට අවබෝධ විය යුතු අතර ඒ නිපුනණතා පිළිබඳ ඔබ අවබෝධ කරග ගත යුතුය.

සියලු අභියෝග ජය ගනිමු. ඔබ සියලු දෙනාටම විශිෂ්ට ජයග්‍රහණයක් ප්‍රාර්ථනා කරමි.



මහාචාර්ය සුසීමා වැලිගමගේ
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය



# පාසල් යන වයසේ දරුවන් අර්ධකාලීන රැකියාවලට යොමු කිරීම 'දැලිපිහියෙන් කිරි කනවා වගේ' වැඩක්

මෙරට පාසල් යන වයසේ පසුවන දරුවන්ට අර්ධකාලීන රැකියාවන්හි නිරත වීමේ අවස්ථාව ලබා දීම පිළිබඳ යෝජිත වැඩපිළිවෙළ මේ දිනවල බොහෝ පාර්ශව අතර විවාදයට තුඩුදෙන කාරණාවක්. ඒ ගැන පක්ෂ-විපක්ෂ මතවාද බොහොමයක් බොහෝ අය අතර තියෙන බව පේනවා. කෙසේ වෙතත් එය කළු-සුදු තීරණයක්. ඒ වගේම 'දැලිපිහියෙන් කිරි කනවා වගේ' වැඩක්.

රටක අනාගතය ගොඩනැංවීම සඳහා දරු පරපුර තුළ ශාරීරික, මානසික, අධ්‍යාපනික, සදාචාරාත්මක මෙන්ම අධ්‍යාත්මික ආදී සෑම අතකින්ම පරිපූර්ණ වර්ධනයක් ඇති කිරීමත් සුරක්ෂිත හා පෞරුෂ වර්ධනයක් සහිත, ලෝකයට විවෘත මනසක් ඇති තරුණ පිරිසක් ගොඩනැංවීමත් වැදගත්. ඒ සඳහා දරුවන් පළමුව නිසි පරිදි අධ්‍යාපනය ලැබිය යුතුයි. අධ්‍යාපනයේ අරමුණ දරුවන් අනාගතයේ පැය අටක සේවා මුරයකට හුරු කිරීම නෙවෙයි. අධ්‍යාපනය ජීවනෝපාය ඉලක්ක කරගත් දෙයක් නෙවෙයි. එය කිසියම් රැකියාවක් ළඟ නතර වන දෙයක් නෙවෙයි. එහෙත් අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව අප පිවිසෙන්නේ අතිශයින් සංකීර්ණ සහ තරඟකාරී නිෂ්පාදන-පාරිභෝගික ලෝකයකට. එතැනදී සිදුවෙන්නේ උගත් ශිල්ප ශාස්ත්‍ර ඉපැයුම් මාධ්‍යයක් බවට පත් කර ගැනීමයි. එක්කෝ සේවකයෙකු වීමෙන් නැතිනම් ව්‍යවසායකයෙකු හෝ ස්වයං සේවා නියුක්තියෙකු වීම තුළින් මේ දේ සිදුවෙනවා. එනිසා නූතන අධ්‍යාපනය අනිවාර්යෙන්ම නූතන වැඩ ලෝකය සමඟ සම්බන්ධ විය යුතු වෙනවා.

මෙතෙක් අපේ රටේ පැවැති පරිචයන් අනුව විශ්වවිද්‍යාල තුළ උසස් අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන් සහ විවිධ වෘත්තීය පාඨමාලා හදාරන අය පුහුණුවන්නන් ලෙස අධ්‍යාපනය ලබන කාල සීමාව තුළදීම සේවා නියුක්ත වීම අනිවාර්ය දෙයක්. එහෙත් නූතන වැඩ ලෝකයේ අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට අනුගත වීමට අවශ්‍ය ඇතැම් නිපුණතා සංවර්ධනය කරගැනීමට ඒ වන විටත් ඔවුන් ප්‍රමාද වැඩියි. ඒ නිසා අවුරුදු 16ට වැඩි පාසල් යන වයසේ දරුවන්ට පවා ඔවුන්ගේ අධ්‍යාපනයට බාධා නොවන අයුරින් අර්ධකාලීන පදනමින් සේවා නියුක්තව රැකියා ලෝකයේ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම වැදගත්.

දියුණු අධ්‍යාපනය ක්‍රමයක් ඇති බොහෝ රටවල එවැන්නක් ක්‍රියාත්මක වෙනවා. තමා පාසලේදී උගත් දේ සියැසින් දැක බලා ගැනීමත්, ඇතැම් විෂය කරුණු ආයතනික පරිචයන් තුළ අත්හදා බැලීමත්, තමා උගත් දේ පිළිගැනීමට හෝ ප්‍රශ්න කිරීමට අවශ්‍ය ප්‍රායෝගික නිදර්ශන එක්රැස් කිරීමත් එහිදී සිදුවෙනවා. ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ෆින්ලන්තය, නෝර්වේ, ස්විට්සර්ලන්තය සහ කැනඩාව ඇතළු රටවල් බොහෝමයක ඉහළ ශ්‍රේණිවල පාසල් සිසුන් සඳහා ආයතනික අත්දැකීම් ලබා ගැනීම සඳහා සේවා නියුක්ත වීමට මාස කිහිපයක වෙනම කාලයක් පවා විෂය නිර්දේශ තුළ අන්තර්ගතව තියෙනවා. එසේම සෑම රැකියාවකම ඇති වටිනාකම සහ වැදගත්කම අත්දැකීමෙන් අවබෝධ කර ගැනීමටත් එතුළින් වෘත්තීය අන්තගාමීත්වය බැහැර කර වෘත්තීය සහජීවනය සඳහා අවැසි ආකල්පමය වෙනස ඊළඟ පරම්පරාව තුළ ඇතිවීමටත් එය ඉවහල් වනු ඇති. පාසල් විෂය නිර්දේශය තුළින් ආවරණය නොවන ඇතැම් ප්‍රායෝගික තත්ත්වයන්, තාක්ෂණය, නව මානව සම්බන්ධතා ඇති කර ගැනීම සහ දරුවන් තුළ සැඟව ඇති විභවයන් මතු කර ගැනීමට හැකියාව ලැබීමත් 'සුදු' පැත්තෙන් දකින්න පුලුවන්.

එසේම සෑම රැකියාවකම ඇති වටිනාකම සහ වැදගත්කම අත්දැකීමෙන් අවබෝධ කර ගැනීමටත් එතුළින් වෘත්තීය අන්තගාමීත්වය බැහැර කර වෘත්තීය සහජීවනය සඳහා අවැසි ආකල්පමය වෙනස ඊළඟ පරම්පරාව තුළ ඇතිවීමටත් එය ඉවහල් වනු ඇති. පාසල් විෂය නිර්දේශය තුළින් ආවරණය නොවන ඇතැම් ප්‍රායෝගික තත්ත්වයන්, තාක්ෂණය, නව මානව සම්බන්ධතා ඇති කර ගැනීම සහ දරුවන් තුළ සැඟව ඇති විභවයන් මතු කර ගැනීමට හැකියාව ලැබීමත් 'සුදු' පැත්තෙන් දකින්න පුලුවන්.

කෙසේ වෙතත් යෝජිත මෙම පරිචය දිගුකාලීන විශ්ලේෂණාත්මක සැලැස්මක් මත පිහිටා නැති තවත් එක් ජනප්‍රිය දේශපාලන තීරණයක් නම් එහි 'කළු' පැත්ත අතිශයින් බරපතලයි. එනිසා යෝජිත මෙම පරිචයෙන් අපේක්ෂිත 'සුදු' ප්‍රතිඵල ලැබීමට නම් එය නිවැරදි සැලැස්මක් ඇතිව, ප්‍රතිඵල ගැන නිසි අවබෝධය සහිතව, විශේෂයෙන්ම නිසි නියාමනයක් ඇතිව ක්‍රියාත්මක කළ යුතු වෙනවා.

එසේම සෑම රැකියාවකම ඇති වටිනාකම සහ වැදගත්කම අත්දැකීමෙන් අවබෝධ කර ගැනීමටත් එතුළින් වෘත්තීය අන්තගාමීත්වය බැහැර කර වෘත්තීය සහජීවනය සඳහා අවැසි ආකල්පමය වෙනස ඊළඟ පරම්පරාව තුළ ඇතිවීමටත් එය ඉවහල් වනු ඇති. පාසල් විෂය නිර්දේශය තුළින් ආවරණය නොවන ඇතැම් ප්‍රායෝගික තත්ත්වයන්, තාක්ෂණය, නව මානව සම්බන්ධතා ඇති කර ගැනීම සහ දරුවන් තුළ සැඟව ඇති විභවයන් මතු කර ගැනීමට හැකියාව ලැබීමත් 'සුදු' පැත්තෙන් දකින්න පුලුවන්. කෙසේ වෙතත් යෝජිත මෙම පරිචය දිගුකාලීන විශ්ලේෂණාත්මක සැලැස්මක් මත පිහිටා නැති තවත් එක් ජනප්‍රිය දේශපාලන තීරණයක් නම් එහි 'කළු' පැත්ත අතිශයින් බරපතලයි. එනිසා යෝජිත මෙම පරිචයෙන් අපේක්ෂිත 'සුදු' ප්‍රතිඵල ලැබීමට නම් එය නිවැරදි සැලැස්මක් ඇතිව, ප්‍රතිඵල ගැන නිසි අවබෝධය සහිතව, විශේෂයෙන්ම නිසි නියාමනයක් ඇතිව ක්‍රියාත්මක කළ යුතු වෙනවා.

2021 වසර ජාත්‍යන්තර ළමා ශ්‍රමය තුරන් කිරීමේ වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කෙරුණා. ඊට සමගාමීව ළමා ශ්‍රමය සහ අන්තරාදායක තරුණ ශ්‍රමය ශුන්‍ය කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටිනවා. 2010 අගෝස්තු 20 දිනැති අංක 1667/41 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් හඳුන්වා දුන් රැකියා 51කින් සමන්විත අන්තරාදායක රැකියා ලැයිස්තුව 2021 නොවැම්බර් 18 දිනැති අංක 2254/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අන්තරාදායක රැකියා ක්ෂේත්‍ර 71 දක්වා පුළුල් කරනු ලැබුවා. එසේම අදාළ ගැසට් පත්‍රය මඟින් 2021 අංක 01 දරන අන්තරායකාරී රැකියා නියෝග පැනවීම සිදුකළා. ඒ අනුව වයස අවුරුදු 18ට අඩු කිසිම අයෙකු එම රැකියාවන්හි යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම් වෙනවා.

එවැනි තත්ත්වයක් යටතේ පාසල් යන වයසේ දරුවන් අර්ධකාලීන රැකියා සඳහා යොමුකිරීමට නම් දැනට මෙරට ක්‍රියාත්මක වන කාර්මික නීතියේ සහ අදාළ වෙනත් නීති රෙගුලාසිවල විශාල සංශෝධන අවශ්‍ය වනවා. එසේ නොමැති වුවහොත් දරුවන්ගේ ශ්‍රමය සූරා කෑමට සහ අවභාවිතා කිරීමට පුද්ගලික අංශයේ ආයතන හිමිකරුවන්ට ඉඩ සැලසෙනවා.

එනිසා ශක්තිමත් නෛතික හා ආයතනික පසුතලයක් සහිතවයි අදාළ යෝජනාව ක්‍රියාත්මක කළ යුත්තේ. නියාමන කාර්යයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ, කම්කරු අමාත්‍යාංශයේ හා කම්කරු දෙපාර්තුමේන්තුවේ, පාසලේ විදුහල්පතිවරයාගේ හා ගුරුවරුන්ගේ සහ දෙමාපියන්ගේ කාර්යභාරය මෙන්ම ආයතන හිමිකරුවන් සඳහා වන නෛතික හා සදාචාරාත්මක මාර්ගෝපදේශ පැහැදිලිව දක්වමින් සකස් කෙරෙන ක්‍රියාකාරී සැලැස්මක් අනුවයි අදාළ යෝජනාව ක්‍රියාමක විය යුත්තේ.

(කතෘ විසින් 2022 අගෝස්තු 17 වැනි බදාදා අරුණ පුවත්පතේ පළ කරන ලද ලිපියක් ඇසුරිනි.)



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තරිඳු ධනංජය වීරසිංහ
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# උසස් පෙළට සාර්ථකව මුහුණ දීමට නම්..........

උසස් පෙළ එසේත් නැතිනම් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය යනු ශ්‍රී ලාංකික දරුවන්ගේ ජීවිතයේ එක් තීරණාත්මක කඩඉමකි. එසේවුවත් එය ජීවිතය තීරණය කරන එකම සාධකය නොවන බව මතක තබා ගත යුතුයි. මන්ද උසස් පෙළ සාර්ථකත්වය ඉන් පසුව ඇති වෘත්තීමය පාඨමාලා හරහා ඉදිරි ජීවිතය සාර්ථක කර ගත හැකි නිසාවෙනි.

කෙසේවුවත් 2020/21 වර්ෂවල ශිෂ්‍යයන් කොරෝනා වෛරසය හේතුකොට ගෙන දැඩි අභියෝගයකට මුහුණ දුන් අතර වර්තමානය වන විට එය යම් තරමකට පාලනය වී ඇත. වාර්ෂිකව උසස් පෙළ විභාගයට අයදුම්කරුවන් ලක්ෂ හතරකට ආසන්න ප්‍රමාණයක් මුහුණ දෙන අතර ඉන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන්නේ 35,000කට ආසන්න ප්‍රමාණයක් පමණි. ශ්‍රී ලංකාවේ ඉතාම තරඟකාරී විභාගයක් වන අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලැබීම ඉතාම දුර්ලභ අවස්ථාවක් වන අතර භාග්‍යයක්ද වෙයි. කොවිඩ් පශ්චාත් අවධිය යටතේ වුවද හොඳ මානසික මට්ටමකින් විභාගයට මුහුණ දීම ඉතාමත් වැදගත් වන අතර ඉහළ ප්‍රතිඵලයක් ලබා ගැනීමට ද මහගු පිටුවහලක් වන බව නොඅනුමානය.

වර්තමාන තත්ත්වය තුළ පාසල් හා උපකාරක පන්ති භෞතිකව පවත්වන අතර කලින් වසරවල ඒ කටයුතු සියල්ල මාර්ගගත (online) ක්‍රමයට පවත්වන ලදී. මාර්ගගත ක්‍රමය ගුරුවරුන් හා ශිෂ්‍යයන් යන දෙපිරිසට ම අභියෝගයක් වූ අතර වාසි හා අවාසි යන තත්ත්වයන් ද්විත්වයම මෙහිලා සාකච්ඡා ට බඳුන් කළ හැකිය. මෙම තත්ත්වය තුළ ශිෂ්‍යයන් මානසික පීඩනය/ආතතියට පත්වීම වැළැක්විය නොහැකිය. මක්නිසාදයත් මාර්ගගත ක්‍රමය, භෞතික ක්‍රමය අතර හුවමාරුව ශිෂ්‍යයන්ට මහත් ගැටලුකාරී තත්ත්වයක් ඇති කරන නිසාවෙනි. මේ හරහා පහත ලක්ෂණ ශිෂ්‍යයන්ගෙන් දැකිය හැකිය.

- කාංසාව
- කලබල ගතිය
- මානසික විඩාව
- අමතක වීම
- බලාපොරොත්තු සුන්බව
- නිතර කෝපයට පත්වීම
- නුරුස්සනා ස්වභාවය
- නිදා ගැනීමේ හා ආහාර ගැනීමේ අපහසුතාවයන්
- මානසික සමබරතාව බිඳ වැටීම
- කාර්යයන් අවසානය දක්වා සම්පූර්ණ කිරීමට අසමත් බව

කෙසේවුවත් සමබර රටාවක් තුළ කටයුතු කිරීම හරහා මෙකී තත්ත්වයන් පාලනය කරගත හැකිය. මනුෂ්‍යයා යනු සාමාජීය සත්ත්වයෙකි. ඒ අනුව සමාජය, ආගමික කාර්ය, ආධ්‍යාත්මික කාර්ය ආදී සියල්ලම අත්‍යවශ්‍ය බව සමාජ විද්‍යාඥයින් පර්යේෂණ හරහා තහවුරු කොට ඇත. ඉන් එක් සාධකයක් හෝ බිඳ වැටෙන්නේ නම් මානසික පීඩනයට නිරායාසයෙන්ම යොමු වන බව මතක තබාගත යුතුය.

උසස් පෙළ විභාග සූදානම තුළ දෙමාපියන්ගේ ක්‍රියාශීලී දායකත්වය ද මෙම පීඩාකාරී තත්ත්වයන් මගහරවා ගැනීමට මහත් පිටුවහලක් කර ගත හැකිය. දෙමාපියන්ට සමීපව තම දරුවන් සමඟ කටයුතු කිරීමත්, කථා බහ කිරීමත් ප්‍රධාන කාර්යයක් බව මතක තබාගත යුතුය. මෙම තත්ත්වයන් තුළ අනවශ්‍ය මානසික පීඩනයන්ගෙන් මිදීමට හා මානසික සුවතාව පවත්වා ගැනීමට හැකියි.

මෙම තත්ත්වයන් තුළ අනවශ්‍ය මානසික පීඩනයන්ගෙන් මිදීමට හා මානසික සුවතාව පවත්වා ගැනීමට හැකිය. මීට අමතරව පහත ක්‍රියාකාරකම් වල යෙදීමෙන් සමබර අධ්‍යාපනික කටයුතු පවත්වාගෙන යා හැක.

- පවුලේ අය සමඟ සුහද පිළිසඳරෙහි යෙදීම
- ගෙවතු වගා කටයුතු අලංකරණ කටයුතු වල යෙදීම
- පොත්පත්/පුවත්පත් ආදිය කියවීම
- විශේෂ රූපවාහිනී වැඩසටහන්/සංවාද නැරඹීම
- ආගමික කටයුතු වල නියැලීම
- භාවනා කිරීම

එකම අරමුණක් තුළ අඛණ්ඩව කටයුතු කිරීම තුළ විඩාවට පත්වන අතර ඉහත කරුණු පුරුදු පුහුණු කිරීම තුළ විඩාව මගහරවා ගැනීමට කටයුතු කළ හැකිය. එසේම මානසික පීඩාව ද අවම කරගත හැකිය.

විභාගය සඳහා පාඩම් කටයුතු කළමනාකරණය කර ගැනීම ද ඉතා අත්‍යාවශ්‍ය සාධකයක් වන්නේ වසර දෙකක පුළුල් විෂය මාලාවක් උසස් පෙළ විභාග ප්‍රශ්න පත්‍ර තුළ අන්තර්ගත නිසාවෙනි. ශිෂ්‍යයන් බොහෝ අවස්ථාවල සිදු කරන ප්‍රධානතම වැරැද්ද නම් තමන් කැමති සහ ආසම පාඩම් මාලාවන් බොහෝ වාර ගණනක් පාඩම් කිරීමත් අකමැති පාඩම් අවම වාර ගණනකුත් පාඩම් කිරීමත් එකී කොටස් අවසානය වන තෙක් පාඩම් නොකර තබා ගැනීමත් ය. මෙහිදී ශිෂ්‍යයන් අවධානය දිය යුතු කරුණ නම් වැඩි බර තැබීමක් හා වැඩි වාර ගණනක් පාඩම් කළ යුත්තේ අමාරු හා අකමැති පාඩම් ඒකකයන් බවයි. මන්ද ආසම සහ ලේසිම පාඩම් ඒකකයන්ට ඔබ හොඳින් සූදානම් නිසාත්, එම කොටස්වල තවදුරටත් කාලය මිඩංගු කිරීම තමාට සිදු කරගන්නා අවාසිදායක තත්ත්වයක් නිසාවෙනි.

එසේම විභාගය අවසානය දක්වා ම අඛණ්ඩ උත්සාහය පවත්වා ගත යුතුය. (මෙය බුදු දහම තුළ ආරම්භක ධාතු, පරක්කම ධාතු හා නික්කම ධාතු ලෙස හඳුන්වයි; ආරම්භක උත්සාහය, පවත්වා ගැනීමේ උත්සාහය හා අවසන් කිරීමේ උත්සාහය).

ප්‍රධාන වශයෙන් මේ වන විට නිම කිරීමට ඇති පාඩම් සහ මෑතදී අවසන් කරන ලද පාඩම් සඳහා ඉහළ අවධානයක් ලබා දෙන්න. එලෙසම දැනට 12 ශ්‍රේණිය අවසන් කරන ලද පාඩම් නැවත නැවත ක්‍රමානුකූලව ආවර්ජනය කර ගන්න. මන්ද විභාග ප්‍රශ්න පත්‍රය 12 ශ්‍රේණිය, 13 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සකස් වන නිසාවෙනි. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර බලමින් ඒවාට පිළිතුරු සපයා ඔබගේ නියම තත්වය සහ ස්ථානය හඳුනා ගන්න. එය ඔබගේ අභ්‍යන්තර ශක්තීන් දුර්වලතා හඳුනා ගැනීමට හා ඉන් ඔබ්බට ඔබගේ දියුණුව තහවුරු කර ගැනීමට හේතුවක් වනු ඇත.

මීට අමතරව ගුරු අත්පොත (ගුරු මාර්ගෝපදේශය) සොයාගෙන හොඳින් පරිශීලනය කරන්න. මන්ද සියලුම විභාග ප්‍රශ්න පත්‍ර සකස් වන්නේ ගුරු අත්පොත අත්පොත මත පදනම් වන නිසාවෙනි.

ඒ නිසාවෙන් ආදරණීය දුවේ පුතේ, මෙම කාලසීමාව ජීවිතයට ආශිර්වාදයක් සහ ආයෝජනයක් ලෙස සිතමින්, බාධාවන් හමුවේ නොසැලී අඛණ්ඩව ඔබගේ අරමුණු හා පරමාර්ථ වෙත ගමන් කරන්න. පසුකාලීනව ඔබ නැවත හැරී බලන විට, නෙතට කඳුළක්ද සමගින් ජයග්‍රහණයේ මල්දම් දිවියේ රඳවනු ඇත.

සියලුම දෙනාට උසස් පෙළ විභාගයෙන් ඉහළ ප්‍රතිඵලයක් ලබා ගැනීමට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා!!!



එච්. ජේ. ආර්. බුද්ධික
කථිකාචාර්ය
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# මූල්‍ය සාක්ෂරතාවය තුළින් යහපත් හෙටක් බිහි කරගමු.

අප සෑම සියලුදෙනා හටම කුඩා අවධියේ සිටම හොඳින් ඉගෙනගෙන කෙදිනක හෝ ධනවත් වීමේ සිහිනයක් ඇත. උසස් පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිරන්තරයෙන් සිහින මවනුයේ උසස් පෙළ කඩයිම සාර්ථක අන්දමින් පසු කර, විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගෙන, උපාධිධාරියෙක් බවට පත්වී, හොඳ රැකියාවක් ලබා ගෙන, සමාජයට වැඩදායී පුද්ගලයෙක් බවට පත්වීමයි. මෙය අප කුඩාකල සිටම අපේ දෙමව්පියන්ගෙන්, අප අවට පරිසරයෙන් අපට ලැබෙන ආදර්ශයයි. එබැවින් අප කුඩාකල සිටම වෙහෙස මහන්සි වී උගනී. පසුව වෘත්තිකයෙක් (වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක්, ගණකාධිකාරීවරයෙක්, නීතිඥයෙක්) බවට පත්වේ. නමුදු විශේෂ සැලකිල්ලට භාජනය විය යුතු කරුණක්නම්, මෙකී වෘත්තිකයන් ජීවිතයේ බොහෝ ලෙස මූල්‍යමය වශයෙන් අපහසුතාවට පත්වීමයි. මේ සඳහා බලපා ඇති ප්‍රධාන සාධකය නම් ඔවුන් අතර සාක්ෂරතාවය ඉහළ මට්ටමක පැවතියද, මූල්‍ය සාක්ෂරතාවය පහළ මට්ටමක පැවතීමයි. මූල්‍ය සාක්ෂරතාවය යනු, පුද්ගලික මූල්‍ය කළමනාකරණය, අයවැයකරණය, ඉතිරිකිරීම්, ආයෝජන, ණය ගැනීම් ඇතුළු විවිධ මූල්‍ය කළමනාකරණ කුසලතා ඵලදායී ලෙස අවබෝධ කර ගැනීමේ සහ යෙදවීමේ හැකියාවයි.

රොබර්ට් කියෝශාකි නමැති රචකයා විසින් රචිත Rich Dad Poor Dad නැමැති ග්‍රන්ථයේ මූල්‍ය සාක්ෂරත්වයකින් තොර තමන් උපයන මුදල් මනාව කළමනාකරණය කළ නොහැකි වෘත්තිකයින් දුප්පතුන් ලෙස හඳුන්වා දී ඇත. ඔහුගේ අර්ථ දැක්වීමට අනුව වෘත්තිකයින් තම සේවායෝජකයා වෙනුවෙන් මහන්සි වී වැඩ කර මුදල් උපයයි. එබැවින් ඔවුන් මුදල් වෙනුවෙන් වැඩ කරයි. එලෙස මහන්සි වී උපයන මුදල් වලින් කොටසක් ඔවුන් රජයට ආදායම් බදු ලෙසත්, බැංකු වලට ණය වාරික ලෙසත්, ණයපත් සඳහාත් ගෙවීම් කරයි. එබැවින් ඔවුන් තම කාලය වැය කරන්නේ මුදල් වෙනුවෙනි, අනුන් වෙනුවෙනි. එහෙත් ඔවුන් මුදල් වලින් තමන්ට වැඩ කරගන්නේ කෙසේද යන්න ගැන සලකා බලන්නේ නැත. මහන්සි වී වැඩ කර මාස දෙක තුනක් වැටුප් ගත පසු මොවුන් ඉතා ඉක්මනින් වත්කම් සේ සලකා වගකීම් අත්පත් කර ගනී. උදාහරණයක් ලෙස තම ප්‍රථම වැටුපෙන් ඉතා ඉහළ අගයකින් යුතු ජංගම දුරකතනයක් වාරික වශයෙන් ගෙවීමට ගනී. සුඛෝපභෝගී මෝටර් රථයක් කල්බදු ක්‍රමයට අත්පත් කරගනී. ඉඩමක් හෝ නිවසක් නිවාස ණය ක්‍රමයක් යටතේ ගොඩනගා ගනී. මෙකී සෑම අවස්ථාවකම ඔවුන් වත්කම් සේ සලකා වගකීම් අත්පත් කරගෙන ඇත. ජංගම දුරකතනය සඳහා අවුරුදු දෙකක් හෝ තුනක් වාරික ගෙවූ පසු එහි සුන්බුන් වටිනාකමක් නැත. තවද ජංගම දුරකතනය අපගේ පරිභෝජනය සඳහා මිස ඉන් උත්පාදනය වන අමතර ආදායමක්ද නොමැත. මෙම අත්පත් කරගත් වගකීම් පියවීම වෙනුවෙන් මාසිකව සැලකිය යුතු මුදලක් වෙන්කළ පසු අප උපයන ආදායම එදිනෙදා ජීවන රටාව පවත්වා ගැනීම සඳහාම පමණක් ප්‍රමාණවත් වේ.

අපි ධනවත් පුද්ගලයෙකුගේ ක්‍රියා කලාපය දෙස විමසීමක් කළහොත් අපිට හැගෙන කරුණ නම්, ඔවුන් අති සුඛෝපභෝගී ජීවන රටාවක් ගත කරන බවයි. නමුදු ඔවුන් තමන් වෙහෙස වී උපයන ආදායමින් නිතරම තම ධනය වර්ධනය කර ගත හැකි වත්කම් අත්පත් කර ගනී. උදාහරණයක් ලෙස සමාගම් කොටස්, බැඳුම්කර, ණයකර, ලාභදායී ව්‍යාපාර, ඉඩම් සහ ගොඩනැගිලි වැනි නිශ්චල දේපල දැක්විය හැක. විශේෂයෙන්ම ධනවතුන් තම ප්‍රාථමික ආදායම් මාර්ගය මතම පදනම් නොවී තම ධනය වර්ධනය කර ගැනීම සඳහා ද්විතියික, තෘතියික ආදායම් මාර්ග හඹා යයි. එබැවින් ඔවුන් මුදල් වෙනුවෙන් වැඩ කරනු විනා මුදල් වලින් තමන් සඳහා වැඩ කරවා ගනී.

තවද ධනවතුන් ඔවුන්ගේ සුඛෝපභෝගී ජීවන රටාව පවත්වා ගනු ලබන්නේ ඔවුන්ගේ ද්විතියික හෝ තෘතියික ආදායම් මාර්ග වලින් උපයන ආදායම් යොදාගැනීමෙනි. එබැවින් තරුණ වියේ සිටින ඔබ සැම අදිටන් කර ගත යුතු වන්නේ, අපගේ සම්ප්‍රදායික ක්‍රමවේදයෙන් ඔබ්බට ගොස් මුදල් වෙනුවෙන් වැඩ කරන සමාජයක් වෙනුවට මුදල් වලින් වැඩ ගන්නා සමාජයක් බිහි කිරීමයි. මේ සඳහා ඔබ කුඩාකල සිටම පුද්ගල මූල්‍ය කළමනාකරණ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කර ගත යුතු වේ. අපේ රටේ පවතින අධ්‍යාපන ක්‍රමය තුළ උසස් පෙළ වාණිජ විෂය ධාරාව හදාරන පිරිස පමණක් පුද්ගල මූල්‍ය කළමනාකරණයේ මූලිකාංග (ඉතිරිකිරීම්, ආයෝජන, අයවැයකරණය, රක්ෂණය යනාදී...) උගනී. කෙසේවෙතත් ඔවුන් පවා මෙකී සංකල්ප තම ජීවිතයේ ප්‍රයෝගිකව යොදා නොගනී.

පුද්ගල මූල්‍ය කළමනාකරණය යනු වත්මන් සමාජයට ඉතා වැදගත් කරුණකි. වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වයත් සමඟ පුද්ගලයින් හට තම ජීවන රටාව පවත්වා ගැනීම ඉතා අසීරු කරුණක් වී ඇත. විශේෂයින්ම, අඩු ආදායම්ලාභීන් මෙන්ම, මධ්‍යම පාන්තිකයින්ද මූල්‍යමය වශයෙන් බොහොමයක් අසීරුතා වලට මුහුණ දී සිටී. එබැවින් නුදුරු අනාගතයේදී තමන් තනිව උපයා ගත් ධනය කළමනාකරණය කිරීමට පුද්ගල මූල්‍ය කළමනාකරණයේ පියවරයන් හඳුනා ගැනීම ඔබට වඩාත් වැදගත් වේයැයි සිතමි.

### 1. ඔබගේ වර්තමාන මූල්‍ය තත්ත්වය තීරණය කරන්න.

මාසික ආදායම් වියදම් ලැයිස්තුවක් පිළියෙල කිරීම තුළින් ඔබගේ වර්තමාන මූල්‍ය තත්ත්වය පහසුවෙන් ඇගයීමට ලක් කළ හැක. මෙමගින් තමන්ට මුදල් ලැබෙන්නේ කොහෙන්ද? එම මුදල් වැය වන්නේ මොනවාටද? යන්න අවබෝධ කර ගත හැකි වේ. ඔබගේ වර්තමාන මූල්‍ය තත්ත්වය වටහා ගැනීම ඔබව වියදම් පාලනය කිරීමට පොළඹවයි. ඔබගේ ආදායම් වියදම් ලැයිස්තුව දෙස බැලූ විට ඔබගේ වියදම් ආදායම් ඉක්මවා ඇති බව පෙනේ නම් ඔබට ඔබගේ වියදම් විශ්ලේෂණය කර අනවශ්‍ය වියදම් කපා හැරීමටත් අත්‍යාවශ්‍ය වියදම් පාලනය කිරීමටත් සැලැස්මක් ගොඩනගා ගත හැකිය. මේ සඳහා ඔබට පුද්ගලික මූල්‍ය මෘදුකාංග හෝ ජංගම දුරකතන යෙදවුම් භාවිතා කළ හැක.

### 2. ඔබගේ පවුලේ මූල්‍ය අරමුණු පිහිටුවා ගන්න.

මෙහිදී පවුලේ සියලුදෙනාගේම අවශ්‍යතා සහ වුවමනා සැලකිල්ලට ගෙන ස්මාර්ට් ඉලක්කයන් පිහිටුවා ගත යුතුය. එසේනම් ඔබ පිහිටුවා ගන්නා ඉලක්ක සරල, මැනිය හැකි, ළඟා කර ගත හැකි, අදාළ සහ කාලානුරූපී ඒවා විය යුතුය. තවද මෙම ඉලක්කයන්,

- කෙටිකාලීන (වසරක් හෝ ඊට අඩු)
- මධ්‍යකාලීන (වසරකට වැඩි වසර පහකට අඩු) හෝ
- දීර්ඝකාලීන (වසර පහ ඉක්මවූ) ලෙස පෙළගස්වා ගත හැක.

උදාහරණයක් ලෙස,
ඔබට තව වසර පහකින් මෝටර් රථයක් මිලට ගැනීමට අවශ්‍යනම් එකී ඉලක්කයන් දැන්ම පිහිටුවා ඒ වෙනුවෙන් වැඩ කිරීම, මූල්‍ය සම්පාදනය කිරීමේ සැලසුම් ස්ථාපිත කිරීම අදම ඇරඹිය යුතුය. දිගුකාලීන ඉලක්කයක් ලෙස තමන්ගේ විශ්‍රාම ජීවිතය සැපවත්ව ගෙවීම සඳහා වූ අරමුදලක් දැන් සිටම පවත්වාගෙන යාම දැක්විය හැක.

## 3. අයවැයක් සාදා ගන්න.

ඔබගේ ආදායම් වලින් වියදම් පියවා ගන්නා ආකාරය පිළිබඳව අයවැයක් පිළියෙල කිරීමේදී ඔබට සිතීමට සිදු වේ. එහිදී ඔබ උපයන ආදායම් වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවේනම් අමතර ආදායම් ඉපයීමට හෝ පවතින ජීවන රටාවේ වෙනස්කම් තුළින් වියදම් පාලනය කිරීමට ඔබට සිදු වේ. මෙය වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වය තුළ පීඩාකාරී ජීවිත ගත කරන්නන් හට ගත හැකි සුදුසුම පියවරකි. මෙහිදී කාලයත් සමග මිල ඉහළ යන බැවින් ඒ සඳහා වෙන් කිරීමක් කළ යුතු වේ. ඔබගේ ප්‍රාථමික ආදායම් මාර්ගයෙන් ප්‍රමාණවත් මුදලක් උපයා ගත නොහැකිනම් මෙවන් යුගයක ඔබට නිසැකවම අසීරුතා රාශියකට මුහුණ පෑමට සිදු වේ. එබැවින් විවිධ අර්ධකාලීන රැකියා අවස්ථා, නිවිස් පදනම් කරගත් ව්‍යාපෘති ඔස්සේ අමතර ආදායම් ඉපයීමට කටයුතු කරන්න. දවසේ සෑම මොහොතක්ම ඵලදායීව ගත කරන්න. ගෙවතු වගා වල නියැලෙන්න. ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලෙස ඔබත් ඔබගේ දෙමව්පියන් හට මේ සඳහා සහාය වන්න.

## 4. කාලීන ප්‍රගති සමාලෝචනය තුළින් සැලසුම යාවත්කාලීන කරන්න.

ඔබ වයසට යත්ම ඔබගේ මූල්‍ය අරමුණු සහ අවශ්‍යතා වෙනස් වන බැවින් සෑම වසර අවසානයකදීම ඔබගේ මූල්‍ය සැලසුම යාවත්කාලීන කරන්න. ස්වාධීන පුද්ගලයෙක් ලෙස මුදල් ඉපැයීමට යොමුවත්ම ඔබගේ අවශ්‍යතා සහ වුවමනා කාලයත් සමග වෙනස් වේ. තවද ඔබ ආරම්භයේ පිහිටුවාගත් මූල්‍ය ඉලක්කයන්ද වෙනස් වේ. ඒ අනුව ඔබගේ මූල්‍ය සැලැස්ම කාලීනව සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීමට වග බලා ගන්න.

මෙකී පුද්ගල කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රායෝගික භාවිතය තුළින් ඔබට ජීවිතයේ මුල් අවධියේම මූල්‍ය ස්වාධීනත්වය ළඟා කර ගත හැකි වේ. (මූල්‍ය ස්වාධීනත්වය යනු රැකියාවක නියැළීමෙන් හෝ අන් අය මත යැපීමෙන් තොරව තම ජීවිත කාලය පුරාවට තම ජීවන වියදම් ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් හෝ ධනයක් තිබීමයි).

Rich Dad Poor Dad කෘතියට අනුව රොබර්ට් කියෝශාකිගේ ධනවත් පියා ඔහුගේ තරුණ වියේදී ඔහුට ධනවත් වීම සම්බන්ධයෙන් වඩාත් වෙනස් උපදෙසක් ලබා දුනි. ඒ අනුව ධනවත් පියා ඔහුට පැවසුවේ 'පාසල් යන්න, උපාධිධාරියෙක් වෙන්න, තමන්ගේම ව්‍යාපාරයක් බිහි කරන්න, තාර්කික ආයෝජකයෙක් වන්න'. ඔහු කියෝශාකිට නිර්දේශ කළ ජීවන මාර්ගය පහත පරිදියි.




After School, Earning and Spending

After School, do Business and Invest Money

මෙම ලිපිය වඩාත් යෝග්‍ය වන්නේ ඉහත දක්වා ඇති රූපයේ වම් පස සිට දකුණු පසට වෙනස් වීමට සූදානම් පුද්ගලයින් සඳහා ය. විශේෂයෙන්ම දැනට E සහ S කාණ්ඩයේ සිටින සහ B හෝ I කාණ්ඩයට යාමට අදහස් කරන පුද්ගලයින් සඳහායි. එනම් රැකියා සුරක්ෂිතභාවයෙන් ඔබ්බට ගොස් මූල්‍ය ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමට පටන් ගැනීමට සූදානම් මිනිසුන් සඳහා ය. එය පහසු ජීවන මාර්ගයක් නොවේ, නමුත් මාර්ගය අවසානයේ ඔබට මූල්‍ය ස්වාධීනත්වය ළඟා කර ගත හැකි වේ. ඔබට දකුණු පැත්තේ, B සහ I පැත්තේ ක්‍රියා කිරීමට අවශ්‍ය නම් ඔබ වඩාත් දක්ෂයෙකු විය යුතුයි.

තරුණ වියේ පසුවන ඔබ සියලුදෙනා සිහින මවාගෙන ඇත්තේ E සහ S කාණ්ඩයේ ජීවන රටාවකට හුරු වීමටය. අවාසනාවට, අපේ පාසල් වුවද තවමත් කාර්මික යුගය පදනම් කරගනිමින් අපගේ සිසුන් සූදානම් කරන්නේ වම් පැත්තට පමණි. නමුදු, අප අද සිටින්නේ වෙන කවරදාකටවත් වඩා අවස්ථා ජනනය කරන, තොරතුරු මත පදනම් වූ ඩිජිටල්කරණ යුගයකයි. එබැවින්, තරුණ වියේ පසුවන ඔබ සැමට තවකෙකු යටතේ වැඩ කර ඔහුව පොහොසත් කරනවා විනා, තමන්ගේම ව්‍යාපාරයක් බිහිකර ගැනීමට කටයුතු කළ හැකිනම්, එය ඔබව ඉතා පහසුවෙන් කියෝශාකිගේ ධනවත් පියා සඳහන් කළ පරිදි ඉහත චතුරස්‍රයේ වම් පස සිට දකුණු පසට තල්ලු කරයි. අප බහුතරයක් දෙනා මෙහි ඇති වටිනාකම පැහැදිලිව අවබෝධ කරගෙන, ඒ වෙනුවෙන් වැඩ කරන්නේනම්, පුද්ගල මූල්‍ය යහපැවැත්මෙන් ඔබ්බට ගොස් සමස්තයක් ලෙස මුළු රටේම මූල්‍ය යහපැවැත්ම ගොඩනැංවිය හැකි වනු නොඅනුමානය.



කථිකාචාර්ය ධනුෂ්කා පියනන්ද
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# විදේශ වෙළඳාමට පදනම් වන නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි න්‍යායන්හි මූලික කරුණු ආවර්ජනය කරමු

උසස් පෙළ ආර්ථික විද්‍යාව පළමු සහ දෙවන ප්‍රශ්න පත්‍ර වලදී විදේශ වෙළඳාම පදනම් වන නිරපේක්ෂ වාසි න්‍යාය හා සාපේක්ෂ වාසි න්‍යාය පිලිබඳ දැනුම මනිනු ලැබේ. එම මාතෘකා පිලිබඳ අවබෝධයක් ලබා දීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණයි.

ප්‍රථමයෙන්, විදේශ වෙළඳාම කුමක්ද යන්න අවබෝධ කරගනිමු. විදේශ වෙළඳාම හෙවත් අන්තර්ජාතික වෙළඳාම යනු, යම් රටක් ලොව තවත් රටක් හෝ රටවල් කිහිපයක් හෝ සමඟ භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීමයි. අන්තර්ජාතික වෙළඳාම මූලික වශයෙන් අපනයන වෙළඳාම හා ආනයන වෙළඳාම ලෙස වර්ග කල හැකිය.

යම් කිසි රටක් ජාත්‍යන්තර වෙළඳාමේ නිරතවීමට අදාලවන ප්‍රධාන න්‍යායන් දෙකක් වනුයේ,

01 නිරපේක්ෂ වාසි න්‍යාය

02 සාපේක්ෂ වාසි න්‍යාය

රටවල් ජාත්‍යන්තර වෙළඳාමේ යෙදීමට හේතු, වෙළඳාම හරහා ලැබෙන ප්‍රතිලාභ සහ වෙළඳාමේ දිශානතිය තේරුම් ගැනීමට මෙම න්‍යායන් උපකාරී වේ. එම නිසාවෙන් විභාග අපේක්ෂකයෙකු ලෙස ඔබට මෙම න්‍යායන් පිලිබඳ පැහැදිලි අවබෝධයක් තිබීම වැදගත් වනු ඇත.

## 01 නිරපේක්ෂ වාසි න්‍යාය

නිරපේක්ෂ වාසි න්‍යාය හඳුන්වා දී ඇත්තේ ආර්ථික විද්‍යාඥ ඇඩම් ස්මිත් (1776) විසිනි. මෙම න්‍යායට අනුව, යම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට හැකි නම්, එම රටට භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ වාසි පවතිනු ඇත. එමෙන්ම මෙම න්‍යායට අනුව රටකට කිසියම් භාණ්ඩයක් අවම පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට හැකියාව නොමැති නම්, එම රටට භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ අවාසි පවතිනු ඇත. තවද, මෙම න්‍යායට අනුව රටකට යම් නිෂපාදනයක් සඳහා නිරපේක්ෂ වාසියක් ඇත්නම් එයට විශේෂීකරණය විය යුතු අතර එවැනි නිෂ්පාදන අතිරික්තයෙන් නිෂ්පාදනය කළ යුතු වේ. එම අතිරික්තය නිරපේක්ෂ අවාසි ඇති භාණ්ඩ සමඟ හුවමාරු කළ හැකිය.

නිරපේක්ෂ වාසි හට ගැනීමේ මූලාශ්‍ර මොනවාද?

- රටකට ඇති සම්පත් උරුමයන් (උදා: මැද පෙරදිග රටවල බොරතෙල් සම්පත්)
- යම් රටක නිෂ්පාදන සාධක සුලබතාවය (උදා: ඉන්දියාවේ ලාභදායි ශ්‍රමය)
- දේශගුණයේ සුවිශේෂත්වය (උදා: ශ්‍රී ලංකාවේ කඳුකරයේ වැවෙන තේ)

නිරපේක්ෂ න්‍යාය යටතේ අනුගමනය කල හැකි ප්‍රවේශයන් දෙකක් ඇත. එනම්, යෙදවුම් ප්‍රවේශය හා නිමවුම් ප්‍රවේශයයි. දැන් අපි ගණනය කිරීම් සමඟ මෙම ප්‍රවේශ දෙක ගණනය කිරීම සමඟ අවබෝධ කර ගනිමු.

### (i) යෙදවුම් ප්‍රවේශය

යෙදවුම් ප්‍රවේශයට අනුව, විදේශ වෙළඳාමේ යෙදෙන රටවල් දෙකකට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන්නේ එක් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් නිෂ්පාදනය කල හැකි භාණ්ඩ අපනයනය කරන්නේ නම් සහ වැඩි සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් ඔවුන් නිෂපාදනය කරන භාණ්ඩ ආනයනය කරන්නේ නම්ය.

උපකල්පිත උදාහරණයක් මගින් මෙය තේරුම් ගනිමු. ශ්‍රී ලංකාව හා ඇමරිකාව ජාත්‍යන්තර වෙළඳාමේ යෙදීසිටී. නිෂ්පාදන ඒකකයක් සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

| | ශ්‍රී ලංකාව | ඇමරිකාව |
|---|---|---|
| තිරිඟු | 12 | 8 |
| රෙදි | 4 | 7 |

මෙම උදාහරණයට අනුව ශ්‍රී ලංකාවට තිරිඟු කිලෝ එකක් නිපදවීමට ශ්‍රම ඒකක 12ක් අවශ්‍ය වන අතර, ඇමරිකාට තිරිඟු කිලෝ එකේ නිපදවීමට අවශ්‍ය වන්නේ ශ්‍රම ඒකක 8ක් පමණි. එබැවින් ඇමරිකාවට තිරිඟු නිපදවීමට නිරපේක්ෂ වාසිය ඇත.

ශ්‍රී ලංකාවට රෙදි මීටරයක් නිපදවීමට ශ්‍රම ඒකක 4ක් පමණක් අවශ්‍ය වන අතර, ඇමරිකාවට ශ්‍රමය එක්ක 7ක් අවශ්‍ය වේ, එබැවින් ශ්‍රී ලංකාවට රෙදි නිපදවීමට නිරපේක්ෂ වාසිය ඇත. නිරපේක්ෂ න්‍යායට අනුව දෙරටටම වාසි ලබා ගැනීමට නම් ශ්‍රී ලංකාව රෙදි නිෂ්පාදනයට විශේෂීකරණය කොට එහි අතිරික්තය ඇමරිකාවට අපනයනය කළ යුතු අතර ඇමෙරිකාව තිරිඟු නිෂ්පාදනයට විශේෂීකරණය කොට එහි අතිරික්තය ශ්‍රී ලංකාවට අපනයනය කළ යුතුය.

### (ii) නිමැවුම් ප්‍රවේශය

නිමැවුම් ප්‍රවේශයට අනුව විදේශ වෙළඳාමේ යෙදෙන රටවල් දෙකකට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන්නේ එක් රටක් තවත් රටකට සාපේක්ෂව යෙදවුම් ඒකකයකින් ලබාගන්නා නිමැවුම් ඒකක ප්‍රමාණය වැඩි නම්, එම භාණ්ඩය අපනයනය කිරීමෙන් ද, යෙදවුම් ඒකකයකින් ලබාගත හැකි නිමවූම් ඒකක ප්‍රමාණය අඩු වේ නම් එම භාණ්ඩය ආනයනය කිරීමෙන් ද වේ.

ඉහත සාකච්ඡාකල උපකල්පිත උදාහරණය නැවත සලකා බලමු. ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

| | ශ්‍රී ලංකාව | ඇමරිකාව |
|---|---|---|
| තිරිඟු | (1/12) = 0.08 | (1/8) = 0.13 |
| රෙදි | (1/4) = 0.25 | (1/7) = 0.14 |

මෙම උදාහරණයට අනුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකිවනුයේ තිරිඟු කිලෝ 0.08ක් වන අතර, ඇමරිකාවට ශ්‍රම ඒකකයකින් තිරිඟු කිලෝ 0.13ක් නිපදවිය හැක. එබැවින් ඇමරිකාවට තිරිඟු නිපදවීමේ නිරපේක්ෂ වාසිය ඇත.

ශ්‍රී ලංකාවට ශ්‍රම ඒකකයකින් රෙදි මීටර් 0.25ක් නිපදවිය හැකි අතර ඇමරිකාවට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකිවනුයේ රෙදි මීටර් 0.14ක් පමණි. එබැවින් ශ්‍රී ලංකාවට රෙදි නිපදවීමේ නිරපේක්ෂ වාසිය ඇත. එහෙයින් නිමවුම් ප්‍රවේශය මඟින්ද පෙනී යන්නේ ශ්‍රී ලංකාවට හා ඇමරිකාවට වෙළඳාමෙන් වාසි ලබාගැනීමට ශ්‍රී ලංකාව රෙදි අපනයනය කළ යුතු අතර ඇමරිකාව තිරිඟු අපනයනය කළ යුතු බවයි.

නිරපේක්ෂ වාසි න්‍යයයේ ප්‍රධානතම ගැටලුව වන්නේ එක් රටකට භාණ්ඩ දෙවර්ගයටම නිරපේක්ශ වාසි හිමිවන විට, අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක වෙළඳාමක් සිදුවිය නොහැකි වීමයි.

### 02 සාපේක්ෂ වාසි න්‍යාය

ඉහත සඳහන් නිරපේක්ෂ වාසි න්‍යායයේ අවාසිය මගහරවා ගැනීම සඳහා ඩේවිඩ් රිකාඩෝ (1817) සාපේක්ශ වාසි න්‍යාය හඳුන්වාදෙන ලදී. එයට අනුව, යම් රටකට යම් භාණ්ඩයක් සඳහා නිරපේක්ෂ වාසි හිමි නොවූවද විදේශ වෙළඳාමෙන් වාසි ලබාගත හැකිය. සාපේක්ෂ වාසි න්‍යායට අනුව යම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට හැකිනම් එම රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතිනු ඇත. එවන් රටක් එම සාපේක්ෂ වාසි හිමි භාණ්ඩය නිෂ්පාදනය විශේෂීකරණය කොට, නිෂ්පාදන අතිරික්තය අපනයනය කළ යුතු වේ.

සාපේක්ෂ න්‍යාය යටතේ ද අනුගමනය කළ හැකි ප්‍රවේශයන් නිමවුම් ප්‍රවේශය හා යෙදවුම් ප්‍රවේශය ලෙස වෙන් කල හැකිය.

### (i) නිමැවුම් ප්‍රවේශය

නිමැවුම් ප්‍රවේශයට අනුව යෙදවුම් ඒකකයකින් ලබාගන්නා නිමවුම් ඒකක ප්‍රමාණය මත පදනම්ව, වෙළඳාමට සම්බන්ධ රටවල් දෙකෙහි භාණ්ඩ දෙවර්ගයට අදාල ආවස්ථික පිරිවැයද සැලකිල්ලට ගෙන සාපේක්ෂ වාසි ලබාගතහැකි අයුරු පෙන්වාදෙනු ලබයි.

උපකල්පිත උදාහරණයක් මගින් මෙම ප්‍රවේශයන් තේරුම් ගනිමු. ඉන්දියාව හා ප්‍රංශයට අදාළ රෙදි හා වයින් ශ්‍රම ඒකක නිමවුම් පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

| | ඉන්දියාව | ප්‍රංශය |
|---|---|---|
| රෙදි | 30 | 5 |
| වයින් | 15 | 10 |

සාපේක්ෂ වාසි න්‍යායයේදී ආවස්ථික පිරිවැය සලකාබලන හෙයින්, ප්‍රථමයෙන්, ආවස්ථික පිරිවැය ගණනය කළ යුතුය.

| | ඉන්දියාව | ප්‍රංශය |
|---|---|---|
| රෙදි | 30 | 5 |
| රෙදි ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | (15/30) = 0.5 (වයින් ලීටර්) | (10/5) = 2 (වයින් ලීටර්) |
| වයින් | 15 | 10 |
| වයින් ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | (30/15) = 2 (රෙදි මීටර්) | (5/10) = 0.5 (රෙදි මීටර්) |

මෙම උදාහරණයට අනුව, ඉන්දියාවට රෙදි මීටරයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය වයින් ලීටර් 0.5ක් වේ. එහෙත් ප්‍රංශයට ඒම අගය 2 කි. එම නිසා රෙදි නිශ්පාදනයේ සාපේක්ෂ වාසිය ඉන්දියාවට හිමිවේ.

ප්‍රංශයේ වයින් ලීටරයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය රෙදි මීටර් 0.5 ක් වේ. එහෙත් ඉන්දියාවේ එම අගය 2 කි. එම නිසා වයින් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ප්‍රංශයට හිමිවේ.

එමගින්, මෙම ගණනයෙන් පැහැදිලි වන්නේ ඉන්දියාව අඩු ආවස්ථික පිරිවැයක් දරන රෙදි නිෂ්පාදනය විශේෂීකරණය කොට, අතිරික්තය ප්‍රංශයට අපනයනය කළ යුතු අතර, ප්‍රංශය අඩු ආවස්ථික පිරිවයක් දරන වයින් නිෂ්පාදනය විශේෂීකරණය කොට, අතිරික්තය ඉන්දියාවට අපනයනය කළ යුතු බවය.

## (ii) යෙදවුම් ප්‍රවේශය

මෙම ප්‍රවේශයට අනුව, රටක භාණ්ඩයක් නිපදවීම සඳහා අවශ්‍යවන යෙදවුම් ඒකක ප්‍රමාණය දන්නාවිට, ආවස්ථික පිරිවැය යොදාගනිමින් සාපේක්ෂ වාසි ගණනය කළහැකිය.
මෙය වඩාත් පැහැදිලි කර ගැනීමට පහත සඳහන් උපකල්පිත උදාහරණය සලකා බලමු. නිමවුම් ඒකකයක් නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය පහත දක්වා ඇත.

| | චීනය | ජපානය |
|---|---|---|
| ජංගම දුරකථන | 8 | 12 |
| මෝටර් රථ | 20 | 24 |

මෙහිදී ප්‍රධාන පියවර දෙකක් අනුගමනය කල යුතුය.

**පියවර 1:**

දී ඇති තොරතුරු භාවිතා කරමින් යෙදවුම් ඒකකයකින් බිහිකළ හැකි නිමවුම් ප්‍රමාණය පහත දැක්වෙන ලෙස පරිවර්තනය කළ යුතුය.

| | චීනය | ජපානය |
|---|---|---|
| ජංගම දුරකථන (ඒකක) | 1/8 | 1/12 |
| මෝටර් රථ (ඒකක) | 1/20 | 1/24 |

**පියවර 2:**

ඉහත පළමු පියවරෙන් ගණනය කල අගයන් භාවිතා කරමින්, ආවස්ථික පිරිවැය ගණනය කළ යුතුය.

| | චීනය | ජපානය |
|---|---|---|
| ජංගම දුරකථන (ඒකක) | 1/8 | 12 |
| ජංගම දුරකථනයක් නිපදවීමේ ආවාස්ථික පිරිවැය | (1/20) ÷ (1/8) = 0.4 (මෝටර් රථ ඒකක) | (1/24) ÷ (1/12) = 0.5 (මෝටර් රථ ඒකක) |
| මෝටර් රථ (ඒකක) | 1/20 | 1/24 |
| මෝටර් රථයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | (1/8) ÷ (1/20) = 2.5 (ජංගම දුරකථන ඒකක) | (1/12) ÷ (1/24) = 2 (ජංගම දුරකථන ඒකක) |

මෙම උදාහරණයට අනුව චීනයට ජංගම දුරකථන නිපදවීමටත් ජපානයට මෝටර් රථ නිපදවීමටත් සාපේක්ෂ වාසි හිමි කරගනී. මෙම ගණනයෙන් පැහැදිලි වන්නේ චීනය අඩු ආවස්ථික පිරිවැයක් දරන ජංගම දුරකථන නිෂ්පාදනය විශේෂීකරණය කොට, අතිරික්තය ජපානයට අපනයනය කළ යුතු අතර, ජපානය අඩු ආවස්ථික පිරිවැයක් දරන මෝටර් රථ නිෂ්පාදනය විශේෂීකරණය කොට, අතිරික්තය චීනයට අපනයනය කළ යුතු බවයි.

මෙලෙස මෙම නිරපේක්ෂ හා සාපේක්ෂ න්‍යායන්හි මූලික කරුණු විමසීමෙන් පසු, එම න්‍යායන්හි වෙනස්කම් ද විමසුමට ලක්කර ගනිමු.

| | නිරපේක්ෂ වාසි න්‍යාය | සාපේක්ෂ වාසි න්‍යාය |
|---|---|---|
| අර්ථය | යම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට හැකි නම් නිරපේක්ෂ වාසි පවතී | යම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට හැකිනම් එම රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතී |
| හඳුන්වා දී ඇත්තේ | ඇඩම් ස්මිත් (1776) | ඩේවිඩ් රිකාඩෝ (1817) |
| සංසන්දනය කරන්නේ | ජාතීන්ගේ ඵලදායිතාව | ආවස්ථික පිරිවැය |
| සලකා බලන පිරිවැය | භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ පිරිවැය | භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය |
| වාසිදායක වන්නේ | වෙළඳාම අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක නොවේ. නිරපේක්ෂ වාසියක් සහිතව රටට ප්‍රතිලාභ ලැබේ | වෙළඳාම අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වන අතර රටවල් දෙකටම වාසි හිමි වේ |

මෙම ලිපියෙන් විදේශ වෙළඳාමට පදනම් වන නිරපේක්ෂ වාසි න්‍යාය සහ සාපේක්ෂ වාසි න්‍යායන්හි මූලික කරුණු ඔබට පහසු ලෙස ආවරණය වූවායයි සිතමි. අවසාන වශයෙන් ඔබ සියලු දෙනාට එම කොටස් වාර කීපයක් අධ්‍යනය කිරීම හදාරා තව දුරටත් තේරුම් ගත හැකිය. එමෙන්ම, උසස් පෙළ විභාගයට සාර්ථකව මුහුණ දීමට හැකිවේවායි ප්‍රර්ථනා කරමි!



සුභානි තෙන්නකෝන් මිය
කථිකාචාර්ය (සහකාර)
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# ඔබ සිද්ධි අධ්‍යයනය ගැටලු සඳහා නිවැරදිව මුහුණ දිය යුත්තේ කෙසේද?

ඔබ මෙන්ම මමත් 2017 වසරේ වාණිජ විෂය ධාරාව යටතේ (ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය සහ ව්‍යාපාර සංඛ්‍යානය) උසස් පෙළ විභාගයට පෙනී සිට මූල්‍ය ඉංජිනේරුකරණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට කැලණිය විශ්වවිද්‍යාලයට තේරී පත් වුනෙමි. කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධ්‍යයනාංශයේ වසර හතරක උපාධි පළපුරුද්ද මට ඇති අතර, සිද්ධි අධ්‍යයනය සම්බන්ධ ප්‍රශ්නවලට මුහුණ දෙන ආකාරය පිළිබඳ මගේම ප්‍රධාන ඉගෙනුම් ක්‍රම කිහිපයක් බෙදා ගැනීමට මෙය ඇත්තෙන්ම හොඳ අවස්ථාවක් කර ගනිමි.

**ඔබ මූලික විෂය කරුණු දැනගැනීම වැදගත් වේ.**

ඕනෑම පිළිතුරක් සඳහා පදනම වන්නේ විෂයයේ මූලික කරුණු දැන ගැනීමයි. උසස් පෙළ විභාග වලදී පමණක් නොව, වෘත්තීය සුදුසුකම් සිද්ධි අධ්‍යයනය, විශ්වවිද්‍යාල සිද්ධි අධ්‍යයනය සහ ප්‍රායෝගිකව පවා සිද්ධි අධ්‍යයනය මූලික කරුණු මත සකස් වනු මම දැක ඇත්තෙමි. ඔබට අදාළ විෂය කොටස සාර්ථකව හඳුනා ගැනීමට හැකි නම්, ඔබට හොඳ පිළිතුරක් ලිවිය හැකිය. උසස් පෙළ ශිෂ්‍යයෙකු ලෙස මා තුළ පවා තිබූ තවත් වැරදි මතයක් වන්නේ අපගේ පිළිතුර සංකීර්ණ වන තරමට අපට ලකුණු ලබා ගත හැකි බවයි. නමුත් එය සත්‍යයක් නොවේ. අප අපගේ පිළිතුර වඩාත් සංකීර්ණ කරන තරමට එය පරීක්ෂකයා හෝ පාඨකයා ව්‍යාකූල කරයි. තවද ඔබට වැඩි ලකුණු සඳහා පරීක්ෂකවරයා හෝ පාඨකයා විශ්මයට පත් කළ හැකි යැයි කිසිවිටෙක නොසිතන්න. ඔවුන් හොඳින් පළපුරුදු, උගත් අය වන අතර ඔබ පිළිතුරු පත්‍රය පුරවන්නේ ඒ සඳහා කරුණු සහිතව දැයි පහසුවෙන් දැනගත හැකිය. එමනිසා  සංකීර්ණ වීමට උත්සාහ කිරීම මගින් සිදුවන්නේ නිකරුණේ ඔබේ වටිනා කාලය වැය වීමකි. එමනිසා, ඔබට කිසියම් පාඩමක් සහ සංකල්පයක් ගැන විශ්වාසයක් හෝ මතකය අඩුයි නම්, ඒවා නැවත නැවතත් බැලීමට ඔබම හුරුපුරුදු වන්න. මූලික කරුණු පිළිබඳ හොඳ අවබෝධයක් ඇති විට ඉගෙනගැනීම ඇත්තෙන්ම පහසු සහ වේගවත් බව මට වැටහී ඇත.

**ඔබේ විභාග කාලය කළමනාකරණය කරගන්න.**

මා කලින් සඳහන් කළ පරිදි, සිද්ධි අධ්‍යයනය ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී කාලය ප්‍රමාණවත් නොවීම සිදුවිය හැකිය.

අපිට ලැබී තිබෙන කාලයට යටත්ව විභාගය නිම කිරීම කළයුතු බැවින් විභාගය සඳහා කාල සැලැස්මක් තිබීම වැදගත්ය. වර්තමානයේ වුවද, මම විභාගවලදී එක් ප්‍රශ්නයකට පමණක් මගේ කාලය වැය නොකරමි. නිදසුනක් වශයෙන්, ප්‍රශ්න හතරක් සහ පැය දෙකක් සහිත ප්‍රශ්න පත්‍රයක් සඳහා, මම එක් ප්‍රශ්නයකට පැය භාගයකට වඩා වැඩි කාලයක් ගත කළහොත් මම ලිවීම නවතා ඊළඟ ප්‍රශ්නයට යන්නෙමි. කාලය ඉතිරි  නම්, මම සියලු ප්‍රශ්න උත්සාහ කිරීමෙන් පසු නැවත එම මඟහැරුණු ප්‍රශ්නය සම්පූර්ණ කරමි. ඔබම සිතා බලන්න, එකම ප්‍රශ්නයේ දිගු වේලාවක් රැඳී නොසිට, සියලුම ප්‍රශ්න අවම වශයෙන් එක් වරක් හෝ උත්සාහ කිරීමෙන් ඔබට වඩා හොඳ ලකුණු ලබා ගත නොහැකිද? ඔබ නොදන්නා හෝ වැඩි කාලයක් ගත වන ප්‍රශ්නය කුමක් වුවත්, එය අත්හැර ඊළඟ ප්‍රශ්නයට යෑම ඔබම තීරණය කළ යුතුය. සිද්ධි අධ්‍යයනය ප්‍රශ්නවලට හෝ ඕනෑම විභාගයකට පිළිතුරු සැපයීම මනසින්, උපායමාර්ගිකව කළ යුතු ක්‍රීඩාවකි. ඔබට ගැලපෙන සැලැස්මක් සමඟ විභාග ශාලාවට ඇතුලු වී තත්ත්වයට අනුව තීරණ ගත යුතුය.

**කියවන්න, සවන් දෙන්න, නරඹන්න සහ අනුගත කර කරන්න.**

මම ඔබ සැමට ඇත්තම කියනවානම්, මගේ උසස් පෙළ කාලයේදි දිනපතා ප්‍රවෘත්ති, පොත්පත් සහ වාර්තා කියවීමට රුචියක් නොදැක්වූවෙමි. කෙසේ වෙතත්, එමගින් ලැබෙන ප්‍රතිලාභය දැන් මට වැටහෙනවා. සිද්ධි අධ්‍යයනය ප්‍රශ්නත් සැබෑ ලෝකයේ සිදුවීම් වැනිය. ඒ හා සමානව, ඔබ ප්‍රායෝගික හා යථාර්ථවාදී ආකාරයකින් පිළිතුරු දිය යුතුය. ඔබ කියවන විට, වීඩියෝ නරඹන විට, කතාවලට සවන් දෙන විට, ඔබේ පිළිතුර ස්වභාවිකවම පැකිළීමකින් තොරව ඔබ වෙත ගලා එන බව ඔබට වැටහෙනු ඇත. එමගින් පරීක්ෂකවරයාගෙන් හෝ පාඨකයාගෙන් යම්කිසි වාසියක් ලබා ගැනීමට හැකි වන අතර, ඔබ ප්‍රායෝගික හා අද්විතීය ආකාරයකින්, රාමුවෙන් පිටත සිතන බව ඔවුන්ට දැනේ, නමුත් මෙය මම මගේ උසස් පෙළ කාලය තුළ නොකළ දෙයක් වන අතර එය විශ්වවිද්‍යාලයට ද ප්‍රයෝජනවත් වන බැවින් දැන් ආරම්භ කරන ලෙස මම තරුණ ඔබට තරයේ අවවාද කරමි. ඔබත් අපේ විශ්වවිද්‍යාලයේ කොටසක් වී මූල්‍ය උපාධියක් හදාරන දිනක, සිද්ධි අධ්‍යයනයන් ජයගෙන ව්‍යාපාරික ලෝකයේ සැරිසැරීම කොතරම් පහසුදැයි ඔබට වැටහෙනු ඇත.

ඔබ මෙම ක්‍රමය අනුගමනය කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, විශ්වාසදායක පුවත් ප්‍රකාශකයින් සහ යාවත්කාලීන පුවත් වෙතම පමණක් ඔබගේ අවධානය යොමු කරන ලෙසට මම ඔබට යෝජනා කරමි.

අන්තර්ජාලය යනු, තොරතුරු සහ නිමක් නැති ඉගෙනුම් විශ්වයකි. එබැවින්, එයින් උපරිම ප්‍රයෝජන ගෙන ඔබට නිතර පිවිසීමට, කියවීමට, සවන් දීමට හෝ නැරඹීමට හැකි සරල මූලාශ්‍ර කිහිපයක් තෝරන්න. ඔබ දැනටමත් මෙය අනුගමනය කරන්නේ නම්, දිගටම වැඩි දියුණු කරන්න! ඔබ යම් ක්ෂේත්‍රයක් ගැන උනන්දුවක් දක්වන්නේ නම්, ඒ සම්බන්ධ දේශීය සහ විදේශීය විශේෂඥයින්ගේ ලිපි හෝ වෙනත් තොරතුරු අඩංගු විශ්වාසදායී මාර්ග අනුගමනය කරන්න.

**සතතාභ්‍යාසය ඔබගේ දියුණුව සහ පළපුරුද්ද ඇති කරයි.**

සිද්ධි අධ්‍යයනයට පිළිතුරු සැපයීමේදී ලිවීමේ විලාශය ඉතා වැදගත් වේ. පිළිතුරක් සකස් කරන්නේ කෙසේද, තොරතුරු ගලා යාම සහ ඔබේ පිළිතුරේ කුමක් ඇතුළත් කළ යුතුද යන්න, ඇතුළත් නොකළ යුතුද යන්න විභාගය අතරතුර තීරණය කළ නොහැක. ඔබේ විභාගය සඳහා සූදානම් වන විට ඔබට උත්සාහ කළ හැකි පසුගිය ප්‍රශ්න පත්‍ර, ආදර්ශ ප්‍රශ්න සහ පුහුණු ප්‍රශ්න ඕනෑ තරම් තිබේ. ඔබ එම ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු ලිවීමේදී, මා කලින් පැහැදිලි කළ ආකාරයටම කාලය කළමනාකරණය කිරීමට අමතක නොකරන්න. මගේ උසස් පෙළ විභාගය සඳහා මා සූදානම් වීමේදී මම නිතරම කල්පනා කළේ, පන්තියේ හොඳම සිසුන් ලෙසටම මා පාඩම් වැඩ කළද ඔවුන් මට වඩා විභාග සඳහා ලකුණු ලබා ගත්තේ කෙසේදැයි කියාය. නමුත් වාර විභාග සඳහා ඔවුන්ගේ පිළිතුරු කියවා පිළිතුරු පුහුණු වන විට මගේ ලිවීමේ විලාශය වෙනස් කර දියුණු කර ගැනීමට මට හැකි විය. ඔබ සිද්ධි අධ්‍යයනය ප්‍රශ්න සඳහා පුහුණු වන අතරතුර අන් අයගේ පිළිතුරු කියවීමට, ඔබේ මිතුරන් සහ ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීමට සැමවිටම විවෘතව සිටින්න. ඔබේ පිළිතුර ගුරුවරයෙකුට හෝ ජ්‍යෙෂ්ඨයෙකුට ඉදිරිපත් කර ප්‍රතිචාර හා අඩුපාඩු දැන ගැනීමට අමතක නොකරන්න. දවස අවසානයේදී, ඔබේ ප්‍රතිඵලය රඳා පවතින්නේ ඔබේ පිළිතුර ගැන ඔබට දැනෙන විශ්වාසය මත නොවේ. එය පරීක්ෂකයා හෝ පාඨකයා මත රඳා පවතී. මේ අනුව, ඔබ විභාගයට පෙර සිද්ධි අධ්‍යයනය පිළිතුරු සඳහා ප්‍රමාණවත් තරම් උපදෙස් ලබා ගන්න, එම අදහස් ලබාගෙන ඔබ දියුණු වන්න.

මේ වන විට ඔබ ඔබේ අධ්‍යයන රටාව තේරුම් ගෙන තිබිය යුතුය. මම ඉගෙනීම් කටයුතු පහසු කර ගැනීමට මුල සිටම කෙටි සටහන් තැබූ අයෙක්මි. ඔබේ පුහුණු පිළිතුරු ලියන විටද ඒ ගැන කෙටි සටහනක් තැබීමට පුරුදු වන්න. එය ඔබට පහසුවක් වනු ඇත. පිළිතුරු ලිවීමට පෙර එම ප්‍රශ්නය සඳහා සඳහා ඔබ ආවරණය කළ යුතු කරුණු සටහන් කර ගන්න. මම පන්තියේ සිටි දක්ෂම පුද්ගලයා නොවෙමි, නමුත් මා කළ සියලු පුහුණුවීම්, මගේ උසස් පෙළ විභාගවලින් විශිෂ්ට ප්‍රතිඵලයක් ලබාගැනීමට මට උපකාර කළ බව මම විශ්වාස කරමි.

උසස් පෙළ හා විශ්වවිද්‍යාල කාලය තුළ මා සැම විටම අනුගමනය කළ පිළිවෙත් මේවාය. නිසැකවම, ඔබට මීට පෙර මෙවැනි උපදෙස් ලැබී ඇත. ඊට හේතුව වන්නේ මෙම ක්‍රම මට මෙන්ම වෙනත් අයටත් සාර්ථක ප්‍රතිඵල අත්කර දුන් නිසා විය හැකිය. ඔබගේ සිද්ධි අධ්‍යයනය ප්‍රශ්නවලට මුහුණ දීමට උපකාරයක් ලෙස මගේ මෙම ඉගෙනීම් ක්‍රම භාවිතා කරන්න. ඔබේ ශක්තීන් සහ දුර්වලතා තේරුම් ගෙන ඒ අනුව සූදානම් වන්න.

ඔබගේ උසස් පෙළ විභාගය සඳහා මම ඔබට සුබ පතමි.



දිමානි සිල්වා
සිව්වන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# බහුවරණ ප්‍රශ්න පත්‍රයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද ?

තරඟකාරී විභාගයක් වන අ.පො.ස උසස් පෙළට පෙනී සිටින ඔබ සැමගේම අරමුණ වන්නේ ඉතාමත් හොඳින් විභාගයට මුහුණදී උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා විශ්ව විද්‍යාල වරම් ලබාගැනීමයි. මෙම අරමුණු සැබෑවක් කර ගැනීම සඳහා පන්නරයක් වීමට වෑයමක් ලෙස මෙම ලිපිය ඉදිරිපත් කරමි.

විභාගය හොඳින් සමත් වීම සඳහා කැපවීමෙන් අධ්‍යයන කටයුතු වලට යොමු වීම වගේම බුද්ධිමත්ව උපාය මාර්ග හා ශිල්ප ක්‍රම භාවිතා කිරීමද කළ යුතු වෙනවා. විභාගයට පෙර විෂය කරුණු ආවරණය කරගන්නා අතරම විභාගයට පිළිතුරු සපයන ආකාරය පිළිබඳ විශ්ලේෂණය කිරීම ඉතාමත් වැදගත්.

විභාගයට මුහුණ දීමට පෙර ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය විශ්ලේෂණය කිරීම කළ යුතුයි. අ.පො.ස උසස් පෙළ වාණිජ විෂය ධාරාවේ සියලුම විෂයයන් සඳහා ඔබට බහුවරණ හා ව්‍යුහගත රචනා ලෙස කොටස් දෙකකින් යුත් ප්‍රශ්න පත්‍රයකට මුහුණ දීමට සිදුවෙනවා. මෙම ලිපිය බහුවරණ ප්‍රශ්න පත්‍රයට උපාය මාර්ග හා ශිල්පීය ක්‍රම භාවිතා කර සාර්ථකව මුහුණ දිය හැකි ආකාරය පිළිබඳව අවබෝධයක් ලබාදීම උදෙසා පාදක කරගන්නවා.

**බහුවරණ ප්‍රශ්න පත්‍රය වැදගත් වන්නේ ඇයි?**

පළමු ප්‍රශ්න පත්‍රයට (බහුවරණ) පැය දෙකක කාලයකුත් දෙවන ප්‍රශ්න පත්‍රයට (ව්‍යුහගත රචනා) පැය තුනක කාලයකුත් වෙන් වූ නමුත් පළමු සහ දෙවන ප්‍රශ්න පත්‍ර වලට ලකුණු ලබා දීමේදී සමාන බර තැබීමක් සිදු කරනු ලබනවා. එහෙත් සිසුන් අධ්‍යයන කටයුතුවලදී වැඩි බර තැබීමක් සිදු කරන්නේ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයටයි.

සාපේක්ෂව ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයට වඩා පහසුවෙන් ලකුණු රැස් කරගත හැකි වීම, කෙටි ප්‍රශ්න පත්‍රය තුළ ප්‍රශ්න මෙන්න පිළිතුරු ද අඩංගු වන (නිශ්චිත පිළිතුරු ලිවීමේ කොටස හැර) අතර, එමගින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා විවිධ උපාය මාර්ග භාවිතා කළ හැකි වීම, වරණ පහකින් යුක්ත වීම නිසා නිවැරදි පිළිතුරක් තේරීමේ සම්භාවිතාව සියයට විස්සක් වැනි ඉහළ අගයක් ගැනීම, බොහෝවිට සමාන ලකුණු සංඛ්‍යාවක් සියලු ප්‍රශ්න වලට හිමි වීම නිසා බහුවරණ ප්‍රශ්න පත්‍රය තුළ ප්‍රශ්න වලට ලබා දෙන ලකුණු පිළිබඳ අවධානය දීමට අවශ්‍ය නොවීම සහ නිවැරදිව පිළිතුරු සපයන ප්‍රශ්න සංඛ්‍යාව ගැන පමණක් අවධානය යොමු කිරීමට හැකිවීම සහ බහුවරණ ප්‍රශ්න පත්‍රය සඳහා වැඩි ලකුණු රැස්කර ගන්නා සිසුන්ට පහසුවෙන් "A" සාමාර්ථය කට ළඟාවීමේ හැකියාව බහුවරණ ප්‍රශ්න පත්‍රය වැදගත්කම පෙන්වා දෙනවා.එම නිසා ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයට මෙන්ම බහුවරණ ප්‍රශ්න පත්‍රයට ද පූර්ව සූදානමක් සහ වැඩි අවධානයක් යොමු කළ යුතුයි.

බහුවරණ ප්‍රශ්න මූලිකව ආකාර දෙකකින් සමන්විත වෙනවා,

1. න්‍යායාත්මක කරුණු පාදක කොටගත් ප්‍රශ්න.
2. ගණනය කිරීම් කළ යුතු ප්‍රශ්න.

න්‍යායාත්මක කරුණු පාදක කොටගත් ප්‍රශ්න ආකාර කිහිපයකින් සමන්විතයි.

- වඩාත්ම නිවැරැදි පිළිතුර තේරීම.
- නොගැළපෙන පිළිතුර තේරීම.
- පිළිතුරු අනුපිළිවෙළට සැකසීම.
- නිවැරදි පිළිතුරු යා කිරීම බහුලව දැකිය හැකි ක්‍රමවේ.

ගණනය කිරීම් කළ යුතු ප්‍රශ්න ද

- පහසු හා සංකීර්ණ
- කෙටි හා දිගු ප්‍රශ්න ලෙස හඳුනාගත හැක.

පහසු ප්‍රශ්න  සෘජුවම න්‍යායාත්මක කරුණු පාදක කොට ගෙන ද සංකීර්ණ ප්‍රශ්න විශ්ලේෂණ හැකියාව මතද නිර්මාණය වන අතර දිගු ප්‍රශ්න වලදී එක් සිද්ධියක් මත ප්‍රශ්න කිහිපයක් නිර්මාණය වේ.

මෙම එක් එක් ආකාරයේ ප්‍රශ්න වලට විවිධ වර්ගයේ උපාය මාර්ග හා ශිල්ප ක්‍රම භාවිතා කල යුතුය.
විභාගයට පෙර පසුගිය බහුවරණ ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය කිරීම මගින් ප්‍රශ්න පත්‍රවල බර තැබීම වැඩි පාඩම් හඳුනා ගත හැක. එලෙස හඳුනා ගන්නා බර තැබීම වැඩි පාඩම් සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුයි. එලෙස හඳුනා ගන්නා විට ඔබ දුර්වල පාඩම් සඳහා වැඩි බර තැබීමක් ඇත්නම් ඒවා කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. න්‍යායාත්මක කරුණු හොඳින් අවබෝධ කරගත් පසු පසුගිය ප්‍රශ්න පත්‍ර භාවිතා කොට පුහුණුවීම් කළ යුතුය. මෙලෙස පුහුණු වීම මගින් ප්‍රශ්න රටාව අවබෝධ කර ගත හැක. පෙර පුහුණුව මනා ආත්ම විශ්වාසයක් ඇති කරනු ලබයි.

බහුවරණ ප්‍රශ්නවලට මුහුණ දීමේ දී ප්‍රථමයෙන් කළ යුත්තේ අවධානයෙන් කියවීම සහ වැදගත් කරුණු සටහන් කර ගැනීමයි. බහුවරණ ප්‍රශ්න ස්වභාවයෙන්ම උපායශීලී වන අතර මනා අවධානයෙන් කියවීම් මගින් ප්‍රශ්නය බලාපොරොත්තු වන පිළිතුර හඳුනාගත යුතුය. දිගු ප්‍රශ්නයක් නම් ප්‍රශ්න කියවීමේදී හමුවන වැදගත් කරුණු යටින් ඉරක් ඇඳීම හෝ වෙනයම් ක්‍රමයකින් සටහන් කරගත යුතුය. උදාහරණයක් ලෙස ප්‍රශ්නයෙහි පිළිතුරු ලෙස වඩාත් නිවැරදි හෝ වැරදි පිළිතුර බලාපොරොත්තු විය හැක. මනාව අවධානයෙන් කියවීම හා වැදගත්කම සටන් කිරීම මගින් අතපසුවීම් වලින් වැළකී සිටීම සහ ප්‍රශ්නය තේරුම් ගැනීමේ පහසුව වැඩි කරයි. ප්‍රශ්නය කියවා අවසන් වූ පසු ප්‍රශ්නයට අදාළ අධ්‍යයනය කළ මාතෘකාව හරියාකාරව මතක් කර ගත යුතුය. මෙම ප්‍රශ්නය කුමන න්‍යායාත්මක කොටස පරික්ෂා කිරීම සඳහා අසන ලද්දක් දැයි අවබෝධ කර ගැනීම නිවරදි පිළිතුර සොයා ගැනීම පහසු කරයි.

**බහුවරණ ප්‍රශ්න  පත්‍රය තුළ කාලය කළමනාකරණය කරගන්නේ කෙසේද ?**

විභාගයක් යනු දැනුම සමග තරගය වගේම කාලය සමඟ තරඟය යන කොටස් දෙකෙහිම එකතුවකි.
බහුවරණ ප්‍රශ්න පත්‍රයට ප්‍රශ්න පනහකට විනාඩි 120 ක කාලයක් වෙන්වෙනවා. ඒ අනුව එක් ප්‍රශ්නයක් සඳහා විනාඩි 2.4 ක උපරිම කාලයක් වෙන් කළ හැක. එහෙත් විවිධාකාර ප්‍රශ්න සඳහා සමාන කාලයක් වෙන් කිරීම කල යුතුද යන්න තේරුම් ගත යුතු කාරණාවකි. ප්‍රශ්න පත්‍ර සෑදීමේදී  ප්‍රශ්න සඳහා කාලය වෙන්කිරීමේදී ප්‍රශ්නයෙහි සංකීර්ණ මට්ටම අනුව කාලය වෙන් කිරීම සිදු වේ.

එම නිසා සියලුම ප්‍රශ්න වලට විනාඩි 2.4 උපරිම කාලය භාවිතා කිරීම නුසුදුසුයි. න්‍යායාත්මක කරුණු පාදක කොටගත් ප්‍රශ්න, පහසු හා කෙටි ගණනය කිරීම් ප්‍රශ්න අඩු කාලයක් තුළ විසඳීම මගින් සංකීර්ණ මට්ටම ඉහළ ප්‍රශ්න සඳහා කාලය ඉතුරු කර ගත යුතු වේ.
පෙර සඳහන් කළ පරිදි බහුවරණ ප්‍රශ්න පත්‍රය තුළ නිවැරදිව උත්තර දෙන ප්‍රශ්න සංඛ්‍යාව වැදගත් වන නිසා වැඩි කාලයක් ගත වන හා ඔබට න්‍යායාත්මක කරුණු අමතක වූ ප්‍රශ්න සටහන් කොට පහසු ප්‍රශ්න  ප්‍රථමයෙන් විසඳීම මගින් කාලය ඉතුරු කර ගැනීමට හැක.

**නිවැරදි පිළිතුරු සටහන් කරන කොටු සලකුණු කොළය භාවිතා කරන්නේ කෙසේද?**

අවසාන මොහොතෙහි නිවැරදි පිළිතුර සටහන් කිරීමට යාමේදී අතපසු වීම් සිදු විය හැක. කාල කළමනාකරණය සහ අතපසුවීම් අවම කිරීමට ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය අවසානයේ කොටු සලකුණු කොළයෙහි සටහන් කළ හැක. මෙම උපාය මාර්ගය භාවිතා කරන්නේ නම්  ඔබ නිවැරදි යයි විශ්වාස කරන පිළිතුරු පමණක් ස්ථිර ලෙස සලකුණු කොට නොදන්නා ප්‍රශ්න අංක රවුම් කර ඉදිරියට යා හැක.

මීට අමතරව පහත සඳහන් උපාය මාර්ග ද යොදා ගත හැක.

- ප්‍රශ්න පත්‍රයට පිළිතුරු වට කිහිපයකින් සොයා ගැනීම.

ප්‍රථමයෙන් ප්‍රශ්න පත්‍රයේ පහසු කොටස් වලට පිළිතුරු සපයා අපහසු ප්‍රශ්න සලකුණු කොට මගහැර ඉදිරියට යා හැක. ඉන්පසු නැවත මුල සිට මගහැර ඉදිරියට ආ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම ආරම්භ කළ හැක. පහසු ප්‍රශ්න හඳුනාගෙන ලකුණු ලබා ගැනීමට හැකිවීම වැනි වාසි සහ නැවත නැවත එකම ප්‍රශ්නය කියවීමට කාලය ගත වීම වැනි අවාසි ද ඇත.

- නිවැරදි පිළිතුර නොදන්නා විට වැරදි පිලිතුරු හඳුනාගැනීම.

ප්‍රශ්නයකදී නිවැරදි පිළිතුර හඳුනා ගත නොහැකි නම් ඔබට වඩා වැරදි පිළිතුරු හඳුනාගෙන ඉවත් කිරීම මගින් ඔබ තෝරා ගන්නා පිළිතුර නිවැරදි පිළිතුරක් වීමේ සම්භාවිතාව වැඩි කරගත හැක .
ඉහත සඳහන් ශිල්ප ක්‍රම හා උපායමාර්ග එක් එක් පුද්ගලයා සඳහා ඵලදායී වන ආකාරය වෙනස් වන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

උසස් පෙළ කඩඉම සාර්ථකව පසුකර අනාගතය ජය ගැනීමට ඔබ සැමට සුභ පතමි !



එච්. පී. ඩබ්ලිව්. පමෝද ජයසංක
තෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# හීන පාට කරමු!

ආදරණීය නංගී මල්ලී,

මේ ලිපිය 2022 උසස් පෙළ විභාගයට පෙනී සිටීමට සූදානම් වන ඔයාල වෙනුවෙන්මයි. මම රවිඳු ධනංජය. මම 2019 වර්ෂයේ දී උසස් පෙළ විභාගයට පෙනී ඉඳලා මාතර දිස්ත්‍රික්කයේ 84 වෙනි ස්ථානය ලබාගෙන දැන් කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධ්‍යනය අංශයේ දෙවන වසර ශිෂ්‍යයෙක් විදියට ඉගෙනුම ලබනවා. විභාගයට ආසන්න මාස කිහිපයේදී මම මගේ අත්දැකීම් ඔයාලත් එක්ක බෙදාගන්න මේ ලිපියෙන් බලාපොරොත්තු වෙනවා.

**කාල සටහනකට අනුව වැඩ කරමු.**

කවදහරි දවසක කළමනාකරණ පීඨයක අධ්‍යයනය කටයුතු කරන්න බලාපොරොත්තු වෙන ශිෂ්‍යයෙක් විදියට ඔයා තුල අනිවාර්යෙන්ම මනා සැලසුම්කරණයක් තියෙන්න ඕනේ. දැනටමත් ඔයාලා කාලසටහනක් පාවිච්චි කරනවා ඇති. ඔයාලා කාර්යක්ෂමව ඒ කාලසටහන ප්‍රයෝජනයට ගන්නවා නම් මම මේ කියන විදිය අනුගමනය කරන්න එපා. මේක තවමත් හරියට කාලසටහන හදා ගන්න බැරි වුණු මල්ලිලා නංගිලා වෙනුවෙන්.

2022 දී උසස් පෙළ හදාරන ඔයාලට තියෙන්නේ තව සති දහයක් වගේ කාලයක්. ඒක නිසා ඔයාලා මේ විදියට කාලසටහන් දහයක් හදාගන්න.
මුලින්ම A4 ෂීට් එකකුයි පාට හතරකින් පෑන් හතරකුයි ගන්න. පහලට රූල් විසිහතරක් ගහන්න. තිරස් අතට රූල් 8ක් ගහන්න. පහලට එක රූලක එක පැය ගානෙ පැය 24 ලියාගන්න. මේක පැය භාගෙට අරන් රූල් 48ක් ගහන්න පුළුවන් නම් තවත් කාර්යක්ෂමත්. තිරස් අතට සතියේ දවස් හතේ නම් ලියා ගන්න.

පාට පෑන් විෂයන් තුනට අදාළව වෙන්කර ගන්න. කළු පැහැති පෑනෙන් ඔයාට පාඩම් කරන්න වෙන්නේ නැති වෙලාවන් පාට කරන්න. උදාහරණයක් විදිහට සඳුදා දවස ගමු. ඔයා උදේ නැගිටලා මුහුණ හෝදලා අවසන් වෙන්න උදේ හතර වෙනවා. ඔයා උදේ හතර වෙනකන් කාලසටහන කළු පෑනෙන් මාක් කරන්න. ඔයා සඳුදා උදේ 4-5 වෙනකම් ආර්ථික විද්‍යාව බහුවරණ ප්‍රශ්න 20ක් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔයා කාල සටහනේ ආර්ථික විද්‍යාවට තෝරගත්ත පෑනෙන් ඒ තීරුව පාට කරන්න. ඊලග පැයේ ව්‍යාපාර අධ්‍යනයට අදාල පාඩමක් බලාගන්නවා නම් ඒක ඊට අදාල පෑනෙන් පාට කරන්න. ඔයාට සඳුදා උදේ අටේ ඉඳන් හතර වෙනකම් උපකාරක පංතියක් තියෙනවා. ඒකට ලෑස්ති වෙන්න ඕන නිසා උදේ හත අට පැය ගත කරන්න වෙනවා. ඊළඟට ක්ලාස් ගිහින් ඇවිත්, පහයි තිහේ ඉඳන් හත වෙනකම් පොඩ්ඩක් නිදාගන්න හිතාගෙන ඉන්නවා. ඔයාට සඳුදා දවසෙ උදේ 7 ඉඳන් හවස 7 වෙනකම් පාඩම් වැඩක් කරන්න වෙන්නෙ නෑ. ඔයා ඒ පැය කිහිපයම කළු පෑනෙන් පාට කරන්න. ඊළඟ පැය කිහිපයත් ඒ ඒ විෂයන්වල පාටින් පාට කරන්න. මේ විදියට පැය භාගෙ කොටස්වලට බෙදාගන්න පුළුවන් නම් තවත් කාර්යක්ෂමයි. ඒ වගේම ඔයා සඳුදාට අදාල කාලසටහන, ඊට කලින් සතියෙ සිකුරාදාටවත් හදාගන්නව නම් ගොඩක්ම වටිනවා.

**කට පාඩම් කරනවට වඩා ප්‍රශ්නපත්‍ර කරමු.**

කොච්චර පාඩම් කළත් අපිට විභාගෙට ගිහින් ලියන්න වෙන්නේ පේපර් එකක්නේ. ඒ නිසාත්, නිකන් කටපාඩම් කරනවට වඩා ලියද්දි මතක හිටින ප්‍රමාණය වැඩි නිසාත්, ප්‍රශ්න පත්‍ර කරද්දි විභාගය සඳහා ආයෙ වෙනම සූදානමක් අවශ්‍ය නොවෙන නිසාත් කට පාඩමට වඩා ප්‍රශ්න පත්‍ර කරන එක හොඳයි කියන එක තමයි මගෙ අදහස.

**විනාඩි 25ක් පාඩම් කරලා විනාඩි 5ක් විවේක ගමු.**

මෙය විද්‍යාත්මක ක්‍රමයක්. විද්‍යාඥයින්ට අනුව සාමාන්‍ය පුද්ගලයෙක්ට යම් දෙයක් පිළිබඳව අවධානය යොමු කරන් ඉන්න පුළුවන් කාලය මිනිත්තු 25යි. සත්‍ය වශයෙන්ම පැයක් එක දිගට පාඩම් කරනව කියන්නෙ බොරු වැඩක්. මොකද ඕනෑම කෙනෙකුට අවධානය බිඳෙන්නෙ නැතුව ඉන්න පුළුවන් විනාඩි 25ක් විතර නිසා. සමහරවිට ඔයාලටත් මේ ගැන අත්දැකීම් ඇති.
මෙම ක්‍රමවේදය පාවිච්චි කරද්දි මම භාවිත කරපු වෙන උපක්‍රමයකුත් තියෙනවා. ඇත්තෙන්ම ඒකෙන් තවත් නරක පුරුද්දක් සාර්ථකව අතෑරගන්න පුළුවන් උනා. වර්තමානයේදි ඉගෙනීම අතපසුවෙන්න ගොඩක්ම බලපාන හේතුව තමයි ඇබ්බැහියක් විදියට ස්මාර්ට් ෆෝන් එක අධික විදියට පාවිච්චි කිරීම. මම ඒකෙන් මිදෙන්න පාවිච්චි කරපු උපක්‍රමය තමයි මේ.

ඇන්ඩ්‍රොයිඩ්, අයි ෆෝන් ඇතුළු ඕනෑම ස්මාර්ට් ෆෝන් එකකට නොමිලයේ ඩවුන්ලෝඩ් කරගන්න පුළුවන් Forest Productivity කියල ඇප් එකක් තියෙනවා. ඒක ගොඩාක් සරල ඇප් එකක්. ඔයාලට තියෙන්නෙ ඒකෙන් පොඩි ගේම් එකක් ප්ලේ කරන්න. ඒක තමයි පැළ හිටවන එක.

ඔයා පාඩම් කරන්න ගනිද්දි විනාඩි 25කට පැළයක් ඉන්දන බවට සෙටින්ස් හදා ගන්න. ඊට පස්සෙ පෝන් එක පැත්තකින් තියල පාඩම් කරන්න පටන් ගන්න. හරියටම විනාඩි 25කින් පෝන් එක නාද වෙනවා. එතකොට ඔයා පාඩම් කරන එක නවත්තන්න. ඊට පස්සෙ හරියටම විනාඩි 5ක විවේකයක් ගන්න. හැබැයි මේ වෙලාවෙදි ෆෝන් එක ඔබන්න යන්න එපා. එළියට ගිහින් දුර දෙයක් දිහා බලාගෙන ඉන්න. වතුර එකක් බීල හරියටම විනාඩි 5කින් පාඩම් කරන්න සෙට් වෙන්න. ඇප් එක ගැන කිව්වොත් ඔයා පැලය ඉන්දන විනාඩි 25 ඇතුලෙදි මොකක් හරි හේතුවකට ෆෝන් එක එබුවොත් ඒ පැලය මැරෙනවා. ඔයා ටාගට් එකක් තියාගන්න දවසට මේ වගේ විනාඩි 25ට පැල හයක්වත් සිටුවනවා කියලා. මේ ඇප් එකේ තියන තවත් වාසියක් තමයි ඔයා දවසට වැඩ කරපු මිනිත්තු ගණන ඔයාට හොයාගන්න පුළුවන්.

ඒ වගේම අනිවාර්යෙන්ම සැලකිලිමත් වෙන්න ඕනෙ මේ ක්‍රමයට මුළු දවසම පාඩම් කරන්න යන්න එපා. පාඩම් කරන අතරතුර පසුගිය ප්‍රශ්නපත්‍ර වරින්වර කරන්න.

**අපි ඔක්කොම ගුරුවරු - ඔක්කොම සිසුවෝ**

මම පාවිච්චි කරපු කර්යක්ෂම ම ක්‍රමය තමයි මේක. මේ ක්‍රමය ගොඩක් සරලයි. ඔයාල හොඳට පාඩම් කියවනවා. ඊලගට ඔයාම ගුරුවරයෙක් වෙනවා. හිතන්නකෝ ඔයා ආර්ථික විද්‍යාවේ උද්ධමනය කියන කොටස පාඩම් කරා කියල. ඔයා මචාගන්න ඔයා ආර්ථික විද්‍යා ගුරුවරයෙක් නම් කොහොමද ඒක පැහැදිලි කරන්නේ කියලා. ඔයා සර් කෙනෙක් නම් මුලින්ම ශබ්ද නගා තමයි ළමයින්ට උගන්නන්නෙ. ගුරු අත්පොතේ තියෙන සිද්ධාන්ත විතරක් නෙවෙයි ප්‍රායෝගික ලෝකයේ තත්වයත් පැහැදිලි කරනවා. දැන් ලංකාවේ උද්ධමනය මොනවගේ ද? ලංකාවේ උද්ධමනයට හේතු මොනවද වගේ දේවල් ගැන ළමයි එක්ක සාකච්ඡා කරනවා. ඔයාටත් කරන්න තියෙන්නෙ ඒ විදියට ශබ්ද නගා කියවන ගමන් නව තොරතුරු සොය සොයා තමන්ටම ඉදිරිපත් කරන්න. ප්‍රශ්න සාකච්ඡා කරන්න. මේ ක්‍රමය සාර්ථකව ප්‍රගුණ කරන්න පුළුවන් නම් ලොකු ප්‍රතිඵලයක් ගන්න පුළුවන් කියල මම පෞද්ගලිකව හිතනවා.

**පාඩම් කරන ගමන් නෝට් ලියමු.**

ඇත්තටම මම මේ ක්‍රමය නම් පාවිච්චි කරල නෑ. මේකත් කලින් මං සඳහන් කරපු ක්‍රමය වගේමයි. ඔයා ජීවත්වෙන තැනත් එක්ක ගබ්දනගා කියවන්න අමාරු නම් මේ ක්‍රමය පාවිච්චි කරන්න පුළුවන්.

මේක ගොඩක් සරලයි. ඔයා විනාඩි 25 බැගින් දෙසැරයක්, ඒ කියන්නේ විනාඩි 50ක් පාඩම් කරනවා. ඊට පස්සේ ඔයා කරන්න ඕන කටු කොලයක් අරගෙන පාඩම් කරපු දේ ඔයා මතක තියාගන්න විදියට ලියන එක. මේක ඔයාගේ මොලයට එකම කරුණ කිහිප වතාවක් එන්න හේතු වෙනවා.

**ප්‍රායෝගික වෙමු.**

නංගියේ මල්ලියේ මෙහෙම දෙයක් තියෙනවා. අපි විභාගයට කියලා අපිට උගන්නපු සිද්ධාන්ත ඔක්කොම හොදට පාඩම් කරගෙන ගියත් සමහර වෙලාවට විභාගයට අහන ප්‍රශ්නයට උත්තර ලියාගන්න බැරි වෙනවා. පසුගිය අවුරුදු 20ක ප්‍රශ්න පත්‍ර කරල ගියත් විභාගයට එන ප්‍රශ්නයට උත්තර ලියාගන්න බැරි වෙනවා. මේක ගොඩක් ළමයි මුහුණ දෙන ගැටළුවක්.

ඇයි එහෙම වෙන්නේ?
දැන් මෙහෙමයි, අධ්‍යාපන අමාත්‍යංශයෙන් අදාළ විෂයයන් වලට අදාලව ළමයි දැනගෙන ඉන්න ඕන මෙන්න මේ ටිකයි කියල නිර්දේශ කරනවා. ඒ දේවල් ශිෂ්‍යයයෝ විදියට ඔයාලට අවබෝධ වෙලාද, තේරුම් අරගෙනද, ප්‍රායෝගිකව මේ සම්බන්ධව දැනුමක් තියේද කියල බලන්න තමයි විභාග දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න පත්‍රය හදන්නේ. ඔයා සිද්ධාන්ත සේරම කටපාඩම් කලත් වැඩක් වෙන්නෙ නෑ ඔයාට ඒ දේවල් පිලිබඳ අවබෝධයක් නැත්නම්. මේ නිසා වැදගත්ම දේ තමයි ඔයා පාඩම් කරන්නෙ මොකක්ද? මේකෙ තේරුම මොකක්ද? මේක වුනේ කොහොමද? කියල අදාල සිද්ධාන්ත අවබෝධ කරගෙන පාඩම් කරන එක. එහෙම කලාම ඔයාට අදාල විෂය කරුණු අවබෝධ වෙලානම් එතනින් අහන ඕනම ප්‍රශ්නයකට උත්තර දෙන්න පුළුවන්. මේ නිසා හැමවෙලේම අවබෝධයෙන් යුතුව පාඩම් කරන්න. නොදන්න දේවල් පැමිණි විගස යාළුවෙක්ගෙන් හරි සර් කෙනෙක්ගෙන් හරි අහල හැකි ඉක්මනින්ම නිරාකරණය කරගෙන පාඩම් කරනවනම් ඔයාට විභාග ප්‍රශ්න පත්‍රය කියන එක ලොකු දෙයක් නෙමේ.



රවිඳු ධනංජය
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# මුදල් ප්‍රවාහ නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරමු.

මුදල් ප්‍රවාහ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනු,
LKAS 07, ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ හඳුනා ගැනීමට පෙර මුදල් යන්නට අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු අයත් වන බවත් එසේම කිසිදු අවදානමකින් තොරව මුදල් බවට පරිවර්තනය කළ හැකි ඉතා ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් කෙටි කාලීන ආයෝජන මුදල් හා සමාන දෑ ලෙස හඳුන්වන බව අප දැන ගෙන සිටිය යුතු කරුණකි.
උදාහරණ; ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්

මුදල් ප්‍රවාහ ලෙස, මුදල් හා මුදල් හා සමාන දෑ ආයතන තුළට ගලා ඒම ලැබීම් ප්‍රවාහයක් ලෙස ද, ගලා යෑම් ගෙවීම් ප්‍රවාහයක් ලෙස ද හැඳින්විය හැකිය. ව්‍යාපාරයකට විවිධ මාර්ග හරහා මෙන්ම විවිධ අරමුණු මගින් මෙම මුදල් ප්‍රවාහයන් ඇති වන අතර ව්‍යාපාරයට මෙම ප්‍රධාන මුදල් ප්‍රවාහයන් කොටස් තුනකට වෙන් කර හඳුනාගත හැක.

1. මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ
2. ආයෝජන ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ
3. මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ

උසස් පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යයාවන් වශයෙන් මෙම මුදල් ප්‍රවාහයන් මේ ආකාරයෙන් වෙන්කොට හඳුනා ගැනීම අපට වැදගත් වන්නේ ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ අංගයක් වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහායි. මූල්‍ය ප්‍රකාශන ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන්ගේ ආර්ථික තීරණ ගැනීම සඳහා ව්‍යාපාරයක කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා මුදල් හා මුදල් හා සමාන දෑ වල සිදු වූ වෙනස්වීම් මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් වර්ග කර මුදල් ජනනය හා භාවිතය නිරූපණය කෙරෙන අර්ථවත් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනුවෙන් හඳුන්වනු ලබයි. ව්‍යාපාරයක් කිසියම් කාල ඡේදයක් තුළදී මුදල් උපයා ගත් ආකාරය හා එම මුදල් භාවිතා කළ ආකාරය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයකින් නිරූපණය වේ.මෙම ප්‍රකාශනයට අනුව මුදල් ප්‍රවාහයන් නිවැරදිව වෙන්කර සකසනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ ශේෂය, ව්‍යාපාරය අත සැබැවින් පවතින මුදල් හා සමාන දෑ ශේෂයට සමාන විය යුතුය.

**මුදල් ප්‍රවාහ වෙන්කොට හඳුනා ගනිමු.**

1. මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය

ව්‍යාපාරයේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් ආශ්‍රිතව ඇතිවන නැතහොත් ව්‍යාපාරයේ ප්‍රධාන ආදායම් ඉපයීමේ ක්‍රියාමාර්ග තුළින් ඇතිවන මුදල් ප්‍රවාහයන් මේ යටතට ගැනේ.
උදා: - භාණ්ඩ විකිණීමෙන් සහ සේවා සැපයීමෙන් මුදල් ලැබීම්
- ගාස්තු, කොමිස් සහ වෙනත් අයගෙන් මුදල් ලැබීම්
- භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම්
- සේවකයින්ට සහ ඔවුන් වෙනුවෙන් මුදල් ගෙවීම්
- රක්ෂණ ගෙවීම් හෝ ප්‍රතිලාභ ලැබීම්
- ආදායම් බදු ගෙවීම් සහ ආපසු ගෙවීම්
- ගනුදෙනු කිරීම සඳහා පවත්වන ලද කොන්ත්‍රාත් වලින් මුදල් ලැබීම් සහ ගෙවීම්

2. ආයෝජන ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය

දිගුකාලීන වත්කම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් සහ ඉවත් කිරීම් වලට අදාල ක්‍රියාකාරකම් මෙයට අදාළ වේ.

උදා: - දේපල පිරියත හා උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා අනෙකුත් දිගුකාලීන වත්කම්
- අත්පත් කර ගැනීමට, ඉදි කිරීමට හෝ සංවර්ධනය කිරීමට ප්‍රාග්ධන ගත කළ පිරිවැය
- දේපල පිරියත හා උපකරණ, අස්පෘශය වත්කම් හා අනෙකුත් දිගුකාලීන වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල්
- වෙනත් ව්‍යාපාරවල ආයෝජනය කිරීම වෙනුවෙන් ගෙවන ප්‍රතිලාභ හෝ එකී ආයෝජන විකිණීමෙන් ලැබෙන මුදල්
- බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ට දෙනු ලැබූ ණය හෝ මුදල් අත්තිකාරම් ගෙවීම් හා ණය ආපසු ලැබීම්

උදා;පොලී ලැබීම්, ලාභාංශ ලැබීම්, ගොඩනැගිලි කුලී ලැබීම් ආදිය

3. මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය

ව්‍යාපාරයක ප්‍රාග්ධන සම්පාදනය හෙවත් අරමුදල් සම්පාදන මාර්ග හා බැඳුණු මුදල් ප්‍රවාහයන් සරලවම මෙයට අදාළ වේ.

උදා: - කොටස් හෝ වෙනත් එවැනි ස්කන්ධ උපකරණ නිකුතුවකින් ලැබෙන මුදල්
- කොටස් අත්පත් කරගැනීමට හෝ නිදහස් කිරීමට ගෙවන මුදල්
. - ණයකර හෝ වෙනත් දිගුකාලීන ණය ගැනීම් වලින් ලද මුදල් හෝ එවැනි ණය ආපසු ගෙවීම්
- කල්බදු වාරික ගෙවීම් (පොලිය හැර)
- කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම් / අයිතිකරුවන් වෙත කරන බෙදාහැරීම්

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරමු**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට අනුව පිළියෙල කළ හැක.

1. සෘජු ක්‍රමය
2. වක්‍ර ක්‍රමය

මෙම ක්‍රම දෙකේදීම ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් වාර්තා කරන අන්දමේ කිසිදු වෙනසක් නොමැති අතර වෙනසක් පවතින්නේ මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය වාර්තා කරන විට බවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ සෘජු ක්‍රමයටද වක්‍ර ක්‍රමයට ද යන්න තීරණය වන්නේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේදය මත බවත් අප සරලව මතක තබා ගත යුතුය.

මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය සෘජු ක්‍රමයට හා වක්‍ර ක්‍රමයට ගණනය කිරීමේ ඇති වෙනස්කම් හා සමානකම් පහත පරිදි සරලව පෙන්වා දිය හැක.

| සෘජු ක්‍රමය | වක්‍ර ක්‍රමය |
|---|---|
| - ආයතනයක දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් සියල්ල අනාවරණය කර මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය ගණනය කරයි.<br><br>- ශුද්ධ ලාභය ගණනය කිරීමට යොදා ගන්නා ආදායම් හා වියදම් අයිතමයන්ගෙන් ජනනය වූ මුදල් ප්‍රවාහයන් අදාළ කර ගනී.<br><br>- මෙහෙයුම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයට මුදලින් ගෙවූ ආදායම් බදු, ණය පොලී අඩු කර මෙහෙයුම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කරනු ලබයි. | - වර්ෂයේ බදු පෙර ලාභය ට හෝ ශුද්ධ ආදායම ට මුදල් නොවන ගණුදෙනු කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම් සහ වෙනත් ක්‍රියාකාරකම් වලට අයත් එහෙත් ලාභය තුළ අඩංගු අයිතම වෙනුවෙන් ගැළපීම් කර මෙහෙයුම් ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහය ගණනය කරයි.<br><br>- කාලච්ඡේදයේ බදු පෙර ශුද්ධ ලාභය ගෙන එහි මුදල්මය නොවන අයිතමයන් ඉවත් කරනු ලැබේ.<br><br>- කාරක ප්‍රාග්ධනය සංචලනයන් ගලපනු ලබයි.<br><br>- මෙහෙයුම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයට මුදලින් ගෙවූ ආදායම් බදු, ණය පොලී අඩු කර මෙහෙයුම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කරනු ලබයි. |

මේ අනුව සෘජු ක්‍රමයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, මුදල් ගලා ඒම් සහ ගලා යෑම් සාමාන්‍ය පරිදි දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ හැකි බව ඔබට පැහැදිලි වන්නට ඇත.

එසේම වක්‍ර ක්‍රමයේදී බදු පෙර ශුද්ධ ලාභය පදනම් කරගනිමින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය ගණනය කරගත යුතු බව ද පැහැදිලි වන්නට ඇත. තවදුරටත් වක්‍ර ක්‍රමයට මෙහෙයුම් මුදල් ප්‍රවාහය පිළියෙල කර ගැනීමේදී, ඔබට විශේෂයෙන් වැදගත් වන සහ ඔබ විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් පහතින් දක්වා ඇත.

ශුද්ධ ලාභයට ගැලපීම් යටතේ නැවත එකතු කලයුතු අයිතම,

- ක්ෂය වීම්
- වත්කම් විකුණුම් අලාභ
- පොලී වියදම් (ගෙවූ පොලී වියදම පහතින් අඩු කරන බැවින්)
- ගැලපීම් යටතේ නැවත අඩු කළ යුතු අයිතම
- වත්කම් විකුණුම් ලාභ
- ආයෝජන ආදායම්
- ලද පොලී
- ලද ලාභාංශ

**කාරක ප්‍රාග්ධන ගැලපීම.**

වත්කම් හා මුදල් ප්‍රවාහය අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවකි.

උදා: තොගය වැඩි වීමක් යනු මුදල් ප්‍රවාහය ගලායෑමකි, එහිදී ව්‍යාපාරයෙන් මුදල් පිටතට ගලා යයි. එවිට තොග වත්කම ඉහළ ගොස් ව්‍යාපාරයේ මුදල් මට්ටම පහළ යයි.

වගකීම් හා මුදල් ප්‍රවාහය අතර පවතින්නේ අනුලෝම සබඳතාවයකි.

උදා: ව්‍යාපාරය වෙළෙඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම් කිරීමක් සලකා බලමු. වෙළෙඳ ගෙවිය යුතු දෑ වගකීම අඩුවීමක් යනු, මුදල් ප්‍රවාහය ගලායාමකි. එහිදී වෙළෙඳ ගෙවිය යුතු දෑ වගකීම පහළ ගොස් මුදල් මට්ටම ද පහළ යයි.

මේ අනුව මෙහෙයුම් මුදල් ප්‍රවාහය වක්‍ර ක්‍රමයට අනුව ගණනය කරන විට, කාරක ප්‍රග්ධන ගැලපිමේදී කාලච්ඡේදයක් තුළ,

- කාරක ප්‍රාග්ධන වත්කම ඉහළ යාමක් නම් මුදල් ප්‍රවාහය ගලා යාමක් ද,
- කාරක ප්‍රාග්ධන වත්කම පහළ යාමක් නම් මුදල් ප්‍රවාහය ගලා ඒමක් ද,
- කාරක ප්‍රාග්ධන වගකීම ඉහළ යාමක් නම් මුදල් ප්‍රවාහය ගලා ඒමක් ද,
- කාරක ප්‍රාග්ධන වගකීම පහළ යාමක් නම් මුදල් ප්‍රවාහය ගලා යාමක් ද

ලෙසත් දැක්විය යුතුය.



අයි. එම්. පිහනගේ
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# දැනුවත් වෙමු; ආරක්ෂා වෙමු.

*"සියලු පුරවැසියෝ පාරිභෝගිකයෝය. ආර්ථික ක්ෂේත්‍රයේ විශාලම ස්ථරය ඔවුන් වන අතර, රාජ්‍ය හා පෞද්ගලික යන සෑම ක්ෂේත්‍රයකම තීරණවලින් පීඩාවට පත්වන්නෝද වෙති."*

*ජෝන්.එෆ්.කෙනඩි*
*ඇමෙරිකාවේ හිටපු ජනාධිපති*




අප විසින් අපගේ එදිනෙදා අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම උදෙසා භාණ්ඩ හා සේවා මිලදී ගනු ලබයි. එනම් අප සියලු දෙනා පාරිභෝගිකයන් ලෙස කටයුතු කරති. තමාගේ, තම පවුලේ හෝ සමූහයකගේ අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා භාණ්ඩ හා සේවා මිලදීගන්නකු හෝ පරිභෝජනය කරන්නෙකු නැතහොත් සෘජුව හෝ වක්‍රව පාරිභෝගිකයෙකු වශයෙන් විවිධ සමාජ තත්ත්වයන් තුළ කටයුතු කරන්නෙකු පාරිභෝගිකයෙකු ලෙස හඳුන්වයි. තීක්ෂණ පාරිභෝගිකයෙකු කුමක් කවර ස්ථානයකින් කවරදා මිලදී ගත යුතුද ආදී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සන්සන්දනාත්මකව තම මිලට ගැනීමේ තීරණ ක්‍රියාත්මක කරයි.

පාරිභෝගිකයන් විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ඔවුන් විසින් ගෙවනු ලබන මුදලට සරිලන තෘප්තියක් ලැබිය යුතුය. එය සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණයයි. රජය විසින් විවිධ අණ පනත් සම්මත කිරීම, විවිධ ආයතන පිහිටුවීම වැනි ක්‍රියාමාර්ග මගින් මේ බව තහවුරු කර ඇත. පාරිභෝගික ආරක්ෂණය හේතුවෙන් පාරිභෝගිකයන්ට වෙළඳ විෂමාචාර වලින් ආරක්ෂා වීමට හැකි වන අතර අවශ්‍ය අවස්ථාවලදී නීතිමය රැකවරණය ද ලබා ගැනීමට හැකිය. එමෙන්ම ව්‍යාපාරිකයන්ටද ගුණාත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගෙන ඔවුන්ගේ විකුණුම් වැඩි කර ගැනීමට හැකි වනු ඇත.

පාරිභෝගිකයන් විසින් ගෙවන මුදලට සාධාරණ තෘප්තියක් ලබා ගැනීම වෙනුවෙන් පාරිභෝගිකයා වෙත පාරිභෝගික අයිතිවාසිකම් ඇත. එම පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රධාන පාර්ශව දෙකක් විසින්; එනම්, හිටපු ඇමරිකානු ජනාධිපතිවරයෙකු වන ජෝන්. එෆ් කෙනඩි විසින් සහ පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත් කර ඇත. එම පාරිභෝගික අයිතිවාසිකම් රැක ගැනීම සඳහා කටයුතු කිරීමට පාරිභෝගිකයාට වගකීමක් ඇති අතර එම අයිතිවාසිකම් පහත පරිදි වේ.

| | |
|---|---|
| ජෝන් එෆ් කෙනඩි ප්‍රකාශයට පත් කරන ලද අයිතිවාසිකම් | ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතිය. (The right to safety)<br>තොරතුරු දැනගැනීමට ඇති අයිතිය. (The right to informed)<br>තෝරා ගැනීමට ඇති අයිතිය. (The right to choose)<br>සවන් යොමු කරවා ගැනීමටට ඇති අයිතිය. (The right to heard) |
| පාරිභෝගික ජාත්‍යන්තරය ප්‍රකාශයට පත් කරන ලද අයිතිවාසිකම් | මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය.(The right to satisfy the basic needs)<br>වන්දි ලබාගැනීමට ඇති අයිතිය.(The right to redress)<br>පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය.(The right to consumer education)<br>සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය.<br>(The right to be in a healthy environment) |

විචාරාත්මක දැනුවත්භාවයකින් යුත් පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන වටිනාකමක් සහිත ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරාගැනීමට පෙළඹෙන අතර වෙළඳ විෂමාචාර වලට හසුනොවී පාරිභෝගික අයිතිවාසිකම් රැක ගනිමින් කටයුතු කරයි.

පාරිභෝගික ආරක්ෂණය සහතික කිරීම උදෙසා රජය විසින් සම්මත කර ඇති විශේෂ පනතක් වන 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා ඇති අතර පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධානතම ආයතනය මෙයයි. වර්තමාන ආර්ථික හා වෙළඳ පසුබිම තුළ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ක්‍රියාත්මක වන අතර සීමාකාරී ගිවිසුම් පාලනය කිරීම, තරඟකාරීත්වය පිළිබඳ අවහිරතා නැති කිරීම, තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්වයන් පිළිබඳ විමර්ශනය කිරීම, පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම ආදී කටයුතු සිදු කරයි.

භාණ්ඩ වල මිල ලකුණු කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති භාණ්ඩ වල විස්තර විකෘති කිරීම හෝ වෙනස් කිරීම, උපරිම මිලක් නියම කර ඇති භාණ්ඩ උපරිම මිලට වඩා වැඩි මිලකට අලෙවි කිරීම, තම භාරයේ ඇති භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම, නියමිත ප්‍රමිතියට නොගැළපෙන භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය, තම වෙළඳ අවශ්‍යතාවයට වඩා වැඩි ප්‍රමාණයක් තමන් සන්තකයේ තබා ගැනීම යනාදී වැරදි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ අක්‍රමිකතා හෝ වැරදි ලෙස සැලකේ.

නීති සම්පාදනයේදී සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදී රජය විසින් ප්‍රධාන භූමිකාවක් දරන අතර පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධව එම රෙගුලාසි පිළිබඳ පාරිභෝගිකයින් දැනුවත් වී සිටීම අත්‍යාවශ්‍ය වේ. එම නිසා පාරිභෝගික අධ්‍යාපනය යනු වැදගත් කාර්යයක් ලෙස සැලකිය යුතුය. පාරිභෝගික අධ්‍යාපනයේ දී පාරිභෝගික අයිතිවාසිකම්, පාරිභෝගික යුතුකම් සහ පාරිභෝගිකයෙකුගේ කාර්යභාරය පිළිබඳව අවබෝධය ලැබීමට, පාරිභෝගිකයෙකු විසින් තමන් මිලදී ගන්නා භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු දැනගැනීමට, වෙළඳපොළ තත්ත්වය වටහාගැනීමට, සහ අලෙවිකරණය හා දැන්වීම්කරණය මගින් ලබාදෙන තොරතුරු නිවැරදිව දැන ගැනීමට පාරිභෝගික අධ්‍යාපනය හේතු වේ.

එදිනෙදා ජීවිතයේදී ප්‍රමිතීන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නිෂ්පාදනයක නැතහොත් සැකසුම් පද්ධතියක ප්‍රමාණය හෝ හැඩය හෝ ධාරිතාව ප්‍රමිතීන් මගින් ස්ථාපිත කළ හැක. ප්‍රමිතියක් යනු ක්‍රියාකාරකම් හෝ ඒවායේ ප්‍රතිඵල සඳහා නීති රීති, මාර්ගෝපදේශ හෝ ලක්‍ෂණ සපයන සම්මුතියක් මගින් ස්ථාපිත කරන ලද ලේඛනයකි. (ISO/IEC මාර්ගෝපදේශය 2:2004 හි අර්ථ දක්වා ඇති පරිදි). ප්‍රමිති යනු නිෂ්පාදන, සේවා සහ පද්ධති ආරක්ෂිත, විශ්වාසදායක සහ ඒවා අපේක්‍ෂා කරන ආකාරයට අඛණ්ඩව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති පිරිවිතර සහ ක්‍රියා පටිපාටි දක්වා ඇති ප්‍රකාශිත ලේඛන වේ. එය ගුණාත්මක හා ආරක්‍ෂණ නිර්ණායක නිර්වචනය කරන පොදු භාෂාවක් ස්ථාපිත කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රමිති සකස් කිරීම, නිකුත් කිරීම, හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන 1984 අංක 6 දරන ප්‍රමිති ආයතන පනත යටතේ පිහිටවූ ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයි. කර්මාන්ත, වෙළඳාම, පරිභෝජනය ඉහළ නැංවීම සඳහා ප්‍රමිතිකරණයට හා තත්ත්ව පාලනයට අදාළ නිර්දේශයන් සිදු කිරීම හා ඒවා ශ්‍රී ලංකාව පුරා ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූලික පරමාර්ථය වේ.එමගින් පාරිභෝගිකයන්ට නියමිත ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමටත් ව්‍යාපාරිකයන්ට තම විකුණුම් වැඩි කරගැනීම මගින් තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීමටත් හැකි වේ.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ක්‍රියාත්මක කරන ප්‍රමිති වර්ග කිහිපයක් සහ ඒවායේ ලාංඡන පහත දැක්වේ.

SLS භාණ්ඩ සහතිකකරණය

ISO 9001:2015 ප්‍රමිතිය
(තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහතිකකරණය)

ISO 22000:2005 ප්‍රමිතිය
(ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණය)

ISO 14001:2004 ප්‍රමිතිය
(පරිසර කළමනාකරණ පද්ධති සහතිකකරණය)

HACCP සහතිකකරණය
(උපද්‍රව විශ්ලේෂණ හා අවදි පාලන
අවස්ථා)

GMP සහතිකය
(යහපත් නිෂ්පාදන පිළිවෙත්
සහතිකකරණය)

OHSAS 18001:2007
(වෘත්තිය සෞඛ්‍ය සුරක්ෂිතතා
කළමනාකරණ පද්ධති සහතිකකරණය)

ISO 50001:2011 ප්‍රමිතිය
(බලශක්ති කළමනාකරණ පද්ධති
සහතිකකරණය)

නිර්මාංශ සහතිකකරණය

තේ නිපැයුම් සහතිකකරණය

සුපිරි වෙළඳසැල් කළමණාකරන
සහතිකකරණය

කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන
පද්ධති සහතිකකරණය




විදාතා පද්ධති සහතිකකරණය




ශක්ති කාර්යක්ෂමතා ලේබලය

ප්‍රමිතිකරණයේ පියා ලෙස සැලකෙන්නේ එලි විට්නි (Eli Whitney) මහතායි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ඔක්තෝබර් 14 වන දිනය අයත් සතිය 'ජාතික තත්ත්ව සතිය' ලෙස නම් කර තිබේ. ඇතැම් රටවල් ජාත්‍යන්තර ප්‍රමිති දිනය වෙනත් දිනවල සමරන අතර කැනඩාව ඔක්තෝබර් 12 වන දින ද, එක්සත් රාජධානිය ඔක්තෝබර් 11 වන දින ද, එය සැමරීම නිදසුන් ලෙස ගත හැක.



අයි. එච්. කවීෂ ඉද්දගොඩ
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# නිමැවුමක නොපෙනෙන පිරිවැය තීරකයා

ව්‍යාපාර වල සාර්ථක හෝ අසාර්ථකභාවය සඳහා එහි නිශ්පාදන පිරිවැය සෘජුවම වගකිව යුතුයි. සාමාන්‍යයෙන් නිමවුමක පිරිවැය ලෙස සලකනු ලබන්නේ එම නිමැවුම වෙනුවෙන් සෘජුවම දැරූ වියදම් වල එකතුවයි. එනමුත් ඊට පරිබාහිරව නිමවුමක් බිහි කිරිම සඳහා තවත් බොහෝ වියදම් දායක වේ.

නිදසුනක් ලෙස,
ඇඳුමක් නිෂ්පාදනය කිරිම සඳහා අපට  සෘජු අමුද්‍රව්‍යක් ලෙස රෙදි අවශ්‍යවනවා සේම එය නිම කිරිම සඳහා යන්ත්‍ර ක්‍රියා කරවීමට විදුලිය, ඇඟලුම් නිම කිරිමේ කටයුතු සිදු කරන සේවකයන් පරිපාලනය කිරිමට අවශ්‍ය නිලධාරීන් සඳහා ගෙවන වේතන, කර්මාන්ත ශාලා පවත්වාගෙන යාමට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීම සඳහා ගෙවීමට සිදු වන කුලිය, නිමවුම බෙදා හැරීම සඳහා දැරීමට සිදු වන වියදම් ආදිය දැක්විය හැක.

මේවා නිමවුමක් වෙනුවෙන් දැරීමට සිදු වන නොපෙනෙන පිරිවැය නැතහොත් ගිණුම්කරණය අනුව ගත් කල පොදුකාර්ය පිරිවැය ලෙස හැඳින්වේ.

පොදුකාර්ය පිරිවැය යන්නට පොදුවේ පිලිගත් නිර්වචනයක් ලෙස,
නිෂ්පාදන ඒකකයක් සම්බන්දයෙන් පැහැදිලිව වෙන්කල හඳුනා ගත නොහැකි, නිෂ්පාදන ඒකක රාශියක් සඳහා පොදුවේ දරන්නා වූ වියදම් වල එකතුව වේ.

පොදුකාර්ය පිරිවැය යම් සීමාවක් දක්වා නොවෙනස්ව පවතින අතරම නිෂ්පාදනය පහල වැටුනද, දැරීමට සිදු වන වියදම් ලෙස පෙන්වා දිය හැක.

සමීපතම නිදසුනක් ලෙස,
කොරෝනා වසන්ගත සමයේදී බොහෝ කර්මාන්ත ශාලා හා ව්‍යාපාරික ස්ථාන වසා දැමීම හා නිෂ්පාදනය සීමා කිරීමට සිදු වූවත් එම ආයතන වලට කම්හල් කුලී, රක්ෂණ වියදම්, පරිපාලන වේතන ආදිය දැරීමට සිදු විය.

ප්‍රධාන වශයෙන් පොදුකාර්ය පිරිවැය පහත ආකාර අනුව වර්ගීකරණය කළ හැකිය.

1. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය
   - වක්‍ර ද්‍රව්‍ය පිරිවැය
   - වක්‍ර ශ්‍රම පිරිවැය
   - වක්‍ර වෙනත් පිරිවැය

2. නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය
   - විකිණීමේ හා බෙදාහැරීමේ පිරිවැය
   - පරිපාලන පිරිවැය
   - මූල්‍ය හා වෙනත් පිරිවැය
   - පර්යේෂණ හා සංවර්ධන පිරිවැය

නිෂ්පාදිතය වෙනුවෙන් පිරිවැය රැස් කරන මධ්‍යස්ථාන කිහිපයක් තිබෙන අවස්ථාවක ඒ සෑම පිරිවැය මධ්‍යස්ථානයකට ම පිරිවැය පිළිගත් ක්‍රමයකට අනුව බෙදාහැරිය යුතුය. එය බෙදා හැරීමේ ක්‍රියාපිළිවෙල ලෙස හැඳින්වෙන අතර එහි අනුපිළිවෙල පහත දැක්වේ.

**1. පොදුකාර්ය පිරිවැය රැස් කිරීම.**

ඒ ඒ වියදමට අදාළ වූ මූලාශ්‍රය ලියවිලි මඟින් පිරිවැය හඳුනා ගැනීමට සිදු වේ.

නිදසුන් ලෙස,

නිෂ්පාදන වත්කම් ක්ෂය වීම - පොදු ජර්නල් වවුචරය.

වක්‍ර වැටුප් - වැටුප් ලේඛනය.

විදුලි ගාස්තු - විදුලි බිල්පත හෝ වවුචරය.

**2. පොදුකාර්ය පිරිවැය ප්‍රතිපාදනය හෙවත් වෙන් කිරීම.**

ඒ ඒ පිරිවැය මධ්‍යස්ථාන වලට අදාලව පැහැදිලිව වෙන් කර හඳුනා ගත හැකි මූලාශ්‍ර ලේඛන වල ඇතුළත් පොදුකාර්ය පිරිවැය ඒ එක් එක් පිරිවැය මධ්‍යස්ථානයට ඇතුළත් කිරීම හෙවත් වෙන් කිරීම වේ.

නිදසුනක් ලෙස,

ඒ ඒ පිරිවැය මධ්‍යස්ථාන වලට අදාලව වෙන වෙනම විදුලි බිල්පත් ලැබීම දැක්විය හැක.

**3. පොදුකාර්ය පිරිවැය විභජනය**

ඒකකයකට සෘජුවම හා පැහැදිලිව හඳුනා ගත නොහැකි පොදුකාර්ය පිරිවැය සාධාරණ පදනම් මත බෙදයි. මෙසේ පොදුකාර්ය පිරිවැය ප්‍රාථමික විභජනය හා ද්විතික විභජනය ලෙස ආකාර දෙකකට සිදු කරනු ලබයි.

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය විභජනය පදනම් කිහිපයක්ම පහත දැක්වේ.

| පිරිවැය වර්ගය | විභජන පදනම |
|---|---|
| ගෙවල් කුලී, වරිපනම්, ගොඩනැගිලි නඩත්තු, විදුලිය | වර්ගඵලය හෝ බිම් ප්‍රමාණය |
| ජල බිල්පත්, විදුලි බිල්, දුරකථන ගාස්තු | පාවිච්චි කල ඒකක |
| වෛද්‍ය වියදම්, ආපනශාලා වියදම්, වක්‍ර වැටුප්, සුභසාධන වියදම්, සේවක රක්ෂණය, සේවක අධීක්ෂණ වියදම් | සේවක සංඛ්‍යාව |
| යන්ත්‍ර ක්ෂය වීම්, යන්ත්‍ර රක්ෂණය | යන්ත්‍ර වල වටිනාකම/ ධාරණ අගය |
| ගබඩා වියදම් | ද්‍රව්‍ය අධියාචනාපත්‍ර අනුපාතය හෝ ද්‍රව්‍ය භාවිත කල ප්‍රමාණය |
| නඩත්තු අංශයේ වියදම් | නඩත්තුවට වැය කල පැය ගණන |

**4.පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය**

නිෂ්පාදන මධ්‍යස්ථාන වලට රැස් වූ මුළු පොදුකාර්ය පිරිවැය පිළිගත් පදනමක් මත නිෂ්පාදිත ඒකක වලට ඇතුළත් කිරීම හෙවත් බෙදා වෙන් කිරීම මෙලෙස හඳුන්වයි. ඇස්තමේන්තුගත හෙවත් අයවැයගත පොදුකාර්ය පිරිවැය ඇස්තමේන්තුගත නිෂ්පාදිත ඒකක ප්‍රමාණය හෝ වෙනත් සුදුසු පදනමකින් බෙදූ විට පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය ලැබේ.

අන්තර්ග්‍රහණ අනුපාතයන් ගණනය කරන ආකාරයන්

**නිෂ්පාදන ඒකක පදනම**

$$\text{අන්තර්ග්‍රහණ අනුපාතය} = \frac{\text{ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය}}{\text{ඇස්තමේන්තුගත නිෂ්පාදන ඒකක ගණන}}$$

**සෘජු ද්‍රව්‍ය පිරිවැය පදනම**

$$\text{අන්තර්ග්‍රහණ අනුපාතය} = \frac{\text{ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය}}{\text{ඇස්තමේන්තුගත සෘජු ද්‍රව්‍ය පිරිවැය}}$$

**සෘජු ශ්‍රම පිරිවැය පදනම**

$$\text{අන්තර්ග්‍රහණ අනුපාතය} = \frac{\text{ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය}}{\text{ඇස්තමේන්තුගත සෘජු ශ්‍රම පිරිවැය}}$$

**ප්‍රාථමික පිරිවැය පදනම**

$$\text{අන්තර්ග්‍රහණ අනුපාතය} = \frac{\text{ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය}}{\text{ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය}}$$

**සෘජු ශ්‍රම පැය පදනම**

$$\text{අන්තර්ග්‍රහණ අනුපාතය} = \frac{\text{ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය}}{\text{ඇස්තමේන්තුගත සෘජු ශ්‍රම පැය}}$$

**යන්ත්‍ර පැය පදනම**

$$\text{අන්තර්ග්‍රහණ අනුපාතය} = \frac{\text{ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය}}{\text{ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය}}$$

නිෂ්පාදිතයේ මිල තීරණය කිරීමට මෙන්ම ව්‍යාපාරයේ දිගු කාලීන ලාභයටද මෙම නොපෙනෙන පිරිවැය බලපාන අතර පාලනයකින් හා නිවැරදි ආකාරයට ප්‍රතිපාදනය කළ යුතුමය. එය ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්මද තහවුරු කරයි.



කේ.ජී. කාංචනා සමරවීර
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# ආර්ථික විද්‍යාව සහ ගිණුම්කරණය

**ආර්ථික විද්‍යාව සහ ගිණුම්කරණය එකිනෙකට වෙනස් අරමුණ සහිතව වෙනස් මාවත් දෙකක ගමන්කරනුයේ මන්ද?**

ආර්ථික විද්‍යාවේ අරමුණ වනුයේ හිඟ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමයි. ආවස්ථික පිරිවැය සංකල්පය මෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. එහෙත් ගිණුම්කරණය දරණ ලද වියදමට සරිලන ප්‍රතිලාභයක් හිමිවීම පමණක් සැලකිල්ලට ගනී. මෙහිදී ආවස්ථික පිරිවැය සංකල්පයට වැදගත් බවක් හිමි නොවේ. එමනිසාවෙන් ගණනය කිරීම් සිදු කරන විටදී එකිනෙකට වෙනස් ක්‍රම අනුගමනය කරන්න සිදුවන අතර, එකිනෙකට වෙනස් පිළිතුරු හිමිවේ. පිරිවැය ගණනය කිරීමේදී හා ලාභය ගණනය කිරීමේදී ද එකිනෙකට වෙනස් පිළිවෙත් අනුගමනය කිරීමට සිදු වේ. එයට හේතු වී ඇත්තේ කුමක්දැයි පහත පරිදි අප විමසා බලමු.

**ගිණුම්කරණ ලාභය, ආර්ථික ලාභයක් ලෙස සැලකිය නොහැක්කේ මන්ද?**

ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය යනු එකිනෙකට වෙනස් ගණනය කිරීම් දෙකකි. ගිණුම්කරණ ලාභය වශයෙන් හඳුන්වන්නේ ආයතනයේ මුළු ආදායමෙන්, ගිණුම්කරණ පිරිවැය එනම් සෘජු පිරිවැය අඩුකළ පසු ලැබෙන අගයයි. ගිණුම්කරණ පිරිවැයට වඩා මුළු ආදායම වැඩි නම් එය ගිණුම්කරණ ලාභයක් ලෙසත්, අඩුයි නම් එය ගිණුම්කරණ අලාභයක් ලෙසත් හඳුන්වන ලබයි. ආර්ථික ලාභය වශයෙන් හඳුන්වන්නේ මුළු ආදායමෙන්, ආර්ථික පිරිවැය එනම් සෘජු සහ වක්‍ර පිරිවැය දෙකෙහිම එකතුව අඩු කළ පසු ලැබෙන අගයයි.

ආර්ථික ලාභයක් වීමට නම් සෘජු සහ වක්‍ර යන පිරිවැය දෙකම සැලකිල්ලට ගත යුතු වන අතර ගිණුම්කරණ ලාභය ගණනය කිරීමේදී සෘජු පිරිවැය පමණක් සැලකිල්ලට ගෙන වක්‍ර පිරිවැය නොසලකා හරිනු ලබයි. එබැවින් මෙහිදී අයිතිකරුවන් සතු සම්පත් වල ආවස්තික පිරිවැය සැලකිල්ලට ගැනීමක් සිදු නොවේ. එමනිසා ගිණුම්කරණ ලාභය යනු ආර්ථික ලාභයක් ලෙස සැලකිය නොහැක.

**ගිණුම්කරණ පිරිවැය, ආර්ථික පිරිවැයෙන් වෙනස් වනුයේ කෙසේද?**

නිශ්පාදන කටයුතු සඳහා භාවිතා කරන සියලුම සම්පත් වල පිරිවැය එනම් සෘජු සහ වක්‍ර පිරිවැය දෙකෙහි එකතුව ආර්ථික පිරිවැය ලෙස හඳුන්වනු ලබයි. නිෂ්පාදනයේදී සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් එනම් සෘජු පිරිවැය හා ප්‍රාග්ධන වත්කම් වල ක්ෂයවීම් වලින් පමණක් ගිණුම්කරණ පිරිවැය සමන්විත වේ.

ගිණුම්කරණයේදී පිරිවැය ගණනය කිරීමේදී ආයතනය සතු සම්පත් වල ආවස්ථික පිරිවැය හෙවත් වක්‍ර පිරිවැය සැලකිල්ලට නොගන්නා හෙයින්, ආර්ථික පිරිවැයට සාපේක්ෂව ගිණුම්කරණයෙන්, ආවස්ථික පිරිවැය පිළිබඳ ඌන තක්සේරුවක් ලබාදෙයි. එමනිසා ගිණුම්කරණ පිරිවැයට වඩා ආර්ථික පිරිවැය අර්ථානුකූල වේ. මෙලෙසින් පිරිවැය දෙකක් ගණනය කිරීමට හේතුව වනුයේ ආර්ථික විද්‍යාව සහ ගිණුම්කරණය යන ක්ෂේත්‍ර දෙකෙහි අරමුණු වල ඇති වෙනස හේතුවෙනි.

එනම් ආර්ථික විද්‍යානුකූලව එහි අරමුණ වනුයේ හිඟ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමයි. එමනිසා ආවස්ථික පිරිවැය සංකල්පය මෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. නමුත් ගිණුම්කරණයට අනුව දරණ ලද වියදමට සරිලන ප්‍රතිලාභයක් හිමිවීම පමණක් සැලකිල්ලට ගනී. එමනිසා මෙහිදී ආවස්ථික පිරිවැය සංකල්පයට වැදගත් බවක් හිමි නොවේ.

**ආර්ථික පිරිවැය, ආවස්ථික පිරිවැයට සමාන බව පිළිගත හැකිද?**

නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ඇති සියළුම සාධක වල කැපකළ මුදල්මය වටිනාකම හෙවත් ආවස්ථික පිරිවැය, ආර්ථික පිරිවැය ලෙස හඳුනාගත හැකිය. එය ඍජු සහ වක්‍ර පිරිවැය දෙකෙහි එකතුවෙන් නිර්මාණය වන අතර ආවස්ථික පිරිවැයද ඍජු සහ වක්‍ර යන පිරිවැය දෙකෙහි එකතුවෙන් සමන්විත වන නිසාවෙන්, ආවස්ථික පිරිවැය සංකල්පය සහ ආර්ථික පිරිවැය එකිනෙකට සමාන බව පැහැදිලිය.

**ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමේ පැවතියද ආයතනයක් අඛණ්ඩව නිෂ්පාදනයේ නිරත වනුයේ මන්ද?**

නිෂ්පාදන ආයතනයක මුළු ආදායම, මුළු පිරිවැයට සමාන වන විට එනම් එක් ඒකකයක මිල, සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වන විටදී නිෂ්පාදන ආයතනයේ ආර්ථික ලාභය ශූන්‍ය වේ. ආයතනය විසින් නිෂ්පාදනය සඳහා යොදාගන්නා ලද සියලුම සම්පත් වලට, අඩුම වශයෙන් ඒවායෙහි ආවස්ථික පිරිවැය හෝ පියවා ගැනීමේ හැකියාව ඇත. එනම් ප්‍රාමාණික ලාභ උපයා ගනී. එබැවින් කර්මාන්තය අතහැර දමා ආයෝජනය ඉවත් කරගැනීම වැළැක්වීමට තරම් ප්‍රමාණවත් ඉපයීමක් හිමිවන අතර එය ආවස්ථික පිරිවැය පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් බැවින් නිෂ්පාදකයා තවදුරටත් නිෂ්පාදන කටයුතු වල රැඳීසිටී.

ආර්ථික ලාභය ශූන්‍ය වීම යනු ප්‍රාමාණික ලාභ ලැබීමයි. එනම් නිෂ්පාදකයා බලාපොරොත්තු වන අවම ලාභය ලැබෙන බැවින් ආයතනය අඛණ්ඩව පවත්වාගනී. ආර්ථික ලාභ ශූන්‍ය නම් කර්මාන්තය තුළට පිවිසීමට හෝ ඉන් ඉවත්වීමට හෝ කිසිදු පෙළඹීමක් ආයෝජකයාට නොමැත.



එනුශි කවින්‍යා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# ඩොලරය ඇයි මෙච්චරම ගණන්?


| දළ දේශීය නිෂ්පාදිතය (2020) | ට්‍රිලියන ($) |
|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 20.93 |
| බ්‍රිතාන්‍යය | 3.12 |
| ඉන්දියාව | 2.87 |
| ජපානය | 5.38 |
| චීනය | 14.72 |
| ශ්‍රී ලංකාව | 0.08 |

ඉහතින් දැක්වෙන්නේ (2020) වසරේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ ප්‍රබල රටවල් කීපයක දළ දේශීය නිෂ්පාදිතයන් වල අගයන් කිපයකි. අප රටේ ආර්ථිකයේ ප්‍රමාණය අනික් රටවල් වලට සාපේක්ෂව ඉතා කුඩා බව දැන් ඔබට හොඳින් වැටහෙනු ඇත. මෙතරම් කුඩා ආර්ථිකයක් හිමි රටකට විදේශ වෙළඳාම තුළ කළ හැකි බලපෑම ඉතාමත් අල්පය. අපගේ සන්නම් නාම යටතේ භාණ්ඩ විදේශ වෙළඳපොළ ට ආනයනය කළත් නැතත්, අපනයනය කළත් නැතත් එය අනික් රටවල් වලට වැදගත් නොවේ. මේ පවතින ආර්ථික මට්ටමත් සමඟ අපට විදේශ වෙළඳාම්වල නිරත වෙනවානම් අපට සිදුවන්නේ විදේශ රටවල මුදල් ඒකක පිළිගැනීමටයි. ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට මෙතරම් ඉල්ලුමක් ඇති වී තිබෙන්නේ ඔවුන්ට තිබෙන ප්‍රබල ආර්ථික ශක්තිය හේතුවෙනි. ඔවුන් භාණ්ඩ අපනයනය හා ආනයනය නොකළහොත් බොහෝ රටවල ආර්ථිකය කඩාවැටෙනු ඇත. ලෝක වෙළෙඳාමේ විශාල පරිමාවක් මෙහෙයවන්නේ ඔවුන් විසිනි. එම නිසා ඩොලරයට විශාල ඉල්ලුමක් පවතින අතර එහි වටිනාකම ද ඉහළ අගයක් ගනී.

කෙසේවෙතත් වර්තමානයේ ශ්‍රී ලංකාව දැඩි විදේශ විනිමය අර්බුදයකට මුහුණ දී තිබේ. එනම් රුපියල දිනෙන් දින බාල්දු වීමකට ලක්වීමයි. එයට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් තාවකාලික විසඳුම් ලෙස අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම වැනි ක්‍රමවේද භාවිතා කළ ද රුපියල අවප්‍රමාණය වීම නතර වී නොමැත. ආනයන සීමා කළ ද මෙම තත්ත්වය උදාවී ඇත්තේ ඇයි ද යන්න සියලු දෙනාටම පවතින පොදු ගැටලුවකි. මෙහිදී විදේශ විනිමය අනුපාතිකය පිළිබඳව සරල හැඳින්වීමක් ලෙස, විදේශීය මුදල් ඒකකයකට හුවමාරු වන දේශීය මුදල් ඒකක ගණන ලෙස පැවසිය හැකිය. තවත් සරලව කිවහොත් ඩොලරයක් සඳහා ගෙවිය යුතු රුපියල් ප්‍රමාණයයි. එවිට ඩොලරයක මිල තීරණය වන්නේ විදේශ විනිමය වෙළඳපොළේ ඩොලර් ඉල්ලුම හා ඩොලර් සැපයුම මතයි.

මෙහිදී විනිමය වෙළඳපොළේ ඩොලර් සපයන මූලික සැපයුම්කරුවන් ලෙස අපනයනකරුවන් දැක්විය හැකිය. ඔවුන් විසින් ඔවුන්ගේ භාණ්ඩ හෝ සේවා විදේශ වෙළඳපොළවල් වලට අලෙවි කිරීමෙන් ඩොලර් උපයනු ලබයි. ඔවුන් ඒ ඩොලර් ශ්‍රී ලංකා රුපියල් බවට පත් කිරීම සඳහා ලංකාවේ විදේශ විනිමය වෙළඳපොළ ට එම ඩොලර් ඉදිරිපත් කරයි. මේ සඳහා විදේශ රටවල් වල සේවය කරන ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයන්, විදේශීය සංචාරකයන්, ලංකාවට ලැබෙන ඍජු විදේශ ආයෝජන සහ ආණ්ඩුවට ලැබෙන ඩොලර් ණය වැනි ක්‍රියාකාරකම් මගින්ද ලංකාවේ විනිමය වෙළඳපොළ ට ඩොලර් සැපයේ.

මේ ආකාරයෙන්ම විනිමය වෙළඳපොළේ ඩොලර් ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවෝද වේ. මේ අතරින් එක් කොටසක් වන්නේ ආනයනකරුවන් ය. ඔවුන් විදේශ රටවල් වලින් භාණ්ඩ ගෙන්වීමේදී ඒ සඳහා ගෙවීමට ඩොලර් අවශ්‍ය වේ. එම නිසා ඔවුහු දේශීය විනිමය වෙළඳපොළෙන් ඩොලර් ඉල්ලුම් කරති. තව ද ආණ්ඩුව ලබාගත් විදේශ ණය ගෙවීම සඳහා ද ඩොලර් අවශ්‍ය වන නිසා ආණ්ඩුව ද ඩොලර් ඉල්ලුම් කරයි. එලෙස මෙම ඩොලර් ඉල්ලුම හා සැපයුම මත ඩොලරයකට ගෙවිය යුතු රුපියල් ගණන තීරණය වේ.




කෙසේවෙතත් විදේශ විනිමය අර්බුදයට ආණ්ඩුව අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කොට ඩොලර් වලට තිබෙන ඉල්ලුම අඩු කිරීමට පියවර ගෙන තිබුණි. නමුත් අපට විදේශ විනිමය වෙළඳපොළ දෙස බැලීමේදී පෙනීයන්නේ තවමත් රුපියල දිනෙන් දින කඩාවැටෙන බවකි. එයට හේතුව කුමක්ද? ආණ්ඩුව මෙම ගත් තීරණය වැරදිද? සත්‍යවශයෙන් ම ආණ්ඩුව ගත් මෙම ක්‍රියාමාර්ගයේ කිසිඳු වරදක් නොමැත. ගැටලුව මතුවී තිබෙන්නේ මෙම ආනයන සීමා කිරීම නිසා අඩු වූ ඩොලර් ඉල්ලුමට වඩා වැඩි වේගයකින් ඩොලර් සැපයුම අඩුවී තිබීමයි. අප දැන් මේ පිළිබඳව සලකා බලමු.

වර්තමානයේ පවතින කොවිඩ් තත්ත්වය නිසා ලාංකීය ශ්‍රමිකයින් බොහෝ දෙනෙක්ට ඔවුන්ගේ රැකියා අහිමි විය. එලෙසම මෙම විදේශ ශ්‍රමිකයන් කොවිඩ් තත්ත්වය හමුවේ ලංකාවට ගෙන එන විට ආණ්ඩුව අනුගමනය කළ ප්‍රතිපත්තිය බොහෝ විදේශ ශ්‍රමිකයින්ගේ කෝපයට හේතු විය. තවද මෙම කොරෝනා වසංගතය හේතුවෙන් සංචාරක කර්මාන්තය මුළුමනින් ම අඩාලවීමකට ලක්විය. එමඟින් මෙතෙක් කාලයක් ලංකාව සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම ත් අහිමි විය. තවද බොහෝ අපනයන කර්මාන්ත ද අඩාල විය. මෙවැනි හේතූන් නිසා ශ්‍රී ලංකාවට ලැබෙන ඩොලර් ප්‍රමාණය බොහෝ ලෙස පහත වැටුනි. එමඟින් විනිමය වෙළඳපොළේ ඩොලර් සැපයුම බොහෝ ලෙස පහත වැටුනි. අනෙක් කරුණ ලෙස ආණ්ඩුව විසින් ලබාගත් විදේශ ණය පියවීම සඳහා බොහෝ ලෙස ඩොලර් ඉල්ලුම් කිරීමක් ද සිදුවෙමින් පවතී. මෙවැනි කරුණු නිසා අපට ආනයන සීමා කිරීමෙන් ලැබෙන්නට තිබූ වාසිය මුළුමනින් ම නැතිවී තිබේ. එම නිසා රුපියල දිනෙන් දින බාල්දු වීමකට ලක්වේ.

බොහෝ දෙනෙක්ට පවතින මීළඟ ගැටලුව වන්නේ මහ බැංකුවට මුදල් අච්චු ගැසීමේ හැකියාව පවතින බැවින් වැඩි වශයෙන් මුදල් අච්චු ගසා ඩොලර් මිලදී ගැනීමට හැකියාවක් පවතින්නේ ද යන්නයි. මෙම ක්‍රියාවලිය විදේශ විනිමය අර්බුදයට කිසිසේත් ම හිතකර ප්‍රතිපත්තියක් නොවේ. කිසිසේත් ම මෙම අර්බුදය මෙමගින් පාලනය කළ නොහැක. එයට හේතුව වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන්නේ රුපියල් වන නිසාවෙනි. අපට ඩොලර් අච්චු ගැසීමක් සිදුකළ නොහැක. මෙම සිදුවීමෙන් ඇතිවන ප්‍රතිඵලය වන්නේ රුපියල සම්පූර්ණයෙන් ම කඩා වැටීමයි. අප සරල උදාහරණයක් ගෙන බලමු,
දේශීය විනිමය වෙළඳපොළේ ඩොලර් 2 ක් සහ ශ්‍රී ලංකා රුපියල් 400 ක් ද පවතී. එවිට විනිමය වෙළඳපළේ ඩොලරයක මිල රු 200 කි (400/2). දැන් ඔබ සිතන්න විනිමය වෙළඳපොළේ පවතින ඩොලර් 2 එලෙසම තබාගෙන රුපියල් අච්චු ගැසීමක් මගින් විනිමය වෙළඳපොළේ පවතින රුපියල් ප්‍රමාණය (800) දක්වා වැඩි කිරීමකට ලක් වුවහොත්, එවිට ඩොලරයක මිල වන්නේ රු 400කි (800/2). එම නිසා මෙම ක්‍රියාමාර්ගය සම්පූර්ණ අසාර්ථක ක්‍රියාමාර්ගයකි.

වර්තමාන මහ බැංකු අධිපතිවරයා වන ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (14.50%) ලෙසත් නිත්‍ය ණය පහසුකම් අනුපාතය (15.50%) ලෙසත් ඉහළ දමන ලදි. බොහෝ දෙනෙක්ට ඇතිවූ ගැටලුව වූයේ මෙය කෙසේ ඩොලර් අර්බුදයට විසඳුමක් වන්නේ ද කියායි. ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් බහුජාතික සමාගම් තම භාණ්ඩ හා සේවා නිෂ්පාදන කටයුතු සිදු කරන බව ඔබ දන්නවා. මෙම සමාගම් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ශ්‍රමයෙන් භාණ්ඩ හා සේවා නිපදවා අපනයනය කර අධික ලාභ ලබයි. නමුත් ඒවාගෙන් උපයන ඩොලර් ඔවුහු ලංකාවට නැවත රැගෙන ඒමක් සිදු නොකරති. ඔවුහු ශ්‍රී ලංකාව තුළ පවතින ඔවුන්ගේ සමාගම්වල වැටුප් ගෙවීම වැනි වියදම් පියවීම සඳහා බැංකු ණය ලබා ගැනීම සිදු කරති. ඒ ඔවුන්ට ඩොලර් රුපියල් බවට හරවා වැටුප් ගෙවීමට, වඩා අඩු ණය පොලියක් යටතේ බැංකු ණයක් ගැනීම වාසිදායක වූ බැවිනි. නමුත් දැන් නිත්‍ය ණය පහසුකම් අනුපාතය වැඩි කිරීමත් සමඟ බැංකු ණය පොලී අනුපාත ද ඉහළ ගොස් ඇත. එම නිසා බහුජාතික සමාගම් වලට බැංකු ණය මගින් ඔවුන්ගේ වියදම් පියවාගැනීම අවාසිදායක වේ. එම නිසා ඔවුන්ට උපයන ඩොලර් වලින් කොටසක් ලංකාව තුළට ගෙන ඒමට සිදුවේ.

අවසාන වශයෙන් පැවසිය යුත්තේ, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට මෙවැනි සුළු පැලැස්තර ඇළවීමේ ක්‍රියාකාරකම් තුළින් කිසිසේත් ආර්ථිකය වේගයෙන් සංවර්ධනය කළ නොහැක. ස්ථිර වශයෙන් විදේශ විනිමය රට තුළට ගෙන ආ හැකි ව්‍යාපෘති සිදුකළ යුතුය. ශ්‍රී ලංකාවේ සාගරය හා ස්වාභාවික සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගත්තානම් මේ වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකය මීට වඩා හොඳ තැනක පවතී. මෙවැනි ව්‍යාපෘති ගැන පැවසූ විට සැමට ප්‍රථමයෙන් පවසන්නේ ඒ සඳහා විශාල වියදමක් යන බවයි. පැවසිය යුත්තේ එක දෙයක් පමණී. එය වියදමක් නොවේ ආයෝජනයකි. නිවැරදි ව්‍යාපෘතියක් සිදුකලානම් කෙටි කලකින් ඒ සඳහා ගෙවූ මුදල ආවරණය කරගැනීමටත්, ලාභ ලබමින් විදේශ විනිමය රට තුළට ගෙන ඒමටත් හැකිවනු නියතය.



R.M.P.U.B. රත්නායක
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# වෙළඳපොළ අසමත්වීම් හා රජයේ කාර්යභාරය

අප දන්නා පරිදි වෙළඳපොළ ආර්ථිකයක සිදු වන්නේ, මිල යාන්ත්‍රණය ඔස්සේ තීරණ ගනිමින්, ලාභය අරමුණු කරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමකි. බොහෝ පිරිසකගේ මතය වන්නේ, එමගින් ගනු ලබන තීරණ සමාජයේ යහපතට සෑම විටම දායක නොවන බවයි. මෙලෙස වෙළඳපොළ ආර්ථිකයකට සමාජයට අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවා සැපයීමට ඇති නොහැකියාවත්, මිනිස් වුවමනා වඩා ප්‍රශස්ත ලෙස හා කාර්යක්ෂමව ඉටු වන පරිදි, සමාජයට යහපතක් කිරීම උදෙසා හිඟ සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන් කිරීමට අපොහොසත් වීමත් නිසා වෙළඳපොළ අසමත්වීම් ඇති වේ. එලෙස වෙළඳපොළ ආර්ථිකයේ පවතින ඇතැම් දුර්වලතාවයන් ඉවත් කිරීමට රජය මැදිහත් වන අයුරු අප දැක ඇත. ඇතැම් විට එම මැදිහත්වීම හේතුවෙන් තිබූ ගැටලු තවත් උග්‍ර වීම හෝ නොතිබූ ගැටලු පැන නැගිය හැක. එම ආණ්ඩුවේ අසමත් වීම කෙසේ වුවද, දුර්වලතාවයන් නිෂ්ක්‍රීය කොට ප්‍රශස්ත ආර්ථිකයක් ගොඩ නැගීම උදෙසා වෙළඳපොළ ආර්ථිකයකට රාජ්‍ය මැදිහත්වීම අත්‍යාවශ්‍ය වන බව අප සියලුදෙනා අවබෝධ කරගත යුතුය. ඒ අනුව මෙම ලිපිය තුළින් අවසානයේදී ඔබට සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා වෙළඳපොළ ආර්ථිකයකට රජය මැදිහත් වන ආකාරය පිළිබඳ සරල අදහසක් ඇති වනු ඇත.

පහතින් සඳහන් වන්නේ වෙළඳපොළ ආර්ථික ක්‍රමය අසමත් වීමට හේතු වේ.

1. සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවය.
2. ආදායම් බෙදීයාමේ විෂමතාවය.
3. සාර්ව ආර්ථික අස්ථායිතාව.

මෙතැන් පටන් ඉහතින් සඳහන් කරන ලද වෙළඳපොළ අසමත් වීම් පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබා ගනිමු.

සාමාන්‍යයෙන් සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවයක් හට ගන්නේ, වෙළඳපොළ ආර්ථිකයක මිල මගින් නිකුත් කරන සංඥා වලට අනුව ආර්ථිකය මෙහෙයවන අවස්ථා වලදීය. අප තේරුම් ගතයුතු වන්නේ මෙම ගැටලුව නොමැති නම්, කිසියම් භාණ්ඩයක මිල, එම භාණ්ඩයෙන් අමතර ඒකකයක් නිෂ්පාදනය කිරීමට යන ආන්තික පිරිවැයට සමාන වන බවයි. එනම් P=MC වේ. මෙම තත්ත්වයේදී පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ද උපරිම වේ. ගැටලුව මතු වන්නේ, මෙම තත්ත්වයෙන් බැහැර වූ විටය. එනම් කිසියම් භාණ්ඩයක මිල, එහි ආන්තික පිරිවැයට වඩා අඩු හෝ වැඩි වූ විටය. එනම් P≠MC, P>MC හෝ P<MC වූ විටය.

සරලව ගත් කළ ඔබ විසින් අවබෝධ කර ගත යුතු වන්නේ ආර්ථිකයක් සතු හිඟ සම්පත් සමාජයට හිතකර අයුරින් බෙදී නොයාම මෙමගින් පිළිබිඹු කරන බවයි. වෙළඳපොළ ආර්ථිකයක් මගින් මාර්ග සංඥා, ප්‍රදීපාගාර වැනි පොදු භාණ්ඩ නොසැපයීමත්, සිනමාහල්, කෞතුකාගාර ආදි අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්තව නොසැපයීමත්, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සුබසාධන භාණ්ඩ ප්‍රමාණවත් තරම් නිෂ්පාදනය නොවීමත්, මත්පැන්, දුම්වැටි වැනි අවගුණ භාණ්ඩ නිපදවීමත් වැනි හේතු නිසා සම්පත් බෙදීයාමේ ආකාර්යක්ෂමතාව හට ගනී. ඉහත කී අකාර්යක්ෂමතා මගහරවා ගැනීමට වෙළඳපොළ ආර්ථිකයකට රජය මැදිහත් වී පොදු භාණ්ඩ සැපයීමත්, තොරතුරු සම්පාදනයත්, අර්ධ පොදු හා සුභසාධන භාණ්ඩ වල ඌන ප්‍රමාණ සැපයීමත් කළ හැක.

මීළඟට අප අවධානය යොමු කරනුයේ, ආදායම් බෙදීයාමේ විෂමතාවය හෙවත් සම්පත් බෙදීයාම අසාධාරණ වීම කෙරෙහිය. සාමාන්‍යයෙන් රටක ආදායම හා ධනය එරට කුටුම්භ අතර සාධාරණව බෙදී නොයාම නිසා සමාජීය, ආර්ථික හා දේශපාලනික වශයෙන් විවිධ අයහපත් සිදුවීම් ඇතිවන බව අප දනිමු. සාධාරණත්වය ඇති වීමට නම් ආදායම හා ධනය අවම විෂමතාවයක් යටතේ එරට පුද්ගලයන් අතරේ බෙදා හැරිය යුතුය. යම් පුද්ගලයෙකුගේ ආදායම කොපමණ ද යන්න තීරණය වන සාධක ඔබ දන්නෙහිද? සාධක මිලට අමතරව පුද්ගල අධ්‍යාපනය, දේපල උරුමය, කැපවීම, දක්ෂතාවය හා වාසනාව වැනි සාධක ද බලපායි. මෙම විෂමතා අවම කිරීමට ධන ප්‍රතිව්‍යාප්තියත්, අනුක්‍රමික බදු පැනවීමත් රජයට කළ හැක.

අවසාන වශයෙන්, සාර්ව ආර්ථික අස්ථායිතාවය වටහාගනිමු. වෙළඳපොළ ආර්ථිකයක, සමස්ත ඉල්ලුමේ හට ගනු ලබන විවිධ වෙනස්වීම්, එරට සාර්ව ආර්ථික විචල්‍යයන් වල මිල මට්ටම, සමස්ත නිමැයුම, ගෙවුම් ශේෂය වැනි දෑ මත හිතකර නොවන උච්චාවචනයන් ඇති කිරීම නිසා මෙම තත්ත්වය හටගනී. සමස්ත ආර්ථිකය ස්ථායීව පවත්වා ගැනීමට නම්, එරටෙහි සේවා නියුක්තිය ඉහළ නැංවීම, උද්ධමන පීඩනය අඩු කිරීම, ගෙවුම් ශේෂ හිඟය අඩු කිරීම වැනි දෑ කිරීම ආණ්ඩුවේ කාර්යභාරයයි.

මේ අනුව පෙනී යන්නේ, වෙළඳපොළ ආර්ථිකයක හටගනු ලබන දුර්වලතා හේතුවෙන් ඉහත කී වෙළඳපොළ අසමත්වීම් ඇතිවන බවත්, ඒවා දුරු කරලීමට රජයක් විසින් රජයේ අසාර්ථකවීම් වලින් තොරව මැදිහත්වී රජයේ කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමට වගබලා ගත යුතු බවයි.



කේ.ඩී.ඩී.එම්.පෙරේරා
ප්‍රථම වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# මුදල්, මුදල් වර්ග සහ ණයපත් පිළිබඳව ඔබ දන්නවාද?

මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වන්නේ මුදල්, මුදල් වර්ග සහ ණයපත් පිළිබඳ ඔබේ දැනුම ආවර්ජනය කිරීමයි.

**මුදල්**

මුදල් යනු, භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේදී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා වූ ඕනෑම දෙයකි. මුදලේ ප්‍රධාන කාර්යයන් හතරක් පවතින අතර ඒවා නම්,

1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම යනු, ගනුදෙනු කිරීම නැතහොත් භාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කර ගැනීමේදී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීමයි. මෙම කාර්යය නිසා මුදල් වෙනත් වත්කම් වලින් පැහැදිලිව වෙන් කොට හඳුනා ගත හැකි ය. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති ද්වීක සමපාතය, ප්‍රවාහනය, ගබඩා කිරීම, කුඩා කොටස් වලට බෙදීම ආදී ගැටලු බොහෝමයක් මුදල් භාවිතය නිසා නිරාකරණය විය.

2. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම.
අවදානමකින් හා අපහසුතාවයකින් තොරව අනාගත අවශ්‍යතා සඳහා වටිනාකම රැස්කර තබා ගැනීම සඳහා මුදල් යොදා ගැනීම වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම යන්නෙන් අදහස් කෙරේ. භාණ්ඩ වලින් වටිනාකම රැස්කර ගැනීමේ දී ගබඩා කිරීමේ අපහසුව, ඉක්මනින් ක්ෂය වීම ආදී ගැටලු පැන නැගුණද මුදල් වලින් වටිනාකම රැස්කර ගැනීමේ දී එම දුෂ්කරතා ඇති නොවේ. වටිනාකම රැස්කර ගැනීමට වැඩි දෙනෙක් මුදල් භාවිතා කරන්නේ මුදල් පූර්ණ ද්‍රවශීල වත්කමක් වන නිසාය. මුදලේ ක්‍රය ශක්තිය ස්ථාවර මට්ටමක පැවතීම මුදලේ මෙම කාර්යය වඩාත් කාර්යක්ෂම කරනු ඇත.

3. ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම.
ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම යනු, සෑම භාණ්ඩයකම හා සේවාවකම වටිනාකම් අතර වෙනස හඳුනා ගත හැකි වීම හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීමට හැකියාව ලැබීමයි. මුදල, වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම නිසා ව්‍යාපාර ගිණුම්කරණය, ජාතික ගිණුම්කරණය, රාජ්‍ය අයවැයකරණය, ගෙවුම් ශේෂ ලේඛනය සැකසීම ආදිය මූල්‍ය වාර්තාකරණය පහසු වී ඇත.

4. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
කල් පසුවී කරනු ලබන ගෙවීම් කාර්යක්ෂමව සිදු කිරීමට මුදල් යොදා ගැනීමට ඇති හැකියාව මෙයින් කියැවේ. ව්‍යාපාර ආයතන භාණ්ඩ ණයට අලෙවි කිරීමේ දී හා මූල්‍ය ආයතන ණය සැකසීමේදී එම ගෙවීම් සමාප්ති කිරීමට කාලයක් ගත වේ. අවිනිශ්චිතතාවයන්ගෙන් හෝ අවදානමකින් තොරව එම ගෙවීම් නිම කිරීමට මුදල් භාවිතා කිරීම නිසා හැකියාව ලැබී ඇත.

## මුදල් වර්ග

1. ව්‍යවහාරික මුදල්

ව්‍යවහාරික මුදල් යනු, යම් නෛසර්ගික වටිනාකමක් අන්තර්ගත නොවන නමුත් කිසියම් වටිනාකමක් නියෝජනය කිරීම සඳහා මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු වන අතර ව්‍යවහාර මුදල් රට තුළ ඕනෑම ගනුදෙනුවක් කිරීමට නීතියෙන් වලංගු වන අතර ව්‍යවහාර මුදල් පූර්ණ ද්‍රවශීලතාවයකින් යුක්ත වේ.

2. බැංකු මුදල්

ජංගම ගිණුම් හෙවත් ඉල්ලුම් තැන්පතු වල ඇති ශේෂ, බැංකු මුදල් ලෙස අදහස් කෙරේ. චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකි ඉල්ලුම් තැන්පතු ශේෂ, බැංකු මුදල් ලෙස අදහස් වේ.

3. ආසන්න මුදල්

වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කරනමුත් හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා නොකරන ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු වත්කම් වේ. මේවා ඉක්මනින්ම හුවමාරු මාධ්‍යයක් ලෙස පෙරළා ගත හැකිය.

උදා: ඉතුරුම් තැන්පතු, ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු

4. මුදල් ආදේශක

වටිනාකමේ සන්නිධියක් වශයෙන් ක්‍රියා නොකරන නමුත් තාවකාලික හුවමාරු මාධ්‍යයක් වශයෙන් කටයුතු කරන උපකරණ වේ.

උදා: ණයපත්, හරපත්

5. විද්‍යුත් මුදල්

මුදල්, විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් ගබඩා කර තබා මෘදුකාංග මගින් ගනුදෙනු සඳහා යොදා ගන්නා ක්‍රමවේදය, විද්‍යුත් මුදල් වශයෙන් සැලකේ.

උදා: ණයපත්, හරපත්, e-banking, easy cash, bitcoin

## ණයපත් මුදල් ලෙස නොසලකනුයේ මන්ද?

යම් මූල්‍ය ආයතනයක් විසින් අනුමත වූ මුදල් සීමාවන් යටතේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමටත්, අවශ්‍ය විටෙක මුදල් ලබා ගැනීමටත්, අවසරය ලබා දෙමින් නිකුත් කරනු ලබන විද්‍යුත් කාඩ්පත, ණයපතයි. කෙසේ වෙතත් ණයපත් මුදල් ලෙස නොසලකයි. ඊට බලපාන හේතූන් දෙකක් පවතී.

1. මුදල් වලින් ඉටුකරන සියලු කාර්යයන් ණයපත් මගින් ඉටු නොවීම.


ණයපත්, වටිනාකමේ සන්නිධියක් වශයෙන් ක්‍රියා නොකරන අතර තාවකාලික හුවමාරු මාධ්‍යයක් වශයෙන් පමණක් කටයුතු කරයි. එමනිසා ණයපත් මුදල් ලෙස නොසැලකේ.

2. ණයපත් මගින් ගනුදෙනුකරුවාට ලබාදෙන උපරිම ණය සීමාව ඉක්ම වූ පසු තවදුරටත් ණයපත ප්‍රයෝජනයට ගනිමින් ගනුදෙනු කිරීමට නම් අදාළ මූල්‍ය ආයතනයට ණය මුදල ගෙවිය යුතු වීම.

ණයපත් වූ කලී සමාගමක් / පුද්ගලයෙක් කිසියම් සමාගමකින් කෙටි කාලීන ණය මුදල් ලබා ගැනීමේ වැඩපිළිවෙළකි. කෙටි කාලීන හුවමාරු මාධ්‍යයක් එමගින් සැපයුන ද ණයපත් ගිණුම පියවීමේදී හුවමාරු මාධ්‍ය වශයෙන් මුදල් යොදා ගැනීමට ණයපත් හිමියාට සිදුවෙයි. ගනුදෙනුව සම්පුර්ණ වන්නේ මුදල් වලින් ණයපත් පිය වූ පසුවය. එම නිසා ණයපත්, මුදල් ලෙස නොසැලකේ.



පූජනී පෙරේරා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# ව්‍යවසායකත්වය, ව්‍යවසායකයා හා එහි වැදගත්කම

**ව්‍යවසායකත්වය**

ව්‍යවසායකත්වය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද, යන්න හැදෑරීමට ගත හැකි හොඳම මූලාශ්‍රය වන්නේ විද්වතුන් ඒ සම්බන්ධව ඉදිරිපත් කර ඇති නිර්වචනයි. ඒ සඳහා අපට ගත හැකි හොඳම උදාහරණය වනුයේ ව්‍යවසායකත්වය පිළිබඳ පර්යේෂණ ගණනාවක් සිදුකළ විලියම් ඩී. බයිග්‍රේව් මහතා විසින් ඉදිරිපත් කරන ලද නිර්වචනයයි. එනම්,

*"අවස්ථාවක් උදා කරගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යවසායකයෙකි. අවස්ථාව උදාකරගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේදී සම්බන්ධ වන සියලු කටයුතු හා කාර්යය ව්‍යවසායකත්ව ක්‍රියාවලියට ඇතුළත් වේ."*

- විලියම් ඩී. බයිග්‍රේව්-

මෙම නිර්වචනයට අනුව කිසියම් පුද්ගලයකු විසින් අවස්ථාවක් හඳුනාගෙන සංවිධානයක් ආරම්භ කිරීමට ගන්නා උත්සාහයේ සිට සංවිධානය කිරීම තෙක් ගනු ලබන සියලු ක්‍රියාමාර්ග ව්‍යවසායකත්වය යන්නට ඇතුළත් වන බව පැහැදිලි කර ගත හැකිය. ව්‍යවසායකත්වය ක්‍රියාවලියක මූලාරම්භය වන්නේ වෙළඳපොල ගවේෂණයන් මගින් නව ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමයි.

තවත් උදාහරණයක් ලෙස ආර්ථික විද්‍යා පිළිබඳ විශේෂඥයෙකු වන ජෝශප් ෂුම්පීටර් මහතාගේ නිර්වචනය අපට හඳුනාගත හැකිය. ඔහු පවසන ආකාරයට ව්‍යවසායකත්වය යනුවෙන් අදහස් වන්නේ නව භාණ්ඩ හා සේවා වෙළඳපොළට හඳුන්වා දීමෙන් හා නව නිෂ්පාදන සම්පත් භාවිතා කර භාණ්ඩ හා සේවා නිපදවීම මගින් පවත්නා වෙළෙඳපොළ ක්‍රමය වෙනස් කිරීමයි. මේ අනුව සාර්ථක ව්‍යවසායෙකු වීමට නම් පවත්නා වෙළෙඳපොළ නිර්මාණාත්මක දෘෂ්ටියකින් ගවේෂණය කළ යුතුය.

*"නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි."*

- ජෝශප් ෂුම්පීටර් -

මේ අනුව බලන කල අපට විවිධ වූ කෝණ ඔස්සේ ව්‍යවසායකත්වය යන්න නිර්වචනය කළ හැකිය. මෙවැනි වූ නිර්වචන සැලකිල්ලට ගෙන "ව්‍යවසායකත්වය යනු, මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අවස්ථා මතු කරමින්, අවදානම් කළමනාකරණය කරමින් කෙරෙන නව්‍යතා සම්පාදන ක්‍රියාවලියයි" යනුවෙන් ව්‍යවසායකත්වය යන්න සරලව අර්ථ දැක්වීමට හැකි වෙයි.

ව්‍යවසායකත්වය යනු ලෝකයේ සෑම රටකම ආර්ථික වර්ධනයට අත්‍යවශ්‍ය අංගයක් බවට වර්තමානය වන විට පත් වී තිබෙන බව අපට පැහැදිලි වෙයි.

## ව්‍යවසායකයා

වෙළඳපල තුල පවතින අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා සපුරාලීම සඳහා නව්‍යතා සම්පාදනය කරන්නා ව්‍යවසායකයෙකු ලෙස හඳුන්වනු ලබයි. ව්‍යවසායකයා යනු අනිකුත් ව්‍යාපාරිකයන්ගෙන් වෙනස්වන වෙනස් ආකාරයේ නිමවුම් නිර්මාණය කරන වෙනස්ම වූ නව්‍යතා සම්පාදනයට යොමුවන නිර්මාණාත්මක මෙන්ම සුවිශේෂී වූ හැකියාවන්ගෙන් යුක්ත වූ අයෙකි. ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යය වන්නේ, නව්‍යතා සම්පාදන ක්‍රියාවලිය හෙවත් ව්‍යසායකත්ව ක්‍රියාවලිය පවත්වාගෙන යාමයි.

ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම කාර්යයක් සිදු කිරීමේදී යම් ප්‍රමාණයක අවදානමක් දැරීමට සිදුවේ. එසේම ව්‍යවසායකයාටද වෙළඳපොල තුළට නව්‍යතා හඳුන්වා දීමේ දී විවිධ වූ අවදානම් වලට මුහුණ දීමට සිදුවේ. එසේ වුවද ව්‍යවසායකයාගේ ප්‍රධාන ලක්ෂණය වන්නේ, ඔවුන් විසින් එම අවදානම් මගනොහැර ඒවාට සාර්ථකව මුහුණ දීමයි. ව්‍යවසායකයා සෑම විටම අවදානම් භාරගැනීමට ඇල්මක් දක්වයි. එය ව්‍යසායකයාගේ සුවිශේෂී ගුණාංගයක් ලෙස සැලකිය හැකිය.

ව්‍යවසායකයන් සෑමවිටම ස්වාධීනව කටයුතු කරයි. එනම් ඔවුන් කිසිවිටෙකත් බාහිර පාර්ශවයකගේ අදහස්, බලපෑම් වලට යටත් නොවී තමාගේ අභිමතය පරිදි කටයුතු කරයි.
එසේම, ව්‍යවසායකයා යනු ව්‍යාපාරිකයෙකු නොවේ. ව්‍යවසායකයා තමාගේම සංකල්පයක් හෝ අදහස් අනුව මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ලීමට ස්වකැමැත්තෙන් ඉදිරිපත් වන්නෙකි. එහෙත් ව්‍යාපාරිකයා කරනුයේ දැනටමත් පවතින වෙළඳපොල ක්‍රමය තුල ඇති අදහසක් හෝ සංකල්පයක් අනුව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමයි. ව්‍යාපාරිකයාට තම ස්වකැමැත්ත අනුව කටයුතු කිරීමට වෙළෙඳපොළ තුළ ඉඩක් නොමැත. ව්‍යවසායකයන් සෑම විටම තමන්ගේ ව්‍යාපාරයක් සිදු කරගෙන යමින් ස්වාධීනව මුදල් ඉපයීමට කැමැත්තක් දක්වනු ලබයි. ව්‍යවසායකයාගේ ප්‍රධානියා ව්‍යවසායකයාමය. ඔහුටත් කිසිවිටෙක කිසිවෙකුට යටත් වීමට සිදු නොවේ.

## නූතන සමාජය තුල ව්‍යවසායකත්වයේ ඇති වැදගත්කම

අප ජීවත් වන නූතන සමාජය ශීඝ්‍රයෙන් වෙනස්වීම් වලට ලක් වෙමින් පවතී. එම වෙනස් වීමට කාලානුරූපීව පුද්ගලයන්ගේ අවශ්‍යතා හා වුවමනා ද වෙනස් වීමට ලක්වී තිබේ. එම නිසා නූතන සමාජයේ සිදුවන සක්‍රීය වෙනස් වීමට මුහුණ දීමට හැකි නව්‍යතා සම්පාදනය කිරීමේ අවශ්‍යතාවයක් වෙළෙඳපල තුල ඇති වෙයි. ඒ සඳහා අවශ්‍ය නව්‍යතා සම්පාදනය කිරීමේ හැකියාව පවතින්නේ ව්‍යවසායකයන්ට බැවින් ව්‍යවසායකත්වය වැදගත් අංගයක් ලෙස සැලකිය හැකිය.

එසේම, පාරිභෝගිකයන් අතර මෙන්ම ව්‍යාපාර අතරද, වෙළඳපොල තුල මේ වන විට තියුණු තරඟයක් පවතී. එම නිසා පවතින තරඟයට මුහුණ දී අනෙකුත් තරඟකරුවන්ට වඩා වැඩි ලාභයක් උපයාගැනීමට නම්, ඔවුන්ට වඩා වෙනස් ආකාරයට කටයුතු කිරීමට සිදුවේ. එසේ වෙනස් ලෙස කටයුතු කළ හැක්කේ, තරඟකරුවන්ට වඩා වෙනස් නව්‍යතා නිෂ්පාදනය මගිනි. එවැනි නව්‍යතා නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇත්තේ, ව්‍යවසායකයන්ට බැවින් පවතින නූතන තරඟකාරී සමාජයට ව්‍යවසායකත්වය වැදගත් අංගයක් ලෙස සැලකිය හැකි වේ.

එමෙන්ම, ව්‍යවසායකයන් විසින් සෑම විටම නව ව්‍යාපාර බිහි කරනු ලබයි. එම නිසා එම ව්‍යාපාර හරහා රැකියා නිර්මාණය කිරීමේ හැකියාවක් ව්‍යවසායකයන් සතුව පවතී. එය චක්‍රානුකූලව රට තුල පවතින සේවා වියුක්තියට පිලියමක් ලෙස යොදා ගැනීමට හැකි වේ. එම නිසා ව්‍යවසායකත්වය රටකට වැදගත් අංගයක් ලෙස සැලකීමට හැකි වේ.

මේ අනුව බලන කල ව්‍යවසායකත්වය යනු රටකට නැතිවම බැරි අත්‍යවශ්‍ය අංගයක් බව අපට පැහැදිලි වේ.

අවසාන වශයෙන්, අධ්‍යනය කල යුතු තවත් කරුණක් වනුයේ, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර පවතින සම්බන්ධතාවයි. මෙම ක්‍රියාවලීන් දෙකම පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කරනු ලබයි. එහෙත් ව්‍යවසායකයින් විසින් වැඩි වශයෙන් ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය කර ගැනීම හා නව්‍යතා සම්පාදනය යන කටයුතු වල නිරත වීම හේතුවෙන් ව්‍යවසායකත්වය, ව්‍යාපාර වලින් වෙනස් වනු ලබයි.

මේ අනුව, සියලු ව්‍යවසායන් ව්‍යාපාර වන බවත්, එහෙත් සියලු ව්‍යාපාර ව්‍යවසායන් නොවන බවත් අපට නිගමනය කල හැකිය.



ඉෂාරා සෙව්වන්දි
තෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# නිවැරදි ප්‍රාග්ධන ආයෝජන තීරණයකට යොමුවෙමු.

ප්‍රාග්ධන ආයෝජන තීරණ යන පාඩම ඔබට 13 වන ශ්‍රේණියේ ගිණුම්කරණ විෂය මාලාවේ නිපුණතා මට්ටම් 16.2 යටතේ හමුවේ. මෙම කොටසින් ඔබට අ.පො.ස උසස් පෙළ විභාගයේ දී පළමු පත්‍රයේ ප්‍රශ්න 2ක් ද, දෙවන පත්‍රයේ ලකුණු 10ක ප්‍රශ්නයක්ද හිමිවේ. අනෙකුත් ප්‍රශ්න වලට සාපේක්ෂව මෙම ප්‍රශ්නය පහසු වන නිසා අනිවාර්යයෙන්ම ඔබට ඉතා පහසුවෙන් ලකුණු රැස් කර ගෙනිමේ හැකියාවක් පවතී. මෙහිදි ප්‍රාග්ධන ආයෝජන තීරණ යනු කුමක්ද?, එහි වැදගැත්කම, ආයෝජන ඇගයීම් සිදුකරන ශිල්පක්‍රම, හා එමගින් තීරණ ගනු ලබන ආකාරය පිලිබඳව ඉතා කෙටියෙන් සරල පැහැදිලි කිරීමක් කර ඇත.

ප්‍රාග්ධන ආයෝජන තීරණ යනු අනාගත වර්ෂ කීපයක් පුරා ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවෙන් ව්‍යාපාරයක්, රජයක්, හෝ යම් පුද්ගලයෙක්, අරමුදල් දිගුකාලීන ව්‍යාපෘති වල යෙදවීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණය යි. මෙහි ව්‍යාපෘතියක් ලෙස හඳුන්වන්නේ යම් කාලච්ඡේදයක් තුළ අනාගත ප්‍රතිලාභ අපේක්ෂාවෙන් යම්කිසි ආයෝජනයකට කරනු ලබන සැලැස්මයි. නිදසුන් ලෙස නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම, ස්ථාවර වත්කම් මිලදී ගැනීම, අධිවේගී මාර්ග තැනීම වේ. අරමුදල් දිගුකාලීන බැඳීම් වල යෙදවීම, එනම් ප්‍රාග්ධන ආයෝජන තීරණ වර්ග කිහිපයක් පවතිනවා.

- ආයතන පුළුල් කිරීම
- පවතින වත්කම් වෙනුවට නව වත්කම් ස්ථාපනය නම් ප්‍රතිෂ්ඨාපනය කිරීම
- විවිධාංගීකරණය කිරීම
- නවීකරණය කිරීම

ආයෝජන අවස්ථා කිහිපයක් පවතින විට කුමන ආයෝජන අවස්ථා තෝරාගත යුතුද යන්න තීරණය කිරීම ව්‍යාපෘති ඇගයීම ලෙස අර්ථ දක්වයි. ව්‍යාපෘති ඇගයීමකින් සිදුවන්නේ ව්‍යාපාරයකට අරමුදල් දිගුකාලීන ව්‍යාපෘතිවල යෙදවීම සම්බන්ධයෙන් නිවැරදි තීරණ ගැනීමයි. එම නිසා ආයෝජන තීරණ වැදගත් වීමට හේතු කිහිපයක් පවතී.

01. යොදන ප්‍රාග්ධනය විශාල වීම
02. අවදානමක් තිබීම
03. දිගුකාලීන බව
04. ආපසු හැරවිය නොහැකි වීම
05. ව්‍යාපාරයේ වර්ධනය, අනාගතය, ව්‍යාපාරයේ වෙළෙඳපොළ කොටස, යනාදිය ආයෝජන තීරණ මත රඳා පැවතීම

ඉහත කී කරුණු නිසාවෙන් ආයෝජන තීරණ ව්‍යාපාර ආයතනයකට ඉතා වැදගත් වන අතර ආයෝජන තීරණ ගැනීමේ දී පියවර කිහිපයක් අනුගමනය කළ යුතුවේ.

01. ප්‍රාග්ධන ආයෝජන අවස්ථා පුරෝකතනය කිරීම
02. විකල්ප ආයෝජන ව්‍යාපෘති හඳුනාගැනීම
03. මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීම
04. විකල්ප ආයෝජන ඇගයීමට ලක් කිරීම
05. වඩාත් සුදුසු ව්‍යාපෘතිය තෝරාගැනීම හා අනුගමනය කිරීම
06. අනුගමනය කළ ව්‍යාපෘතියට මුදල් යෙදවීම හා ක්‍රියාත්මක කිරීම

ආයෝජන ක්‍රියාවලියකදී වඩාත්ම වැදගත් පියවර වන්නේ මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමයි. අප ආයෝජන තීරණයක් ගනු ලබන්නේ ලාභය මත නොව මුදල් ප්‍රවාහය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුවයි. ඒ සඳහා පළමුව ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු කළ යුතුයි. ව්‍යාපෘතියක් වෙනුවෙන් මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේ දී වැදගත් කරුණු කිහිපයක් පවතී.

- ව්‍යාපෘතිය ආරම්භ කළ පසු අනාගතයේ දී ලැබිය හැකි මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම ලෙස සැලකිල්ලට ගත යුතුයි.
- ව්‍යාපෘතියක් ඇගයීම වෙනුවෙන් අනාගතයේ දී දරන ලද පිරිවැය (ගිලුණු පිරිවැය) මුදල් ප්‍රවාහයන්වල දී සැලකිල්ලට නොගත යුතු යි.
- ඕනෑම වර්ෂයක් තුළ ඇතිවන මුදල් ප්‍රවාහයන් වර්ෂය අවසානයේ සිදුවන බව උපකල්පනය කල යුතුයි.
- ව්‍යාපෘතියේ මූලික ම ආයෝජනය යොදන වර්ෂය 0 වන වර්ෂය ලෙස සැලකිය යුතු යි.
- ව්‍යාපෘතිය තුළ මුදල් නොවන ප්‍රවාහයන් නොලසකා හැරිය යුතු යි.
- ලාභය ගණනය කිරීමේ දී උපචිත පදනම යොදාගන්නා නිසා ඇගයීමකදී ගිණුම්කරණ ලාභය යොදාගත නොහැකි ය.

**ආයෝජන තීරණ අගය කිරීම**

ප්‍රාග්ධන ආයෝජන ක්‍රියාවලියේ ප්‍රධානතම අවස්ථා වන්නේ ආයෝජන තීරණ ඇගයීමට ලක් කිරීමයි. ඒ සඳහා යොදාගන්නා ශිල්ප ක්‍රම පහත පරිදි වේ.

ආයෝජන ඇගයීම් සිදුකරන ශිල්ප ක්‍රම

වට්ටම් නොකල ශිල්ප ක්‍රම

මුදලේ කාල අගය සැලකිල්ලට නොගනී.

1. පිළිගෙවුම් කාල ක්‍රමය
2. ආයෝජන ප්‍රතිලාභ අනුපාත ක්‍රමය

වට්ටම් කල ශිල්ප ක්‍රම

මුදලේ කාල අගය සැලකිල්ලට ගනී.

1. ශුද්ධ වර්තමාන අගය ක්‍රමය

**වට්ටම් නොකල ශිල්ප ක්‍රම**

01. පිළිගෙවුම් කාල ක්‍රමය

ව්‍යාපෘතිය සඳහා යොදන මුදල හෝ පිරිවැය නැවත අයකර ගැනීමට ගතවන කාලය පිළිගෙවුම් කාල ක්‍රමය වේ. මෙහිදි ව්‍යාපෘතිවල පිළිගෙවුම් කාලය අඩුම ව්‍යාපෘතිය, යෝග්‍යතම ව්‍යාපෘතිය ලෙස අප තෝරා ගනිමු.

- පිළිගෙවුම් කාල ක්‍රමය ගණනය කරන ආකාරය

$$\text{පිළිගෙවුම් කාලය} = \frac{\text{මූලික ආයෝජනය}}{\text{වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය}}$$

වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය සමාන නොවන විට පිළිගෙවුම් කාලය ගණනය කිරීමට සමුච්චිත මුදල් ප්‍රවාහ තීරුවක් සහිත වගුවක් පිළියෙල කළ යුතු ය.
අනාගත මුදල් ප්‍රවාහය අසමාන වන නමුත් සමුච්චිත මුදල් ප්‍රවාහය නිශ්චිත වර්ෂයක දී ශූන්‍ය නොවන අවස්ථාවකදී නම් පහත උදාහරණය පරිදි ගණනය කරනු ලබයි.

- මූලික ආයෝජනය රු. 400,000ක් වන ආයෝජනයකට ශුද්ධ මුදල් ප්‍රවාහය පහත පරිදි වේ.

| වර්ෂය | ශුද්ධ මුදල් ප්‍රවාහය |
|---|---|
| 1 | 100,000 |
| 2 | 200,000 |
| 3 | 150,000 |
| 4 | 100,000 |

ගණනය කරන ආකාරය,

| වර්ෂය | ශුද්ධ මුදල් ප්‍රවාහය | සමුච්චිතය |
|---|---|---|
| 0 | (400,000) | (400,000) |
| 1 | 100,000 | (300,000) |
| 2 | 200,000 | (100,000) |
| 3 | 150,000 | 50,000 |
| 4 | 100,000 | 150,000 |

$$\text{පිළිගෙවුම් කාලය} = \frac{\text{අවුරුදු } 2 + \text{මූලික ආයෝජනය - අවුරුදු } 2 \text{ ක සමුච්චිත ආදායම}}{3 \text{ වන වසරෙ මුදල් ප්‍රවාහය}} \times 12$$

$$= 2 + \frac{100,000}{150,000} \times 12$$

= අවුරුදු 2 යි මාස 8 යි

**වාසි**

1. මුදල් ප්‍රවාහය සැලකිල්ලට ගැනීම
2. ක්‍රියාත්මක කිරීමේ පිරිවැය අඩුවීම
3. ගණනය කිරීම පහසු වීම

**අවාසි**

1. මුදලේ කාලය අගය සැලකිල්ලට නොගැනීම
2. පිළිගෙවුම් කාලයෙන් පසු මුදල් ප්‍රවාහයන් කෙරෙහි අවධානය යොමු නොකිරීම

02. ආයෝජන ප්‍රතිලාභ අනුපාතය

ආයෝජන ප්‍රතිලාභ අනුපාතය ලෙස අදහස් කරන්නේ බදු පසු වාර්ෂික ශුද්ධ ලාභය මූලික ආයෝජනයෙන් කවර ප්‍රතිශතයක් ද යන්න දැක්වීමයි. පිළිගෙවුම් කාල ක්‍රමයේ දී මෙන් නොව මෙම ක්‍රමයේ දී ආයෝජනය කරන ලද මුදල ගලා එන කාලය පමණක් නොව එමගින් උත්පාදනය කරන ලාභය පිළිබඳව ද අවධානයක් යොමු කරයි.

ආයෝජන ප්‍රතිලාභ අනුපාතය ගණනය කරන ආකාරය පහත දැක්වේ.

$$\text{ආයෝජන ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{බදු පසු සාමාන්‍ය ශුද්ධ ලාභය}}{\text{සාමාන්‍ය ආයෝජනය}}$$

$$\text{සාමාන්‍ය ආයෝජනය} = \frac{\text{මූලික ආයෝජනය + සුන්බුන් අගය}}{2}$$

$$\text{බදු පසු සාමාන්‍ය ශුද්ධ ලාභය} = \frac{\text{ඉපැයූ ලාභය}}{\text{වසර ගණන}}$$

**වට්ටම් කල ශිල්ප ක්‍රම**

01. ශුද්ධ වර්තමාන අගය

ව්‍යාපෘතියට අදාළව පැනනගින අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම සැලකිල්ලට ගෙන ව්‍යාපෘති ඇගයීම මෙහිදී සිදුවේ. ව්‍යාපෘති ඇගයීම සඳහා භාවිතා කළ හැකි දියුණුතම ශිල්පීය ක්‍රමය ලෙස මෙම ක්‍රමය සැලකිය හැකි ය. අනාගතයේ දී ලැබෙන මුදලකට වඩා වර්තමානයේ ලැබෙන මුදලේ අගය වැඩිවීම, මුදලේ කාල අගය යනුවෙන් හැඳින්වේ. මුදලේ කාල අගය මතය අනාගතයේ ලබන හෝ ගෙවන මුදලක වර්තමාන වටිනාකම ගණනය කරගත හැකි වේ. මුදලේ වර්තමාන අගය යනු අනාගතයේ දී උද්ගත වන මුදල් ප්‍රවාහයන්ගේ අද වටිනාකමයි.
මුදලක ශුද්ධ වර්තමාන අගය යනු යම්කිසි ව්‍යාපෘතියකට අදාළව අනාගතයේ දී ලැබෙන මුදල්වල වර්තමාන වටිනාකමත්, ගෙවන මුදල්වල වර්තමාන වටිනාකමත් අතර වෙනසයි

$$\text{ශුද්ධ වර්තමාන වටිනාකම} = \text{මුදල් ගලා ඒම්වල වර්තමාන වටිනාකම} - \text{මුදල් ගලා යාම්වල වර්තමාන වටිනාකම}$$

මුදලේ වර්තමාන අගය සෙවීම
මුදලේ වර්තමාන අගය සෙවීම සඳහා වට්ටම් අනුපාතයක් ගණනය කරනු ලැබේ.

ශුද්ධ වර්තමාන වටිනාකම ගණනය කරන ආකාරය පහත දැක්වේ.

$$NPV = \frac{FV}{(1+r)^{n}}$$

FV = ශුද්ධ මුදල් ප්‍රවාහය
r = වට්ටම් අනුපාතය
n = අදාල වර්ෂය

### වාසි

1. සියලුම මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගැනීම
2. මුදලේ කාලීන වට්ටම් අනුපාතය තෝරාගත හැකිවීම

### අවාසි

1. නිවැරදි වට්ටම් සාධකයක් තෝරා ගැනීමට අපහසුවීම
2. මුදල් ප්‍රවාහය ගණනය කිරීමට අසීරුවීම

ශුද්ධ වර්තමාන අගය තුලින් ආයෝජනය තීරණය කරනු ලබන ආකාරය

$NPV >$ (0 ධන අගයකි) → ආයෝජනය පිළිගනී

$NPV <$ (0 ඍණ අගයකි) → ආයෝජනය නොපිළිගනී



M.S.F. ෂාජිදා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# ව්‍යාපාර තොරතුරු පද්ධති

ඈත අතීතයේ සිට මිනිසා සන්නිවේදන තාක්ෂණ විකාශනයේ ආර්ථික හා සමාජ සංවර්ධන යුගයන් කිහිපයක් පසු කළේය. වර්තමානයේ අප ජීවත් වනුයේ තොරතුරු තාක්ෂණය ප්‍රබල වන දැනුම් ආර්ථිකය මත පදනම් වූ තොරතුරු යුගයේය. තොරතුරු හැසිරවීම වේගයෙන් සිදු වන නිසා තීරණ ගැනීම වේගවත් මෙන්ම නිවැරදිය. තවද නව දැනුම වේගයෙන් හුවමාරු කර ගනිමින් ව්‍යාපාර උපක්‍රම බිහි වී ඇත.

**දත්ත හා තොරතුරු**

භෞතික සිදුවීම් හෝ ව්‍යාපාර ගනුදෙනු පිළිබඳව විස්තර කෙරෙන මූලික කරුණු විවරණයන් දත්ත වේ. කියවීමෙන්, නිරීක්ෂණයෙන්, ගණනයෙන්, මානයන්ගෙන් දත්ත ලබා ගනී. දත්ත සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන අමු ද්‍රව්‍ය දත්ත වේ. දත්ත වශයෙන් පවතින විට වටිනාකමක් ගෙන නොදීම හා වලංගුතාවයෙන් අඩු වීම දත්ත වල විශේෂ ලක්ෂණයකි. දත්ත මූලික කරුණු හා සංඛ්‍යා තීරණ ගැනීමට සෘජුවම භාවිතා කළ නොහැක. ව්‍යාපාර ආයතනයක දත්ත රූපමය, වාචිකමය, අක්ෂරමය හා අංකමය ලෙස ස්වරූප කිහිපයකින් පවතියි. අභ්‍යන්තර මූලාශ්‍ර හා බාහිර මූලාශ්‍ර ලෙස ආයතනයකට දත්ත රැස් කර ගත හැකිය.

පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය භාවිතා කරමින් අතින් දත්ත සැකසීම හස්තමය දත්ත සැකසීම වේ. ප්‍රාථමික මට්ටමේ දත්ත සැකසුම් යන්ත්‍ර භාවිතා කොට අතින් දත්ත සැකසීම අර්ධ හස්තමය සැකසීම වේ. තරමක් දුරට ස්වංක්‍රියව දත්ත සැකසුම් යන්ත්‍ර භාවිතා කිරීම විද්‍යුත් යාන්ත්‍රික දත්ත සැකසීම වේ. ස්වයංක්‍රීයව පරිගණකය භාවිත කිරීම විද්‍යුත් දත්ත සැකසීම වේ. දත්ත සැකසීමේ තාක්ෂණය විකාශනය වූයේ එම අදියර පසුකරමිනි. හස්තමය දත්ත සැකසීමේදී වේගවත් බව, ධාරිතාව හා මූලික පිරිවැය අඩු නමුත් දත්ත සැකසීමේ පිරිවැය වැඩිය. වේගවත් බව, ධාරිතාව හා මූලික පිරිවැය වැඩි වන නමුත් දත්ත සැකසීමේ පිරිවැය අඩු වීම විද්‍යුත් දත්ත සැකසීමේ අදියරයේ සිදු වේ. සියලුම දත්ත තීරණ ගැනීමට අවශ්‍ය නොවන නිසාත් දත්ත සෑම විටම තේරුම් ගැනීමට අපහසු නිසාත් දත්ත තොරතුරු බවට පත් කිරීමට අවශ්‍ය වේ. දත්ත වලට වඩා තොරතුරු වලංගුතාවයෙන් වැඩිය. එබැවින් දත්ත තොරතුරු බවට පත් කිරීමේදී ඒවායේ දෝෂ ඉවත් කරනුයේ කළමණාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නේ දත්ත නොව තොරතුරු වන නිසාය.



යම් අවසන් පරිශීලකයෙකුට ප්‍රයෝජනයට හා තේරුම් ගත හැකි පරිදි සකස් කරන ලද දත්ත තොරතුරු වේ. එනම් මූලික කරුණු හෙවත් සංඛ්‍යා, ප්‍රයෝජනවත් හා අර්ථවත් කරුණු බවට පත්කළ විට තොරතුරු වේ. දත්ත සැකසුම් ක්‍රියාවලියට ප්‍රතිදානය කරන නිම් ද්‍රව්‍ය තොරතුරු වේ. දත්ත තේරුම් ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි පරිදි සකස් කළ විට වටිනාකමක් මෙන්ම වලංගුතාවයෙන්ද වැඩි වීම තොරතුරු වල ලක්ෂණයකි. දත්ත වර්ග කර තෝරා ගණනය කර සාරාංශ කිරීම මගින් තොරතුරු වූ පසු තීරණ ගැනීමට සෘජුවම භාවිතා කළ හැක.

තොරතුරු නිවැරදි වන තරමටම ඒවා පදනම් කරගෙන ගනු ලබන තීරණ ද නිවැරදි වේ. ඒ අනුව ප්‍රයෝජනයට ගත හැකි තොරතුරක තිබිය යුතු කිහිපයකි. පරිහරණය කරන්නාගේ අවශ්‍යතාවයට තොරතුරු අදාළ විය යුතුය. තොරතුරු සත්‍ය හා නිවැරදි වන තරමටම ගනු ලබන තීරණද නිවැරදි වේ. පරිශීලනය කරන්නාට පහසුවෙන් තේරුම් ගැනීමේ හැකියාව හා තොරතුරු ලබා ගන්නා ප්‍රභවය විශ්වාසවන්ත විය යුතුය. තොරතුරු කාලීන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි යාවත්කාලීන වීමෙන් තොරතුරු අවශ්‍යතාවයට වඩාත් උචිත වේ. කළමණාකරණ තීරණ නිවැරදිව නිවැරදි වේලාවක ගැනීමට තොරතුරු උපකාරී වන නිසාත් ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට තොරතුරු අවශ්‍ය වේ. ආයතනයේ දෛනික කාර්යයන් නිවැරදිව පහසුවෙන් ඉටු කර ගැනීමට හා සම්පත් ප්‍රශස්ත ලෙස ප්‍රයෝජනයට ගත හැකි වීමද ඉවහල් වේ. ආයතනයේ ඵලදායිතාවයේ ඉහළ නංවා තරගකාරී වාසි ලබා ගැනීමටද තොරතුරු ප්‍රයෝජනවත් වේ.

**තොරතුරු පද්ධතිය**

සංවිධානයක තීරණ ගැනීම සහ පාලනය සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවයක් සහිත උපාංග වල එකතුව තොරතුරු පද්ධතියයි. තොරතුරු පද්ධතිය තුළ සැකසීමේ කාර්යය සඳහා සංවිධාන තුළින් හෝ බැහැරින් අමු දත්ත ඇතුලත් කිරීම ආදානය වන අතර යතුරු පුවරුව, මයික්‍රොෆෝනය ආදාන උපකරණ වේ. භාවිතයට ගැනීමට සකස් කළ තොරතුරු පුද්ගලයන් හා කාර්යයන් අතර බෙදාහැරීම ප්‍රතිදානය වේ. මොනිටරය හා ප්‍රින්ටර් ප්‍රතිදානයට උදාහරණ වේ. ගබඩා කිරීම යනු දත්ත හා තොරතුරු අනාගතයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා රැස් කර තබා ගැනීම වේ. ගබඩා කළ හැකි උපකරණ ලෙස දෘඪ තැටි හා සංයුක්ත තැටි ගත හැකිය.



පරිගණක තොරතුරු පද්ධතියේ ප්‍රධාන උපාංග ලෙස දෘඩාංග, මෘදුකාංග, ජීවාංග, ආයතනිකාංග හා ක්‍රියාපටිපාටි ලෙස හැඳින්විය හැක. පරිගණක තොරතුරු පද්ධතියක ඇති සියළුම භෞතික කොටස් දෘඩාංග වන අතර මොනිටරය, CPU, යතුරු පුවරුව ඊට උදාහරණ වේ. පරිගණක ක්‍රියාකාරිත්වය හා පාලනය සඳහා ඇති විවිධ වැඩ සටහන් මෘදුකාංග වේ. දෘඩාංග භාවිතයට ගැනීමට මෘදුකාංග අවශ්‍ය වන අතර Word, Excel, Windows එයට උදාහරණ වේ. ජීවාංග ලෙස හඳුන්වනුයේ පරිගණක තොරතුරු පද්ධතියක් හා සම්බන්ධ වන පුද්ගලයින් හා පරිශීලකයන්ටය. පරිගණක ය හා යම් යම් කොටස් සම්බන්ධ කිරීම් සඳහා ඇති මෘදුකාංග නොවන කුඩා වැඩසටහන් ආයතනිකාංග වන අතර ක්‍රියාපටිපාටි ලෙස හඳුන්වනුයේ තොරතුරු පද්ධතියක කාර්යයන් සහ උපාංග පාලනය කිරීම සඳහා හැසිරවීම සඳහා ඇති විවිධ නීතිරීති වේ.

කළමණාකරණ මට්ටම අනුව මෙහෙයුම්, දැනුම, කළමණාකරණ, උපක්‍රමික ලෙස පරිගණක තොරතුරු පද්ධතිය වර්ග කරයි. සංවිධානයක පහළ පෙළ කළමණාකරුවන්ට එදිනෙදා කටයුතු පහසු කර ගැනීම සඳහා සහය වීමත් දෛනික කටයුතු පහසු කරගැනීමත් මෙහෙයුම් මට්ටමේ පද්ධති තුළින් සිදුවේ. දැනුම නිර්මාණය හා ගවේෂණය දැනුම් සේවකයන් සිදුකරන අතර දත්ත සේවකයන් දත්ත භාවිතය හා සන්නිවේදනය සිදු කරයි. දත්ත හා දැනුම් සේවකයන්ට ඔවුන්ගේ වැඩ කටයුතු පහසු කර ගැනීමට දැනුම් මට්ටමේ පද්ධතිය සහය වේ. කළමණාකරණ මට්ටමේ පද්ධතිය නම් සංවිධානයක මධ්‍ය පෙළ කළමණාකරුවන්ට තීරණ ගැනීම, නියාමනය හා පාලනය පහසු කර ගැනීමට සහය වන තොරතුරු පද්ධතිය වේ. ආයතනයක ජ්‍යේෂ්ඨ කළමණාකරුවන්ට තීරණ ගැනීමට සහය වන තොරතුරු පද්ධතිය උපක්‍රමික මට්ටමේ පද්ධතිය වේ.

ගණුදෙනු සැකසීමේ පද්ධතිය යනු සංවිධානයක එදිනෙදා සිදුවන ඒකාකාරී ගණුදෙනු ඉටු කිරීමටත්, ඒවා සටහන් කිරීමටත් භාවිතා කරන පරිගණකගත තොරතුරු වන අතර සුපරීක්ෂකවරු හා ලිපිකරු මෙම පද්ධතිය භාවිතා කරයි. ඉංජිනේරුවරු, වෛද්‍යවරු දැනුම් සේවකයන් නව දැනුම් නිර්මාණය කිරීමට ගවේෂණය කිරීමට හා පර්යේෂණ කටයුතු, නිෂ්පාදිත සැලසුම් කිරීමට සහය වන පද්ධතිය දැනුම් කාර්ය පද්ධතිය වේ. කාර්යාල සහයකයන් හා පරිගණක යන්ත්‍ර කරුවන් වන දත්ත සේවකයන් තොරතුරු තාක්ෂණය උපයෝගී කරගෙන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සහය වන්නේ කාර්යාල ස්වයංක්‍රීය පද්ධතිය වේ. කළමණාකරණ තොරතුරු පද්ධතිය යනු සංවිධානයක නිෂ්පාදන, මූල්‍ය, මානව කළමණාකරුවන්ට ආයතනයේ වර්තමාන කාර්ය සාධනය හා ඓතිහාසික වාර්තා සෘජුවම ළඟා වීමට සහය වන පද්ධතිය වේ. සංවිධානයක මධ්‍ය පෙළ කළමණාකරුවන්ට කල්තබා පහසුවෙන් නිශ්චය නොහැකි අර්ධ ව්‍යුහමය තීරණ ගැනීමට සහය වන්නේ තීරණ උපකාරක පද්ධතිය වේ. විධායක උපකාරක පද්ධතිය යනු සංවිධානයක ජ්‍යේෂ්ඨ කළමණාකරුවන්ට ව්‍යුහගත නොවන තීරණ ගැනීම සඳහා සහය වේ.



## තොරතුරු තාක්ෂණය

නූතනයේ කුඩා සිල්ලර කඩයේ සිට මහා පරිමාණ ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතයට නැඹුරු වී ඇත්තේ තොරතුරු තාක්ෂණයේ ඇති කාර්යක්ෂම නිසාය. පුද්ගලයන්ගේ මතය වී ඇත්තේ පරිගණකය ආශ්‍රිතව වැඩ කටයුතු කිරීම පමණක් තොරතුරු තාක්ෂණය ලෙසයි. නමුත් එම මතය නිවැරදි නොවේ. විදුලි සංදේශ හා පරිගණක තාක්ෂණය ඔස්සේ වාචිකමය, රූපමය, අංකමය  තොරතුරු අත්පත් කරගැනීම්, සැකසීම්, ගබඩා කිරීම් හා බෙදාහැරීම් තොරතුරු තාක්ෂණය ලෙස හැඳින් වේ. ඒ අනුව පරිගණක තාක්ෂණය, සන්නිවේදන තාක්ෂණය හා තොරතුරු කළමණාකරණ තාක්ෂණය යන ක්ෂේත්‍ර තුනේම එකතුව තොරතුරු තාක්ෂණය වේ.

සංවිධාන වල භාවිතා කරන විද්‍යුත් සන්නිවේදන භාවිතයන් අතර පරිගණක ජාල විශේෂ වේ. පරිගණක සම්බන්ධ කර ඇති ආකාරය අනුව බස් ජාල, මුදු ජාල, තාරකා ජාල හා ශාක ජාල අයත් වුවද ප්‍රාදේශීය කේෂ්ත්‍ර ජාල හා පුළුල් ක්ෂේත්‍ර ජාල භූගෝලීය ව්‍යප්තිය අනුව වර්ග කරයි. ලෝක ව්‍යාප්ත ජාලයක් ලෙස ප්‍රචලිත වනුයේ අන්තර්ජාලයයි. ගෝලීය වශයෙන් වෙළෙඳපොළ ආවරණය කර ගත හැකි වීම පිරිවැය අඩු වීම හා වේගවත් ජාලයක් වීමෙන් ව්‍යාපාර ව්‍යාප්තිය වැඩි කර ගත හැකිය. අන්තර්ජාලයෙන් සැපයෙන් සේවා රැසකි. අන්තර්ජාලයේ ප්‍රදර්ශනය වන වෙබ් අඩවි වල ඇතුලත් ගොනු පිටපත් කර ගැනීමට අවශ්‍ය පහසුකම් සපයන අන්තර්ජාල සේවාව ගොනු හුවමාරු නියාමාවලිය එහි ප්‍රධාන කෘතයකි. පරිගණක කථා පහසුව, ප්‍රවෘත්ති කණ්ඩායම්, ටෙලි පරිගණක සේවා, විද්‍යුත් තෑපෑල, සමාජ ජාල, විඩියෝ සම්මන්ත්‍රණ හා බහු මාධ්‍ය අන්තර්ජාලයෙන් සැපයෙන් සේවා වේ.



එල්. එච්. ඒ. ප්‍රතිභා ජයමිණි
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

CA

THE INSTITUTE OF
CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# විශිෂ්ටත්වයට ඇගයීමක්

**2021 අ.පො.ස. උසස් පෙළ අතිවිශිෂ්ට ලෙස ජය ගත් දූ දරුවන්ගේ අනාගතය බලගන්වන්නට CA Sri Lanka වෙතින් වසර 5 ක ශිෂ්‍යත්වයක්.**



| | | | | | |
|---|---|---|---|---|---|
| රුවන්‍යා කුලතුංග<br>8 වන ස්ථානය<br>සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය | දිමත් තිලකරත්න<br>7 වන ස්ථානය<br>රාජකීය විද්‍යාලය | යසංගී ශාක්‍යා<br>4 වන ස්ථානය<br>සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය | රශිනි දුල්‍යා ඩයස්<br>2 වන ස්ථානය<br>සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය | ඉමන්දී තනුද්‍රා<br>5 වන ස්ථානය<br>විශාඛා විද්‍යාලය | චමදිත් ගුණරත්න<br>6 වන ස්ථානය<br>ඩී.එස් සේනානායක විද්‍යාලය |

ඔබත් අද **CA Sri Lanka** සමග එක් වී ලොව පිළිගත් වෘත්තීය වරලත් ගණකාධිකාරීවරයෙක් ලෙස අනාගතය ජයගන්න.

අ.පො.ස උ/පෙළ සාමාන්‍ය සාමාර්ථ 3 කින් ලියාපදිංචි විය හැක.

වැඩි විස්තර සඳහා අමතන්න:
සුජීවා - 0710 235241, අරුණ - 0710 235248, අසේල - 070 4706339,
මිලාන් - 070 4706546, හංසි - 070 4706338

011 2352020 www.casrilanka.com

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය
30 A, මලලසේකර මාවත, කොළඹ 07

#WinLifeWithCA

IBSL
INSTITUTE OF BANKERS OF SRI LANKA
CREATING STARS

# ලොවම පිළිගත් වෘත්තීමය සහතිකයක් සමඟින් බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියාවකට මං පෙත් විවර කර ගැනීමට

# ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

## සමඟින් එකතු වන්න.




**අප ආයතනයේ විශේෂත්වය වන්නේ -**

- ☑ **1979 අංක 26 දරණ පාර්ලිමේන්තු පනත මගින් බැංකු හා මූල්‍ය කටයුතු පිළිබඳ අධ්‍යයනය සඳහා පිහිටුවා ඇති එකම ආයතනය වීම**
- ☑ ජාත්‍යන්තර පිළිගැනීම සහිත IABF සහ DABF පාඨමාලා
- ☑ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම විභාගය පැවැත්වීම
- ☑ අවම ගාස්තු අය කිරීම
- ☑ වර්ෂයකට දෙවතාවක් විභාග පැවැත්වෙන බැවින් අවම කාලසීමාවක් තුළදී පිළිගත් වෘත්තීයමය සුදුසුකමක් ලබාගත හැකිවීම
- ☑ බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියා සඳහා ප්‍රමුඛතාවයෙන් පිළිගැනීම

**අමතන්න**

**අරුණ - 0740 166 121 හෝ සසී - 0740 166 116**

# ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

1979 අංක 26 දරණ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (සංස්ථාපනය) පනත යටතේ පිහිටුවා, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී බැංකු, සම්මාන හා ආශ්‍රිත සාමාජිකයින් නියෝජනය වන පාලක මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබන ආයතනයකි.

**80A, ඇල්විටිගල මාවත, කොළඹ 08 | 0112425777 | www.ibsl.lk | facebook.com/ibsl.lk**




# Become a globally recognised finance professional with ACCA.

**ACCA + BSc (Hons) Degree in Applied Accounting within two and a half years.**

## Special offer for A/L students!

**Make use of this great opportunity and expand your career mobility.**
Call 0112424801 / 0773874247 or email info@lk.accaglobal.com for more details.

ACCA Sri Lanka, Block A, 18 Floor, 33, Parkland, Park street, Colombo 2.
www.accaglobal.com

# සංවිධායක කමිටුව - මූල්‍ය විමසුම



චමිදු ඉෂංක



සංදීප මාපලගම



මිකේල් මාටිස්



රමේශ් සදකැලුම්



එනුෂි කවිනයා



දිලක්ෂ දිසානායක



ප්‍රබෝධා රූපසිංහ



සජීවන් විජේරත්න



බිනුරි භාග්‍යා



මිහිරි එදිරිසිංහ



ප්‍රභාෂි හෙට්ටිආරච්චි



ජේ.එම්.එච් කෞෂල්‍යා



රොෂාන් රත්නායක



සමාධි වීරසිංහ



සකුණ තෙන්නකෝන්



අවන්ත රාජපක්ෂ



ඒ.ආර්.සි දිල්ශාන්



ඒ.පී.ටී.එස්.ඒ ගමාච්චි



උෂාරා කරුණාරත්න



ඉශාරි චතුරිකා



එම්.එච්.සී.ඩී. සන්තන



එල්.ඒ. විහඟ ලක්ෂාන්



යෂේන් දිල්මිත්



ඩබ්.ඒ.අයි.වයි.ඒ ජයවර්ධන



බී. චමෝද් දිලුමින්ද



රිෂිනි පිනාරා සමරජීව



මූල්‍ය අධ්‍යයන අංශයේ ප්‍රකාශනයකි.

https://www.facebook.com/FinanceStudentsAssociation/

https://youtube.com/c/DepartmentofFinanceUOK

https://www.linkedin.com/company/finance-students-association-